Volume 4 . Issue 1 . August 2024 . ISSN 1800-1602

# AJLIM

## *Advanced Journal of Library and Information Management*

*Department of Library and Information Science,*
*Faculty of Social Sciences,University of Kelaniya,*
*Sri Lanka.*
*2024*

# AJLIM

## Advanced  Journal of Library and Information Management

**Department of Library and Information Sciencce**

**Faculty of Social Sciences**

**University of Kelaniya**

**Sri Lanka**

**Volume IV: Issue I 2024** **ISSN 1800-1602** **ISSN (Online) 3051-5122**

**AJLIM**

**Advanced Journal of Library and information Managemnt,**

**Department of Library and information Science**

**University of Kelaniya**

**Sri Lanka**

*Volume IV* *Issue I* *2024*

## Editors-in-Chief

**Senior Prof. M.K. Weerasinghe**
*Cadre Chair and Senior Professor, Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka.*

**Senior Prof. W.A Weerasooriya**
*Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka*

# Editorial Advisory Board

**Dr. Wathmanel Seneviratne**

*General Sir John Kotelawala Defence University, Sri Lanka.*

**Dr. T. Pratheepan**
*Uva Wellassa University, Sri Lanka.*

**Prof. R. Blasubbramani**
*Department of Library and Information Science, Barathidasan University, India.*

**Prof. Eybert De Smet**
*University of Antiwarp, Belgium.*

## Layout Editor

**Mr. Shanaka Wanniarachchi**
*Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka.*

## Editorial Managers

**Mr. Shanaka Wanniarachchi**
*Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka.*

**Rev. Bopeththe Somananda**
*Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka.*

# AJLIM

## Department of Library and information Science

*Volume III* *Issue I* *2024*

**AJLIM: Advanced Journal of Library and Information Managemnt**

**© 2024 by Department of Library and Information Science, University of Kelaniya,**

**ISSN : 1800-1602**

**ISSN (Online) : 3051-5122**

**Coverpageand and Page Set up:** Shanaka Wanniarachchi

**Published by:** Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka.

**Disclaimer:**

Responsibilities for the content of papers included in this publication remain with the respective authors. Editorial Board of the **AJLIM** - Advanced Journal of Library and Information Managemnt, has no responsibility for the content or fault in the individual articles.

## Table of Contents

1. Dissaster managemnt in libraries: with reference to nationl museum library in Sri Lanka..........................................................................................................................1
   Amarasooriya Y.W.N.D1
2. A study of the specialties of language style used in palm leaf manuscripts in writing: based on Dalanda Pujavaliya palm leaf manuscript studies...................................14
   Kumarasinghe A.P Y.W.N.D
3. Sri Lankan indigenous medicine related to intangible cultural heritage ..........................................................................................................................28
   Menaka N.
4. Use of Piriven Libraries by the Pirivena Teachers for their Teaching Process ..........................................................................................................................47
   Somananda S.
5. 5Study on public library service in Sri Lanka referring to IFLA/UNESCO Public library Missions stated in the Manifesto 2022: based on Polonnaruwa Distric .....58
   Tharuka M.G.P
6. Human libraries representing the humans in place of books: an orverview on the human libraries as a new approach in the field of libraries....................................74
   Wijerathna M.G.H.K

**Volume IV: Issue I 2024 ISSN 1800-1602 ISSN (Online) 3051-5122**

# Dissaster managemnt in libraries: with reference to nationl museum library in Sri Lanka

**Amarasooriya Y.W.N.D**

nimasha.dilrangi@gmail.com

Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka

## *Abstract*

*libraries in collaboration with disaster management experts to prevent and respond to the destruction of intellectual resources by various causes. However, the interest of Sri Lankan libraries in disaster management is still not satisfactory. This study examined the disaster-vulnerability of the Sri Lanka Museum Library's collection, staff, building and other physical resources and the ongoing disaster management activities. The main objective of this study was to present a suitable disaster management plan for the Museum library and other objectives were to investigate the motivation of the top management of this institution regarding disaster management and to create awareness about disaster management among library professionals. Observation the Museum library, interviews and questionnaire method were used to collect primary data. The methodology of this study was case study. The proposed disaster management plans were gathered by studying the plans of libraries in other countries. Prevention, preparedness, response and recovery are the main components of a plan to avoid a disaster resulting from a hazard. These main factors were taken into consideration for the disaster management plan for the Sri Lanka Museum Library, which was the basis of the study, and in the evaluation of the hazard risk, special hazards for Sri Lanka, the geographical environment where the Museum library building is located, the climate condition, and civil society activities were considered. The study revealed that the current performance of this library is not satisfactory. As a solution, a new disaster management plan was presented. Risk assessment, damage prevention, emergency response planning, disaster preparedness and recovery functions are mentioned in this plan. It is suggested that the top management of the Museum library should consider these plans.*

**Keywords:** *Disaster Preparedness, Disaster Management plan, Disaster Management, Conservation, Library Buildings*

## හැඳින්වීම

සමාජය යහමඟට යොමු කිරීමට දායකත්වය ලබා දෙන ආයතන සෑම කාල වකවානුවකම පැවති අතර එබඳු ආයතන අතරින් පුස්තකාලවලට අතීතයේ සිටම ප්‍රමුඛත්වයක් හිමි වේ. එනමුත් මානව වර්ගයාගේ ආරම්භයේ සිටම කලින් කලට මෙම ආයතන වෙත විවධ ස්වරූපයේ ආපදාවන් එල්ල වූ අතර අතීතයේ වැඩි සිදුවීම් ප්‍රමාණයක් ස්වභාවික ආපදාවන්ගේ අහිතකර ප්‍රතිඵලයන් ලෙස හටගත් ඒවා වන අතර වර්තමානය වන විට ස්වභාවික සංසිද්ධීන්ගේ අහිතකර ප්‍රතිඵල අභිබවා මිනිසාගේ හැසිරීම තුළින් සහ තාක්ෂණික දියුණුවෙහි අතුරු ඵලයක් ලෙස ඇතිවන ආපදා සිදුවීම් ඉහළ අගයක් ගෙන ඇති බව කිව හැකි ය. කුමන හේතු මතහෝ ඇති වන සියලුම අයහපත් සිදුවීම් ආපදා ලෙස සැලකිය නොහැකිය. ආපදාවක් යනු ප්‍රතිචාර ධාරිතාව ඉක්මවන සිදුවීම් ය. ඒවා තනිව මිනිසාට පාලනය කර ගැනීමට නොහැකි අතර කලින් සැලසුම් සම්පාදනය කිරීමෙන් සහ සමූහයක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් කිසියම් සහනයක් අත්පත් කර ගැනීමට හැකියාව ලැබේ. අයහපත් සිදුවීම් ක්ෂණිකව කළමනාකරණය කරගත හැකි නම් ඒවා ආපදා තත්ත්වයක් දක්වා වර්ධනය නොවේ. එහෙත් සෑම විනාශකාරී සිදුවීමකටම මුහුණ දීමට හැකියාවක් හෝ ඊට ප්‍රතිචාර දැක්වීමට හැකියාවක් මිනිසාට ඇතැයි කිව නොහැකි ය. ආපදා යන්න තව දුරටත් පහත පරිදි නිර්වචන ඔස්සේ අර්ථකථනය කළ හැකි ය.

"උපද්‍රවවලින් ඇති වන බලපෑම මඟ හරවා ගැනීමට රටක පවත්නා සම්පත් සහ හැකියාවන් ප්‍රමාණවත් නොවීමෙන් එම උපද්‍රවයන් මිනිස් ජීවිත, දේපල සහ පරිසරයට ඉතාමත් දැඩි ලෙස හානි සිදු කිරීමත් ,රටේ සමාජ - ආර්ථික පද්ධතිය බරපතල ලෙස කඩා වැටීමත් ආපදාවක් හෙවත් ව්‍යසනයක් යනුවෙන් අර්ථවත් කෙරේ.' -එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන-

කිසියම් ස්වභාවික හෝ අස්වාභාවික සිදුවීමක් නිසා ඇති වන භෞතික බලපෑම් සමූහයක් මඟින් භූගෝලීය ප්‍රදේශයක් තුළ සැලකිල්ලට නොගෙන සිටිය නොහැකි තරමින් මිනිස් ජීවිත සහ ආර්ථික පදනම දැඩි ලෙස විනාශ වන්නා වූත්, ප්‍රාදේශීය සම්පත්වල හැකියාව ඉක්ම යන්නා වූත් සහ බලපෑමට ලක් වූ මහජනතාව විසින් අසාමාන්‍ය අයුරින් ප්‍රතිචාර දැක්විය යුතු අන්දමින් උද්ගත වන දැඩි හානිදායක තත්ත්වයක් ආපදාවක් ලෙස හැඳින්විය හැකි ය.

"මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් නැති වීම හෝ පුද්ගලයන්ට තුවාල සිදුවීම හෝ රටක විශාල වශයෙන් සමාජ - ආර්ථික වශයෙන් අලාභ හානි සිදු වන අවස්ථාවකි'' - ලෝක ආපදා පිළිබඳ වාර්ෂික වාර්තාව-

උපද්‍රව හටගැනීමට භෞතික සංසිද්ධීන් හෝ මානව ක්‍රියාකාරකම් හේතු වේ. එනම්, ජීවිත හානි, තුවාල සිදුවීම්, දේපල විනාශ වීම්, රටක සමාජ - ආර්ථික වශයෙන් ඇති වන අලාභ හානි මෙන්ම පාරිසරික හායනය, මෙන්ම වන විනාශය, පාංශු ඛාදනය, කාන්තාරීකරණය, ජල දූෂණය වැනි ස්වභාවික සංසිද්ධීන් ද හේතු සාදක වේ.

මෙම නිර්වචනවලට අනුව ආපදාවක් වූ කලී උපද්‍රවයකට වඩා අහිතකර බලපෑම් ඇති කරවන තත්ත්වයකි. ආපදාවක් යනු ප්‍රතිචාර ධාරිතාව ඉක්මවන සිදුවීම් ය. ඒවා තනිව මිනිසාට පාලනය කර ගැනීමට නොහැකි අතර කලින් සැලසුම් සම්පාදනය කිරීමෙන් සහ සමූහයක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් කිසියම් සහනයක් අත්පත් කර ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව කිසියම් උපද්‍රවයක් මඟින් ඇති වන ජීවිත හා දේපල හානි ඉතා ඉහළ තත්ත්වයක පවතී නම් ඒවා ආපදා ලෙස සැලකේ. සමාජය යහමඟට යොමු කිරීමට දායකත්වය ලබා දෙන ආයතන සෑම කාල වකවානුවකම පැවති අතර එබඳු ආයතන අතරින් පුස්තකාලවලට අතීතයේ සිටම ප්‍රමුඛත්වයක් හිමි වේ. එනමුත් මානව වර්ගයාගේ ආරම්භයේ සිටම කලින් කලට මෙම ආයතන වෙත විවිධ ස්වරූපයේ ආපදාවන් එල්ල වූ අතර අතීතයේ වැඩි සිදුවීම් ප්‍රමාණයක් ස්වභාවික ආපදාවන්ගේ අහිතකර ප්‍රතිඵලයන් ලෙස හටගත් ඒවා වන අතර වර්තමානය වන විට ස්වභාවික සංසිද්ධීන්ගේ අහිතකර ප්‍රතිඵල අභිභවා මිනිසාගේ හැසිරීම තුළින් සහ තාක්ෂණික දියුණුවෙහි අතුරු ඵලයක් ලෙස ඇතිවන ආපදා සිදුවීම් ඉහළ අගයක් ගෙන ඇති බව කිව හැකි ය.

**කෞතුකාගාර පුස්තකාලය**

විවධ විපත්ලට ගොදුරු වූ ආයතන අතර පුස්තකාලවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. පුස්තකාල ඉතිහාසය මානව ඉතිහාසයේ ආරම්භය තරම් අතීතයට ගමන් කළ ද මානව සන්තානයෙහි ලෝකය පුරා පැතිරුණු විධිමත් පුස්තකාල පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ඇති වූයේ 20 වන ශත වර්ෂයෙන් පසුව ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 21 වන ශත වර්ෂය වන විට සෑම රටක්ම පාහේ විවිධ වර්ගයේ පුස්තකාල නිර්මාණය කර බුද්ධිමය උරුමය මතු පරපුරට ලබා දීමේ වගකීම ඊට පවරා දී ඇති අයුරු දැක ගත හැකි ය. මේ ආකාරයෙන් ලෝකය පුරා සිදු වූ පුස්තකාල

ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ද පුස්තකාල ඉදි කිරීම ආරම්භ වූ අතර 1885 අංක 1 දරණ මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥා පනතින් ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලය ස්ථාපිත කෙරිණි. මෙය තැන්පතු පුස්තකාලයක් වන අතර රටේ ප්‍රමුඛතම විමර්ශන හා පර්යේෂණ පුස්තකාලයක් ලෙස ද කෞතුකාගාර පුස්තකාලය තම රටවැසියාට මෙන්ම ලෝකවාසීන්ට තොරතුරු සේවා සැපයීමට ඉදිරිපත්ව සිටී.

සාම්ප්‍රදායික පුස්තකාල සංකල්පයෙන් බැහැරට ගොස් ඉහත සඳහන් කල ජාතික වගකීම් ගණනාවක් ඉෂ්ඨ කරනු වස් කෞතුකාගාර පුස්තකාලය තුළ ජාතියේ අතීත ඥාන සම්භාරය ගැබ් වූ පුස්තකාල සම්පත් මෙන් ම නව දැනුම , තොරතුරු අඩංගු පුස්තකාල සම්පත් ප්‍රතිග්‍රහණය අඛණ්ඩව සිදු කරගෙන යනු ලබයි. සාර්ථක පාඨක සේවාවක් ඉටු කිරීම සඳහා කෞතුකාගාර පුස්කාලයක පරිපූර්ණ ජාතික එකතුන් සංවිධානය වී තිබිය යුතු ය. ලෝකයේ ඇතැම් රටවල කෞතුකාගාර පුස්තකාල සතුව මෙවැනි දැවැන්ත එකතුන් දක්නට ලැබේ. රාජකීය පුස්තකාලවල තැන්පත්ව තිබූ වටිනා ලේඛන ද මෙම පුස්තකාල තුළ සංවිධානය කර ඇත. ලෝකයේ වෙනත් රටවල කෞතුකාගාර පුස්තකාල හා සන්සන්දනය කර බැලීමේදී ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලයට එතරම් දිගු ඉතිහාසයක් නොතිබුණත් අද වන විට සැලකිය යුතු එකතුවක් සංවිධානය කර ගැනීමට මෙම පුස්තකාලයට හැකියාව ලැබී ඇති බව පෙනේ. ග්‍රන්ථ ලක්ෂ 14 කට අධික සංඛ්‍යාවක් ද ,පුවත්පත් ,වාර සඟරා , ශ්‍රව්‍ය දෘෂ්‍ය හා විද්‍යුත් මාධ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් ද එහි තැන්පත් කර ඇත.

**කෞතුකාගාර පුස්තකාලය හා ආපදා කළමනාකරණයේ ඇති අවශ්‍යතා**

ලෝකයේ රටවල් බොහොමයක කෞතුකාගාර පුස්තකාල වැනි ජාතික සංස්කෘතික උරුමයන් ඒකරාශී කර ඇති ආයතනවල ඒ ඒ ආයතනික අවශ්‍යතා, දේශගුණ හා කාලගුණ විෂමතා, භූමියේ ස්වභාවය, මූල්‍යමය ස්ථාවරත්වය අනුව නිර්මාණය වූ ආපදා කළමනාකරණ සැලසුම් දැකගත හැකි ය. එම සැලසුම් නව තත්ත්වයන්ට යෝග්‍ය වන පරිදි යාවත්කාලීන කොට පවත්වාගෙන යාමට ද ඔවුන් උනන්දුවක් දක්වයි. ස්වභාවික විපත් සුලභ රටවල ආපදා කළමනාකරණය ඔවුන්ගේ ප්‍රමුඛ විෂය ක්ෂේත්‍රයකි. ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජපානය වැනි රටවල ප්‍රධාන සංස්කෘතික සැලසුම් දක්නට ලැබෙන්නේ ආපදා තත්ත්වයන්ට නිතරම මුහුණ


දීමට ඔවුන්ට සිදු වන නිසා ය. එහෙත් ශ්‍රී ලංකාවේ තත්ත්වය මීට හාත්පසින්ම වෙනස් ය. ආපදා අවම රටක් ලෙස කාලයක් තිස්සේ ගොඩ නැගුන ආකල්පයක් සමාජගතව තිබීම ආපදා කළමනාකරණ විෂය ප්‍රචලිත නොවීමට බලපෑ ප්‍රධාන හේතුවකි. කුමන හේතු මත හෝ ඇතිවන විපත් ආපදා බවට පත් වන්නේ නිසි ආපදා කළමනාකරණ සැලසුමක් නොතිබීම නිසා ය. මෙම තත්ත්වය වටහා ගත් ලෝකයේ බොහෝ පුස්තකාල, ලේඛනාගාර ආපදා කළමනාකරණය සඳහා විධිමත් සැලසුම් සකස් කර ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යමින් විපත් අවම කර ගෙන තිබේ. නමුත් ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලයෙහි ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබීම අවධානයට යොමු විය යුතු කරුණකි. රට තුළ වරින් වර ඇති වන විවිධ ආපදා තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේදී රටේ විශාලතම පුස්තකාලය ලෙස ආපදා පිටු දැකීමට සැලසුමක් සම්පාදනය කර ගැනීම කාලීන අවශ්‍යතාවයකි.

### ආපදා කළමනාකරණය හා ඒ ආශ්‍රිත විධික්‍රම

මානව සමාජය ආරම්භයේ සිටම කලින් කලට මිනිසා මෙන්ම පුස්තකාල ද ආපදාවන්ට ගොදුරු වූ ඇත. මිනිසා තනිව වාසය අතහැර සමාජයක් නිර්මාණය කර ගැනීම තුළින් බලාපොරොත්තු වූ එක් ප්‍රධාන අරමුණක් වූයේ ද විවිධ උවදුරුවලට ගොදුරු වීමෙන් ආරක්ෂාවීම ය.(රත්නායක , 2008)තනි තනිව හෝ සමාජයක් ලෙසින් විනාශකාරී සිදුවීම්වලින් මිදීම සඳහාත්, විනාශය අඩු කර ගැනීම සඳහාත් මිනිසා උත්සාහ දරා තිබේ. එවන් උත්සාහයන් සාර්ථක වූ අවස්ථා මෙන්ම අසාර්ථක වූ අවස්ථාවන් ද ඉතිහාසය පුරා දක්නට ලැබේ. එවැනි අවස්ථාවල විවිධ සමාජ අනුගමනය කරනු ලැබූ සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රමවේදයන්හි වෙනස්කම් දැකිය හැකි වුවත් එමගින් ආපදා කළමනාකරණය කෙරෙහි දක්වා ඇති උනන්දුවෙහි තරම හඳුනා ගත හැකි ය.

මිනිසා ආපදා කළමනාකරණය කෙරෙහි මෙහෙයවන සංකල්ප අතර ජීවිත, දේපල හා පරිසරයට වන හානි අඩු කර ගැනීම හෝ වළක්වා ගැනීම ප්‍රමුඛ වන අතර එය සමස්ත ලෝකයටම පොදු තත්ත්වයක් ලෙස හඳුනා ගත හැකි ය. එහෙත් ඒ සඳහා ඇති හැකියාව සහ ධාරිතාව විවිධ හේතු මත තීරණය වේ. ඇතැම් සංවර්ධිත රටවල් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කරයි. එසේ වුව ද ලොව කිසිම රාජ්‍යයකට හෝ මිනිස් ප්‍රජාවකට ආපදාවකින් අත් වන අහිතකර ප්‍රතිඵලවලින්

මුළුමනින් ම අත් විඳීමට බලයක් හෝ ශක්තියක් තවම හිමිව නැත.(ධනපාල , 2012) ආපදා කළමනාකරණ ක්‍රියාවලිය චක්‍රයක් ලෙස ඉදිරිපත් කිරීමට ආපදා කළමනාකරුවන් උත්සාහ දරා ඇත.




*රූපසටහන 1 : ආපදා කළමනාකරණ චක්‍රය*

මෙම පියවර එකිනෙක හා මිශ්‍රව ආපදා කාල සීමාවට පෙර හෝ ආපදා කාල සීමාව තුළ හෝ ඉන් පසුව ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකි ය. ආපදා කළමනාකරණ චක්‍රය තුළ දැක්වෙන සංකල්ප පහත පරිදි අර්ථ නිරූපණය කළ හැකි ය.

### අවම කිරීම (වැළැක්වීම)

වැළැක්වීම යනු ස්වභාවික හෝ මිනිසා විසින් සිදු කරන ලද ආපදාවන්ට එරෙහිව ඇති හොඳම ආරක්ෂාවයි. මෙහිදී ස්වභාවික සංසිද්ධීන් වැළැක්විය නොහැකි නමුත් එමඟින් වන හානිය අවම කර ගත හැකි බව අවධාරණය කරයි. එසේම මිනිසා විසින් පුස්තකාලය වෙත සිදු කරනු ලබන ආපදාවන් මිනිසාට පුස්තකාලයෙහි වැදගත්කම පෙන්වා දීමෙන් වළක්වා ගත හැකි ය.

### සූදානම්වීම

ආපදා බලපෑමට ලක් විය හැකි ජනතාවගේ හෝ එවැනි බලපෑමකට ගොදුරු වූ ජනතාවගේ දේපල හා සම්පත් හානිය අඩු කිරීමට සහ ජීවිත රැක ගැනීමේ අවස්ථා වැඩි කර ගැනීමට උපකාරී වන වැඩපිළිවෙලක් හඳුන්වා දීම හෝ මෙවලම් මඟින්

ඔවුන් ශක්තිමත් කිරීම මෙයින් අදහස් කෙරේ. ඒ සඳහා කලාපීය සහයෝගීතාවය පදනම්ව තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම්ට කටයුතු කළ යුතු ය. අධ්‍යාපන සැසි, විශේෂයෙන් ආපදා සැලසුම් කිරීමේ වැඩමුළු සහ සූදානම්වීමේ අභ්‍යාසවලින් මේ සඳහා ප්‍රයෝජන ලබාගැනීමට ඔවුන් නිරන්තරයෙන් උත්සාහ කළ යුතු ය. මේ සඳහා ලිඛිත සැලැස්මක් පිළියෙල කොට සූදානම් වීම වැදගත් වේ. එසේම මෙම සැලැස්ම කාලීන වශයෙන් යාවත්කාලීන කළ හැකි විය යුතු අතර ඊට අමතරව ආපදා අවස්ථාවකදී අවශ්‍ය සැපයුම් හා උපකරණ යනාදිය නඩත්තු කළ යුතු ය.

**ප්‍රතිචාරය**

සිදු වූ හෝ සිදු වෙමින් පවත්නා ආපදාවක බලපෑම වැළැක්වීමට හෝ අඩු කිරීමට ගන්නා ක්‍රියාමාර්ග හෙවත් ප්‍රතික්‍රියා හා ප්‍රතිචාර මෙයට අයත් ය. ආපදා අවස්ථාවකදී හානිය ව්‍යාප්ත වීම පාලනය කළ යුතු අතර අනතුරුදායක ස්ථානවලින් පුද්ගලයින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. එමගින් තව දුරටත් පීඩා විඳීම හා ආර්ථික හානිය යන දෙකම වළක්වා ගත හැකි ය. ජාතික ආපදා කළමනාකරණයේදී භාවිත කරන පොදු ක්‍රියාමාර්ගයක් වන සහන සේවා සැපයීම එවැනි ප්‍රතිචාර අතුරින් එකකි. එසේම ප්‍රතිචාර කණ්ඩායමේ නායකයා දැනුවත් කර පුහුණු කළ ගැලවුම්කරුවන් යොමු කිරීම හා දැනුවත් කිරීම සිදුකළ යුතු බවත්, පුස්තකාලයට ජලයෙන් හානි වූ අවස්ථාවකදී ක්ෂණිකව ඒවා වියළි ස්ථාන කරා යොමු කළ යුතු ය.

**ප්‍රතිසංවේදනය**

මෙයින් අදහස් වනුයේ ආපදාවක බලපෑමෙන් පීඩාවට පත් ජනතාව නැවත යථා තත්ත්වයට පත් කිරීම හෙවත් ආපදාවට පෙර පැවති තත්ත්වයට පත් කිරීම ය. මෙම අධියර සාමාන්‍යයෙන් ආරම්භ වනුයේ ක්ෂණික ප්‍රතික්‍රියා හෙවත් ප්‍රතිචාර අවසන් වූ පසුව ය. එසේ යථා තත්ත්වයට පත්කළ නොහැකිම දෑ ඉවත් කිරීම්ට සිදුවේ. ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ප්‍රමුඛතා තීරණය කිරීම සහ හොඳම විකල්පය පිළිබඳව සංරක්ෂකවරයෙකුගේ උපදෙස් ලබා ගැනීම සහ පිරිවැය ඇස්තමේන්තු ලබා ගැනීම සිදු සිදුකළ යුතු අතර අපදාව සිදුවූ ස්ථානය පිරිසිදු කර පුනරුත්ථාපනය කිරීම සහ අලුත්වැඩියා කරන ලද ස්ථාන සුදුසු පරිදි ද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කිරීම කළ යුතු ය.

## ආපදා කළමනාකරණයෙහිලා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවල කාර්යයභාර්යය

'සේවා මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සමාජය වෙනුවෙන් ඉටු කරන සාම්ප්‍රදායික භූමිකාවන්ට අමතරව, සමාජයේ වර්ධනය හා සංවර්ධනය සඳහා අවශ්‍ය වන සියලු වැදගත් කරුණු පිළිබඳ තොරතුරු සැපයීමේදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම හැරුණු විට මෙම මධ්‍යස්ථානවලට ඕනෑම ආපදාවකදී වඩා විශාල කාර්යභාරයක් ඉටු කළ හැකිය.'

**-මැතිව්ස් සහ ඊඩ්න්,1996-**

ආපදාවක් හෝ හදිසි අවස්ථාවක් කළමනාකරණය කිරීමේදී පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවලට විශාල වැදගත්කමක් ඇත. පුස්තකාල වෘත්තිකයින්ට ඔවුන්ගේ පුස්තකාලයට එදිනෙදා එල්ල විය හැකි ආපදාවන්හි භූමිකාවන් ගවේෂණය කිරීමට සිදුවේ. ආපදා කළමනාකරණය පිළිබඳ සංකල්පය මිනිසා විසින් සිදු කරන ලද සහ ස්වාභාවික විපත් ලෙස දෙකොටසකට වෙන් කළ හැකි ය.සිදුවිය හැකි ආපදාවන් හෝ හදිසි අවස්ථාවලදී ඇතිවන ආපදාවන්හි බලපෑම අවම කිරීම පිළිඳව ජනතාව දැනුවත් කිරීම සඳහා යුනෙස්කෝව විසින් ගෙන ඇති පියවරයන් මෙහිදී වැදගත් ය. ආපදා අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සහ ආපදා පිළිබඳව සමාජය දැනුවත් කිරීම පිළිබඳ පුස්තකාලයාධිපතිගේ දෘෂ්ඨි කෝණය ද මෙහිලා ඉතා වැදගත් ය.

ආපදා කළමනාකරණ සැලැස්ම පුස්තකාලයක් හා තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීමේ මූලික සැලසුම් සකස් කිරීමේදී පටන් සැලකිල්ලට ගත යුතු ය. විස්තීර්ණ ආපදා කළමනාකරණ සැලැස්මක් සඳහා කුඩා කරුණු කිහිපයක් ඇතුළත් කළ යුතු අතරම ඒවා එකිනෙකක් ස්වාධීන නමුත් එකිනෙකට සම්බන්ධ වී ඇති බැවින් සමස්ත සැලැස්ම කොටස් කර සකස් කිරීම වැදගත් ය.

ව්‍යසනය හා එහි පාලන යාන්ත්‍රණය සාමාන්‍යයෙන් අදියර තුනක් හරහා ගමන් කරයි. එනම් , ආපදාවට පෙර, ආපදා කාලයේදී හා ආපදාවට පසුව යන්නයි. මෙම අදියර තුනම ආපදාවක බලපෑම අවම කර ගැනීමට සහ හදිසි අවස්ථාවන්ගෙන් මිදීම වෙනුවෙන් සැලසුම් කර ඇත. සෑම ආපදා සැලැස්මක්ම කාර්ය මණ්ඩලය, පාඨකයින්, තොරතුරු ප්‍රභවයන්, උපකරණ සහ යටිතල පහසුකම් ඇතුළුව පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය ආවරණය කළ යුතු අතර එය කණ්ඩායම් උත්සාහයක් විය යුතු ය.

**අධ්‍යයන අරමුණු**

**ප්‍රධාන අරමුණ**

- ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර පුස්තකාලයට එල්ල විය හැකි ආපදාවන්ට සාර්ථකව මුහුණ දීම සඳහා සුදුසු ආපදා කළමනාකරණ සැලැසුම් යෝජනාවලියක් ඉදිරිපත් කිරීම.

**සෙසු අරමුණු**

- ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර පුස්තකාලයට එල්ල විය හැකි විපත් හඳුනා ගැනීම සහ ඒවාට මුහුණ දීම සඳහා අනුගමනය කරන පියවර විමසා බැලීම.
- පුස්තකාලයාධිපති ඇතළු කාර්යය මණ්ඩලය විසින් ආපදා කළමනාකරණ සැලසුමක් සම්පාදනය සඳහා උනන්දු නොවීමට හේතු විමසා බැලීම.
- ආපදා කළමණාකරණ සැලැස්මක් නිර්මාණය කිරීමේදී සහයෝගීතාවය ලබා ගත හැකි ආයතන හඳුනා ගැනීම.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාව සතු විශාලතම එකතුව සහිත පුස්තකාලය ලෙස සැලකෙන ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලය ඇසුරින් කරන ලද සිද්ධි අධ්‍යයනයක් මත පදනම් වේ. පුස්තකාලයට ගොස් නිරීක්ෂණය කරමින් සංරක්ෂණ හා නඩත්තු වැනි අංශවල නිලධාරීන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් ගුණාත්මක දත්ත රැස් කරන ලදී. එය ප්‍රාථමික දත්ත ගණයට අයත් වන අතර ද්විතියික දත්ත වශයෙන් වෙබ් අඩවි , වාර සඟරා , උපාධි නිබන්ධන හා පොත් මඟින් දත්ත තොරතුරු රැස් කර ගන්නා ලදී.

**අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව**

ජාතියේ ඥාන කෝෂ්ඨාගාර යන විරුධාවලිය ලත් ජාතික කෞතුකාගාර පුස්තකාල සෑම රටකම පවතින අතර එය මුළු රටේම අතීත මතකයන් මතු පරපුර වෙනුවෙන් තැන්පත් කර තබන ස්ථානයකි. සෑම රටකම පාහේ එවන් කෞතුකාගාර ආශ්‍රිතව පුස්තකාලයක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා කෞතුකාගාරය

ඇසුරින් ද එම තත්ත්වය දැකිය හැකි ය. මෙහිදී ලොව බොහෝ රටවල් පුස්තකාලයන්හි ඇති විය හැකි ආපදාවන් කළමනාකරණය කරනු පිණිස ආපදා කළමයාකරණ සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කරන නමුත් ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලය සම්බන්ධයෙන් එවැන්නක් දැකිය නොහැකි ය. පුස්තකාලයේ ආරක්ෂාව හා සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබුව ද නිර්ණායක මත පදනම්ව පුස්තකාලය සඳහා වෙනමම සකස් කරන ලද ආපදා කළමනාකරණ සැලසුමකට අනුව එහි කටයුතු කරන බවක් දක්නට නොහැකි ය.

ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලය සඳහා ගංවතුර, නායයාම්, භූමිකම්පා යනාදී වූ ස්වභාවික ආපදාවන් ඇති වීමේ අවදානමක් පවත්නා බව හඳුනා ගත හැකි වූ නමුත් ඒවාට ශක්තිමත්ව මුහුණ දීම සඳහා විධිමත් ආපදා කළමනාකරණ සැලැස්මක් ද සකස් කර ඇති බවක් දක්නට නොලැබේ. මව් ආයතනය විසින් සමස්ත ආයතයේ ආරක්ෂාව වෙනුවෙන් ගෙන ඇති පොදු ආරක්ෂණමය කටයුතු ම පුස්තකාලය සඳහාත් භාවිත කරන බවක් දක්නට ලැබේ.

ආයතනයට අදාලව පොදු ගිනි ආරක්ෂක පද්ධතියක් තිබුණ ද කෞතුකාගාර පුස්තකාලය තුළ ඒ සඳහාම වෙන්වූ ගිනි ආරක්ෂණ පද්ධතියක් නොමැත. ආරක්ෂාව වෙනුවෙන් ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ් ,නයිට්‍රජන් යන ගිනි නිවන වායූන් අඩංගු උපකරණ ආයතනය තුළ සවි කර තිබුණ ද ඒවා නිසි අධීක්ෂණයෙන් හා මනා ක්‍රියාකාරීත්වයෙන් තොර බවත්, පුස්තකාලයාධිපති ඇතුළු කාර්යය මණ්ඩලයට හදිසි අවස්ථාවකදී මෙම උපකරණ භාවිතය පිළිබඳ නිසි අවබෝධයක් හෝ දැනුමක් නොමැති බවත් අනාවරණය විය.

කෞතුකාගාර ආයතනය සතුව ඇති අකුණු සන්නායක පද්ධතිය සම්බන්ධයෙන්ගත් කළ එහි එක් කොටසක් පුස්තකාලය සමීපයේ ද ස්ථාපිත කර ඇත. එමඟින් අකුණු අනතුරු අවදානම අවම මට්ටමක පවතින අතර විදුලිය හා සම්බන්ධ ගැටලු ඇති වූ විට ආයතනයේ විදුලි කාර්මිකයන් ලවා ඒවා පිළි සකර කරනු ලබයි. පුස්තකාලය තුළ ගින්නක් ඇති වුවහොත් ක්ෂණිකව එහි සිටින්නන්ට පිටවීම සඳහා සංඥා යොදා ඇතිමුත් පුස්තකාලය තුළ ඒ හා සම්බන්ධව අවශ්‍ය දැනුවත් කිරීම් හා පුහුණුව ලබා දීමක් සිදු නොවන බව අනාවරණය විය.

පුස්තකාල සම්පත් වෙත පාඨකයන්ගෙන් විය හැකි හානි වළක්වා ගැනීම සම්බන්ධයෙන් සලකා බලන විට පුස්තකාලය තුළ පවත්නා ආවෘත රාක්ක ක්‍රමය නිසා තරමක් දුරට පොත්පත් සොරකම් කිරීම අවම මට්ටමක පවතී. පුස්තකාල දෙපාර්තමේන්තුවේ නිරන්තර අධීක්ෂණය නිසා කෘමි සතුන්ගෙන් පුස්තකාල පොත්පත්වලට වන හානි අවම මට්ටමක පවතින අතර ධූමායන කුටිය හරහා ද පුස්තකාල සම්පත්වලට ආරක්ෂාව ලබා දීමට කටයුතු කරමින් සිටී .

කෞතුකාගාර පුස්තකාලයේ ආපදා කළමනාකරණයෙහිලා ලිඛිත සැලැස්මකට අනුව කටයුතු සිදු නොවීම කෙරෙහි පිරිස් හා උපකරණ නඩත්තු කටයුතු ප්‍රමාණවත් නොවීම, ගොඩනැගිලි ප්‍රමාණවත් නොවීම සහ ප්‍රමාණවත් නොවන අරමුදල් ඇතුළු අතුරු ආබාධ ගණනාවක් මීට හේතු වී ඇත. එසේම විදේශීය රටවල මේ සියල්ල සඳහා නිරන්තරයෙන් ආපදා කළමනාකරණය හා සම්බන්ධ ආයතනවල සහාය ඇතිව ප්‍රායෝගික හා විධිමත් පුහුණු සැසි පවත්වනු ලැබුවත් ශ්‍රී ලංකාව තුළ එවැන්නක් සිදු නොවේ. ලොව සෙසු රටවල කෞතුකාගාර පුස්තකාලයන්හි ආපදා කළමනාකරණ සැලසුම් හා සන්සන්දනය කර බලන විට ආපදා කළමනාකරණය සඳහා ආපදා අවදානම අවම කිරීමට ප්‍රායෝගික පියවර ගත යුතු බවත් , ඉක්මන් ප්‍රතිචාරයක් සඳහා සූදානම් විය යුතු බවත් පැහැදිලි වේ.

## නිගමන

ශ්‍රී ලංකා කෞතුකාගාර පුස්තකාලයේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් විමසා බලන විට ඒ තුළ පුස්තකාලය ඇතුළු එහි සම්පත්වල ආරක්ෂාව හා පැවැත්ම වෙනුවෙන් යම් යම් ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබුව ද ජාතික එකතුවක් තැන්පත්ව ඇති මධ්‍යස්ථානයක් වශයෙන් එම ක්‍රියාමාර්ග කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවත් විධිමත් ආපදා කළමනාකරණ සැලසුමකට අනුව පුස්තකාලය ක්‍රියාත්මක නොවන බවත් හෙළි විය. මෑත කාලීනව ස්වභාවික ආපදාවන්ට ලක් වූවක් අනාවරණය නොවූව ද මෙම පුස්තකාලබේ පිහිටීම අනුව සලකා බලන විට ස්වභාවික ආපදා අතර අකුණු, ගංවතුර, කුණාටු, භූමිකම්පා යනාදියටත් මානව ක්‍රියාකාරකම් නිසා සිදු වන ආපදා ලෙස මහජන අනර්ථකාරී ක්‍රියා සහ ත්‍රස්තවාදී ක්‍රියා යනාදියටත් ගොදුරු වීමේ අවදානමක් පවතින බව අනාවරණය විය. එසේම මෙහි පවත්නා එකතුව ඉතා සීඝ්‍රයෙන් විනාශයට පත් වෙමින් පවතින බවත්, මව් ආයතනයෙන් ලැබෙන සහාය ප්‍රමාණවත් නොවන බවත්,

පුස්තකාලය හා සම්බන්ධ තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් බලතල පුස්තකාලයාධිපතිවරයාට පවරා නොමැති බවත්, පුස්තකාල කාර්යය මණ්ඩලය සතුව ආපදා කළමනාකරණ විෂය පිළිබඳ අඩු අවබෝධයක් බවතින බවත්, පුස්තකාලයේ ආරක්ෂාව වෙනුවෙන් වෙනත් ආයතන සමඟ සහයෝගීතා වැඩසටහන් පැවැත්වීමක් සිදු නොවන බවත්, කෞතුකාගාර පුස්තකාලය හා සම්බන්ධ දැඩි මූල්‍යමය ගැටලු පවතින බවත්, රජයේ කිසිඳු වගකිව යුතු අංශයන්හි සහයෝගයක් කෞතුකාගාර පු ස්තකාලය කෙරෙහි නොලැබෙන බවත්, පුස්තකාල සම්පත්වලට සාපේක්ෂව පවත්නා ඉඩකඩ සීමිත බවත් නිගමනය කළ හැකි ය.

## නිර්දේශ

ජාතික වශයෙන් වැදගත් වටිනා හා දුර්ලභ එකතුවක් සහිත පුස්තකාලයක් වශයෙන් මෙහි පොත්, පුවත්පත්, චිත්‍ර, ඡායාරූප, මුද්දර, තැපැල්පත්, පුස්කොළපොත්, බ්‍රේල් එකතුව යනාදිය ඒකරාශීව පවතින බව දැකිය හැකි ය. ඉතා සීඝ්‍රයෙන් මෙම එකතුන් විනාශයට පත් බවමින් පවතින නමුත් ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා ලිඛිත ආපදා කළමනාකරණ සැලසුමක් සම්පාදනය කොට ක්‍රියාත්මක කළ යුතු ය. ඊට අමතරව විශේෂඥ උපදෙස් අනුව ඵලදායී සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම, සංරක්ෂණ කටයුතු මෙහෙයවීම සඳහා වගකීම් ලත් කමිටුවක් පත් කිරීම,විදේශ ආයතන සමඟ සහයෝගීතා වැඩසටහන් පැවැත්වීම, මුද්‍රිත මාධ්‍යයෙන් ඇති දුර්ලභ තොරතුරු සංඛ්‍යාංකකරණයට ලක් කිරීම, කෞතුකාගාර පුස්තකාලය හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය අතර සම්බන්ධතා වර්ධනය කිරීම, කෞතුකාගාර පුස්තකාලය සතු පොත් එකතුව ජාතික පුස්තකාලයට පැවරීම, කෞතුකාගාර පුස්තකාලය හා සම්බන්ධව නීතිමය ලියවිල්ලක් පවත්වා ගැනීම, පුස්තකාලය සඳහා ප්‍රමාණවත් හා සුදුසුකම් ලත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීම, කාර්යය මණ්ඩල අභිප්‍රේරණය,ආරක්ෂක සේවාව දියුණු කිරීම,ගොඩනැගිලි නඩත්තු කිරීමේ උපදෙස් මාලාවක් සකස් කිරීම යනාදී නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

## විමර්ශන

American Institute for Conservation of Historic and Artistic Works. AIC seminars, workshops, study tours (2016) (Available at: http://aic.stanford.edu/education/workshops/) [Accessed : 26th Oct.2020]

Ayoung, A.D, Boatbil, C.S. and Banbil S. (2014), How secure are library collections? An evaluation of polytechnic libraries in Ghana. Information and Knowledge Management 4(3): 56–66.

Cassar, May (2015), Climate change and the historic environment, Centre for Sustainable Heritage, University College London. (Available at: http://eprints.ucl.ac.uk/archive/00002082/) [Accessed: 2nd Nov.2020]

Chisamba, Thula (2015), Mzuni students brand Mzuzu city firefighters “stupid”. Retrieved January 5, 2016, from http://malawi24.com/2015/12/19/mzuni-students-brands-mzuzu-city- firefighters-stupid/ (Accessed October 28, 2020).

Coppola, D.P. (2011), Introduction to international disaster management. Second edition, Elsevier, USA.

Department of National Museum (2010), Sinhala inscriptions in Colombo National Museum, Department of National Museum in Sri Lanka, Colombo.

Teijgeler, René (2010), Preserving cultural heritage in times of conflict, in: Gorman, G E and Shep, Sydney J (eds.) Preservation management for libraries, archives and museums, Facet Publishing, London. pp.133-165.

Workshop on disaster information management. News. International Preservation News 39, October 2013, p.36 (Available at: http://www.ifla.org/VI/4/news/ipnn39.pdf) [Accessed: 29th Oct.2019]

කබ්රාල්, උදය (2009), ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග ජාතික පුස්තකාල සතිය , සමරු කලාපය,ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ. පි.. 147-156.

ධනපාල, ඒ.එච්. (2012), පරිසර අධ්‍යයනය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

# A study of the specialties of language style used in palm leaf manuscripts in writing: based on Dalanda Pujavaliya palm leaf manuscript studies

**Kumarasinghe A.P Y.W.N.D**

Librarian, City School of Architecture, Sri Lanka

## *Abstarct*

*This research was carried out with the main objective of studying and recording the peculiarities and language characteristics of the Palm leaf manuscripts called Dalada Pujavaliya, and the method of participation and observation was used for this study. Four Palm leaf manuscript copies available in the Kelaniya University's Palm leaf manuscript Study and Research Library were used for that purpose. At the end of the research, the language features, special features, grammar rules in the Palm leaf manuscript copies, how the language of these Palm leaf manuscript differs from the language of other Palm leaf manuscript and their similarities were also identified.*

***Keywords :*** *Palm Leaf, Alada Pujavaliya, Grammar Rules, Language Characteristics, Manuscript Studies.*

## හැඳින්වීම

අතීතයේ ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල ලේඛන ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කරනු ලැබූ ප්‍රධාන මාධ්‍යයක් වන්නේ පුස්කොළ ලේඛන කලාවයි. අප රටේ බහුලව වැඩෙන තල් ශාකයේ ගොබය ලේඛනකරණය ට සුදුසු ලෙස සකස් කර භාවිතයට ගැනීම ලේඛන ක්ෂේත්‍රයේ සංධිස්ථානයක් වශයෙන් හැඳින්විය හැකි අතර ඇතැම් බුද්ධිමතුන් පෙන්වා දෙන ආකාරයට මෙරට පුස්කොළ ලේඛන ඉතිහාසය ක්‍රිස්තු පූර්ව යුගයේ පමණ ආරම්භ වන්නට ඇති බවයි. පුස්කොළ ලේඛන සම්ප්‍රධාය විවිධ කලාපයන්ගේ පරිසර තත්ත්වයන් අනුව වෙනස් වන අතර ඒ අනුව දැනුම, සංස්කෘතිය, පරිසරය යන මේවා ජාලයක් ආකාරයට එකාබද්ධව ක්‍රියාත්මක වීම මෙන් ම අප රටෙහි පැවති විවිධත්වය තුළ දැනුම ඒකරාශී කර ගැනීම, බෙදාහැරීම වැනි කාර්යයන් සඳහා පුස්කොළ ග්‍රන්ථකරණය සෘජුවම බලපානු ලැබ තිබේ. ශ්‍රී ලංකාවේ විහාරස්ථාන හා පුද්ගල සන්තකයේ පවතින විවිධ පුස්කොළ ලේඛනයන් විවිධ භාෂා ශෛලීන්ගෙන් සමන්විත වන අතර මේවා අයත් වන විෂයය කාණ්ඩයන් අනුව ද වර්ග කළ හැක. එනම් මෙම පුස්කොළ පොත් වල අන්තර්ගත කරුණු ඔස්සේ වර්ග කිරීමේ දී ආගමික, සාහිත්‍ය, වෛද්‍ය විද්‍යාත්මක, ජ්‍යෝතිෂ්‍ය, යන්ත්‍ර මන්ත්‍ර, සමාජීය හා සංස්කෘතික මෙන් ම වෙනත් විවිධ විෂයය ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබන පුස්කොළ පොත් ද අපට හමුවේ.

විශේෂයෙන් ම මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ පුස්කොළ පොත් කෙරෙහි අවධානය යොමු කිරීමේ දී මෙම ලේඛන ලිවීම සඳහා භාවිත කරනු ලැබ ඇති අක්ෂර ශෛලීන් කිහිපයක් ම හඳුනාගත හැක. එනම්, හංස අක්ෂර, සිංහ අක්ෂර, කාක අක්ෂර, ගජ අක්ෂර වැනි අක්ෂර ශෛලීන් ය. තව දුරටත් මෙම පුස්කොළ පොත් වල පවතින සුවිශේෂතා අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි වූයේ මේවා අතුරින් ආගමික කාණ්ඩයට අයත් පොත් බහුතරයක් බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් රචනා කර තිබීමයි. මෙවැනි පසුබිමක් සහිත පුස්කොළ ලේඛන කලාවේ එක් පැතිකඩක් ඔස්සේ සිදුකරනු ලැබූ අධ්‍යයනයක් මගින් මෙම ලිපිය රචනා කිරීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පුස්කොළ ලේඛනකරණයේ දී යොදා ගනු ලැබූ භාෂාවෙහි විශේෂත්වය අධ්‍යයනය කොට වාර්තා කර තැබීමයි. නූතනයේ භාවිත වන දියුණු හා තාක්ෂණික ලේඛන සම්ප්‍රදායන් ගේ බලපෑමෙන් පුස්කොළ ලේඛන සම්ප්‍රධාය ක්‍රමයෙන් අභාවයට යමින් පවතින අතර මෙවැනි අධ්‍යයනයන් තුළින් උරුම කළමනාකරුවන්, පුරාවිද්‍යා හා ඉතිසායය විෂයය ක්ෂේත්‍රය හදාරන පර්යේෂකයින්

සඳහා මග පෙන්වීමක් ද සිදු වේ. එමෙන් ම වෙනත් අරමුණු ඔස්සේ පුස්කොළ පොත් හා පුස්කොළ ලේඛනකරණය ආශ්‍රිත ශාස්ත්‍රීය පර්යේෂකයන් ගේ පර්යේෂණ කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා පිටිවහලක් සැපයීම ද මෙම ලිපියේ ප්‍රධාන පරමාර්ථයකි. මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූයේ ආගමික පුස්කොළ පොත් යන කාණ්ඩය වන අතර ඒ අනුව දළඳා පූජාවලිය පුස්කොළ පොත් කිහිපයක් ආශ්‍රිතව බෞද්ධ ආගමික මුහුණුවරක් සහිත භාෂා ශෛලියේ සුවිශේෂී ලක්ෂණ විමර්ශනය කරනු ලැබේ. එනම්,

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මස්කන්ධයෙහි ස්පර්ශය ලැබූ වාමදාඨා ධාතූන් වහන්සේ පිළිබඳ වංශකථාව දළදා පූජාවලිය යි. කුරුණෑගල රජ පැමිණි iv වන පැරකුම්බා රජුගේ රාජ්‍ය සමයේ දී මෙම ග්‍රන්ථය රචනා කර ඇති බව ඇතැමුන්ගේ මතය යි. මෙහි කතෘ අඥාත වන අතර සම්බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ අටකටත් වැඩි කාලයක් දඹදිව රජවරුන්ගේ ගෞරවයට පාත්‍ර වූ දළදා වහන්සේ බුද්ධ වර්ෂයෙන් අට වැනි සියවසේ එනම්, " **කිත්සිරි මෙවන්** " රාජ්‍ය සමයේ ලක්දිව ට වැඩම කරවීමත් එතැන් සිට කුරුණෑගල රාජ්‍ය සමය තෙක් පැවති දළදා පූජාත් මෙම ග්‍රන්ථයේ සඳහන් ය. මෙහි අඩංගු තොරතුරු කොටස් කිහිපයකට බෙදා දැක්විය හැක. එනම්, විවරණ කථා, සිද්ධාර්ථ චරිතය හා බුද්ධත්වය, බුදුන් වහන්සේගේ ලංකාගමනයන්, පරිනිර්වාණය, දළඳා වහන්සේ පිළිබඳ ව දඹදිව තොරතුරු, දළඳා වහන්සේ ලක්දිවට වැඩම කරවීම, කිත්සිරි මෙවන් රජුගේ රාජ්‍ය කාලයේ සිට iv පැරකුම්බා රජුගේ රාජ්‍ය කාලය දක්වා මෙරට රජවරුන් විසින් සිදු කළ දළඳා පූජා ආදිය මේ තුළ අන්තර්ගතව පවතී. (රතනරංසි හිමි,1954).

මෙම දළඳා පූජාවලිය නම් වූ පුස්කොළ පොත් රචනා කිරීමේ දී සෙසු පුස්කොළ ග්‍රන්ථයන් හි දක්නට නොලැබෙන සුවිශේෂී භාෂා ලක්ෂණ, විශේෂිත භාෂා ශෛලීන් කතුවරයා විසින් භාවිත කර ඇති බව දක්නට ලැබේ. මෙම සුවිශේෂතා අධ්‍යයනය කර වාර්තා කර තැබීම මුඛ්‍ය පරමාර්ථය කරගෙන මෙම අධ්‍යයනය සිදු කළ අතර ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු පුස්කොළ පිටපත් හතරක් යොදා ගන්නා ලදි. එනම්, RK 24 දළඳා පූජාවලිය හෙවත් රංකිරිමඩ රජමහා විහාරයට අයත් පුස්කොළ පිටපත, DPV 75 හා DPV 65 ලෙස අංකනය කර ඇති දැඹව පුරාණ විහාරයට අයත් පුස්කොළ පිටපත, K 121 ලෙස අංකනය කර ඇති හඟුරන්කෙත පොත්ගුල් මාලිගා

මහා විහාරයට අයත් පුස්කොළ පිටපත යන පුස්කොළ පිටපත් මෙම අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලදි.

**දළඳා පූජාවලිය පුස්කොළ ග්‍රන්ථයන් හි සුවිශේෂී භාෂා ශෛලිය**

මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු **' දළඳ පූජාවලිය '** නම් පුස්කොළ පිටපත් හතරක් වන අතර මෙම පුස්කොළ ග්‍රන්ථයන් රචිත කතුවරයා විසින් එම ග්‍රන්ථයන් හි භාෂාව හැසිරවීමේ දී යොදා ගෙන තිබෙන සුවිශේෂතා සහ භාෂා ප්‍රයෝග එක් එක් පුස්කොළ පිටපත් අනුව පහත දැක්වෙන අයුරින් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කල හැක. එනම්,

**RK 24 පුස්කොළ පිටපත**

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු RK 24 දළඳ පූජාවලිය **" රංකිරිමඩ රජමහා විහාරයට "** අයත් පුස්කොළ පිටපතකි. මෙම පිටපතෙහි පත් ඉරු 33 ක් ඇති අතර එක් පත් ඉරුවක දිග සෙ.මී 46 ක් ද, පළල සෙ.මී 5.5 ක් ද වේ. මෙය **" සවස්ති "** ලෙස ආරම්භ කරමින් **" ග "** අක්ෂරය දක්වා පිටු නම් කොට තිබේ. පිටුවක් පේළි 7 කින් යුක්ත වන අතර අකුරු වටකුරු හා පැහැදිලි ය. කම්භය දැවයෙන් නිමවා ඇති අතර හූය නයිලෝන් ය. මෙහි සකිය නොමැත.**" සවස්ති** " ලෙස සඳහන් පිටුවේ ආරම්භයේ දෙපස නෙළුම් මල් මෝස්තර දෙකක් තිබේ. මෙම පොත සඳහා තවත් පොතක් අමුණා ඇත. එය **" ධජගග සුතතං "** ලෙස හඳුන්වා ඇත. එසේ අමුණා ඇති පොත ද සමඟ මෙම පුස්කොළ පොතෙහි මුළු පත් ඉරු ප්‍රමාණය 67 කි.

මෙම සංස්කරණයෙහි විශේෂ භාෂා ප්‍රයෝග රැසක් හඳුනාගත හැකි ය. එනම්,

- හල් අකුරු යෙදිය යුතු බොහෝ ස්ථාන වල හල් කිරීම වෙනුවට පසුපස අකුර සමඟ ළං කොට ලියා ඇත.
- උදා - නමොතසස, සමමා, සවසති.
- **'න, ක, ත'** යන අක්ෂර වල ට පසු **'ද, ධ'** සහ **'ව'** අක්ෂරය යෙදෙන විට අකුරු දෙක එකට බැඳ ඇත.
- උදා - තුන්‍දෙනා, ධුරන්‍ධර, රාජන්‍වූ.

- **'ම්බු'** අක්‍ෂර දෙක වෙනුවට **'ඹු'** අක්ෂරය යොදාගෙන ඇති බවක් පෙනෙයි.
- උදා - සඹුධසස , එඹා, ජඹුලීපය.
- **'ද්ධ'** යන අක්‍ෂර වෙනුවට මහප්‍රාණ **'ධ'** අක්‍ෂරය සඤ්ඤක කර ලියා ඇති බව දක්නට ලැබේ.
- උදා - ප්‍රසිඬ, සඬර්‍මම, බුඬ.
- **'ඞ, ං, ණ, න,'** යන අක්‍ෂරයන් ව්‍යඤ්ජනයක් හා බැඳෙන තැන ද අර්ධ අනුනාසිකාය දැක්වෙයි.
- උදා - ගඟා, සඥනිත, පඬුවාස,
- ව්‍යඤ්ජනයක් සමග යෙදිය යුතු **'ඒ '** කාරය සහ **'ඕ'** කාරය බොහෝ ස්ථානවල ලියා ඇත්තේ හ්‍රස්ව ය.
- උදා - බ්‍රහමදෙව, වාක්ප්‍රභෙද, මෙ, විලොප, අලගකොකානාර, ලොකයෙහි.
- **'ර්'** වෙනුවට යොදාගෙන ඇත්තේ රේඵයයි. රේඵය යෙදෙන බොහෝ අවස්ථාවල දී රේඵය සහිත අක්‍ෂරය දෙවරක් ලියා ඇත.
- උදා - චක්‍රවර්ත්ති, සඬර්‍මම, සවණර්‍ණ.
- **'ෘ'** කාරය ලිවිය යුතු ස්ථානයන් හි රකාරාංශය යොදා ගෙන ඇත.
- උදා - මෘගයන්, ප්‍රථුවිය, විවෘතව.
- **'ද්වි'** ශබ්ධය වෙනුවට **'ඞි'** නම් අක්ෂරයක් යොදා ගෙන ඇත
- උදා - ඞීපය, ඞාරයට, ඞිභූමික.
- **'න, ණ, ල, ළ'** යෙදීමේදී කිසිදු නීතියක් අනුගමනය කොට නැත.
- උදා - ඇරගෙණ, සමාණ, දලද, ලදරු, සිංහල
- **'ෂ, ශ, ස,'** යෙදීමේ දී **'තාලුජ'** ශ වැඩි වශයෙන් යොදා ගෙන ඇත.
- උදා - විශිනුත්, බශ්හි, ශටක්.
- අල්පප්‍රාණ මහප්‍රාණ යෙදීම ද ඇතැම් තැනක සදොස් ය.
- උදා - ධාය්‍යා,

ඉහත කී භාෂා ලක්ෂණ වලට අමතර ව **'සමීපය'** යන වචනය **'සවමීපය'** ලෙස ලියා ඇත. **'ගෞරවය'** යන වචනය **'ගවුරවය'** ආදී ලෙස ද, **'ශාස්ත්‍ර'** යන්න **'ශාස්ත්‍රැ'** ලෙස ද, **' බෑනනුවන් '** යන්න **'බ්‍යානනුවන් '** ලෙස ද, **'සෘධි'** යන්න **'පෞඪි'** ලෙස ද ලියා ඇත. වර්ථමාන භාෂාවේ හඳුනාගත නොහැකි අක්‍ෂර ද මෙම පුස්කොළ

පිටපත්හි හඳුනාගත හැකි ය. එනම්, **'බ්බ'** ශබ්ධය සඳහා වර්ථමාන භාවිතයේ නොමැති අක්ෂරයක් භාවිත කොට ඇත. එය මෙසේ පෙන්වා දිය හැකි ය.

“ ” - පරිනි ඞාන, ශාසත්‍රඞායාස, ප ඞත.

මෙහි ඇතැම් ස්ථාන වල අනුස්වාරය යොද ඇත්තේ ඉස්පිල්ල ඇතුලිනි.

“  ” - ශ්‍රී හල

**“ච්ච”** ශබ්ධය සඳහා මෙවන් අක්ෂරයක් භාවිතා කොට ඇත.

 - -ච්ච

වර්ථමාන ව්‍යවහාරය අනුව සළකන විට ඉහත සඳහන් වෙනස්කම් සෑම දළද පූජාවලිය පුස්කොළ පිටපතකම දැකිය හැකි ය.

## DPV 75 පුස්කොළ පිටපත

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු DPV 75 ලෙස අංකනය කර ඇති දළද පූජාවලිය “ **දැඹව පුරාණ විහාරයට** ” අයත් පුස්කොළ පිටපතකි. මෙම පුස්කොළ පිටපතෙහි පත් ඉරු 37 ක් ඇති අතර පත් ඉරුවක දිග සෙ.මී 35 ක් වන අතර පළල සෙ.මී 5 කි. මෙය **'ක'** සිට **'ගී'** දක්වා අංකනය කොට තිබේ. පිටුවක පේළි 6-7 පමණ ඇත. අකුරු වටකුරු හා පැහැදිලි ය. කම්භය දැවයෙන් සාද ඇති අතර හූය කපු ය. මෙහි සකිය නොමැති අතර මුල් පත් ඉරු තරමක් කැඩී තිබේ.

මෙම 'දළද පූජාවලිය' පුස්කොළ පිටපත ආරම්භ වන්නේ මෙසේ ය.

**නමොතසස භගවතො අරහතො සමමා සඹුධසස සවසති නවරතන ශ්‍රී විජිත ලංකාතල රාජජ ධුරන්‍ධර නවරතනිරතරත්නත්‍රා පරිපාලන මුඩාභිෂිකත කනක මණිමකුට මෞලිමාලාලංකෘත ගුණගණාභරණ විභූසිත ත්‍රිසිංහලෛකඡත්‍ර භුවනහිතකර භුවනෛකබාහු මනුසාසිත ධුරන්‍ධර පරශසත්‍රැ විකල විලොප නිවාරණ සන්‍ධි සන්‍ධානකර සේනනතරාමාත්‍ය අලගකෙකානාර ජයසිංහ ප්‍රතිරාජ සමීරිත නාම ප්‍රසිඩ අග්‍රඅමාත්‍යයන් තුන්දෙන හට සඤනිත පුණ්‍ය සමභාර ප්‍රධානය කොට කියනු ය. ”**

මෙම **'දළදා පූජාවලිය'** පුස්කොළ පිටපත අවසන් කොට ඇත්තේ මෙසේ ය.

**රාජධමම ම කොපෙනෙතා රඤයනතා මහාජනං රාජානොපිවිරං ධමමා පාලයනතු වසුන්ධරං. දළදා පූජාවලියයි. ඉමං ලිඛිත පුඤ්ඤෙන මෙතෙතයයං උපසංකම් පතිඨ හිත්වා සරනෙසුපපතිඨා මිසාසනෙ. "**

ඉහත පිටපතෙහි කියන ලද වෙනස්කම් වල ට අමතරව මෙම පිටපතෙහි **'රාජ්‍ය'** යන වචනය **'රාජජ'** ලෙස ලියා ඇති බව දක්නට ලැබේ.

## K 121 පුස්කොළ පිටපත

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු K 121 ලෙස අංකනය කර ඇති දළදා පූජාවලිය පුස්කොළ පිටපත " **හඟුරන්කෙත පොත්ගුල් මාලිගා මහා විහාරයට** " අයත් පුස්කොළ පිටපතකි. මෙම පුස්කොළ පිටපතෙහි පත් ඉරු 34 ක් පවතින අතර පත් ඉරුවක දිග සෙ.මී 43 ක් වන අතර පළල සෙ.මී 5 කි. **'ක'** සිට **'ඛඃ'** දක්වා අංකනය කොට තිබේ. පිටුවක පේළි 6-7 පමණ ඇත. අකුරු වටකුරු හා පැහැදිලි ය. හූය කපු ය. මෙහි කම්භය සහ සකිය නොමැත. මෙම පිටපතෙහි නමස්කාර පාඨයෙන් පසු එන ආරම්භය මදක් වෙනස් ය.

මෙම 'දළදා පූජාවලිය' පුස්කොළ පිටපත ආරම්භ වන්නේ මෙසේ ය.

**නමොතසස භගවතො අරහතො සමමා සඹුඩසස "**

**යකෙඛ ද මෙත්වා මුනයො ඉමසමිං වත්‍ථුතතය වාසමකං සුපුඩෙධමෙමයි තානං වනරාධිතනංවං සොපවනතිසසති සීහළසමිං මුනයො මුනීහු හෙවත් අගාරික මුනි අනගාරික මුනි සෙඛර මුනි අසෙඛර මුනි පඩෙක මුනි සංඛ්‍යාත පඤවිධ මුනීනට මුනිසවර වූ සර්ව්ඥමුනීහු පුබෙබ පූර්ව කාළයෙහි ඉමසමිං සීහල සමිං සිංහල ඞීපයෙහි හෙවත් අප බුදුන් බුදු වීමට පළමු ජඹුඞීපයෙහි කළිඟු රට කාළි ගමකක්‍රවතීති රජහුගෙ රාජ වංසය නොහැර ආ වඞගරාසසයං ධීතා අරඤෙඤ වන ගොමරා සීහස වොසමත්‍ථය අළවෙදුරකෙ අතිකකනත කෙළ සවසෙසා නික්ඛමිත්වා ගහන තතා රාමා පෙසිනඟං තත්‍ථ සීහපුරවරුතතම මෙසෙ වඟ රට වඟු රජුගෙ ධීතුවක් සෙරිචාරීව ගොස් ලාඩ දෙශයෙහි සිංහයකු හා සංවාසව ලබන ලද රජ කුමරෙක් අතික්‍රානත**

**ශෙෂවෂී ඇතිව එහි ම සිංහ නම් පුරයකකරවා වසනුයෙ. බතතිංස හා නරාහොනති සීහපුතතසස අනුජාවිජයසස සමායොවසෙසා කනිඨභාතරා. මෙසේ වාසය කරනනා වූ ඒ සීහබාහු නම් නරෙන්‍ද්‍රවඤයාගෙ අති ජාත පුත්‍ර වූ දෙතිස් රජ කුමරුවන් අතුරෙන් ප්‍රධාන පුත්‍ර වූ පවිත්‍ර චාරිත්‍ර විචිත්‍ර ගුණ ඇති විජය නම් රජ කුමරුයෙක් පරිනිබබාන සමසෙසබුධො දිපමුතත මො සීහබාහුසසයන් පුතෙතා විජය නාම ඛතති යෙ ලංකාදීපන් අනුපපනෙනා හිතවා ජම්බුසිරිවහයං ව්‍යාකාසි බුධ සෙඨො රාජා හො හීති ඛනතියො අප බුදුන් පිරිණිවන් පානා දවස් සීහබාහු රජු පිත් විජය නම් රජකු මරුවෙක් ජම්බුඞීපය හැර ලක්දිවු බැස රජ කරනෙන යයි බුදුන් විසින් වදරන ලද.**

**නමොතසස භගවතො අරහතො සමමා සම්බුධසස.**

**සවසති නවරතන ශ්‍රී විරාජිත ලංකාතල රාජජ ධුරන්‍ධර නවරතනිරතරතනත්‍රය පරිපාලන මුඪාභිෂිකත කනක මනිමකුට මෞලිමාලාලංකෘත ගුණගණාභරණ විභූසිත ත්‍රිසිංහලෛකචඡත්‍ර භුවනහිතකර භුවනෛකබාහු මනුසාසිත ධුරන්‍ධර පරශසත්‍රැ විකල විලොකප නිවාරණ සන්‍ධි සන්‍ධානකර සේනනතරාමාත්‍ය අලගකෙකානාර ජයසිංහ ප්‍රතිරාජ සම්රිත නාම ප්‍රතිසිධ අග්‍රඅමාත්‍යයන් තුනෙනා හට සඤනිත පුණ්‍ය සමභාර ප්‍රදනය කොට කියනු ය.”**

මෙම ‘දළද පූජාවලිය’ පුස්කොළ පිටපත අවසන් කොට ඇත්තේ මෙසේ ය.

**රාජධමම ම කොපෙනෙතා රඤයනතා මහාජනං රාජානොපිවිරං ධමමා පාලයනතු වසුන්‍ධරං. දළද පූජාවලියයි. ඉමං ලිඛිත පුඤ්ඤෙන මෙතෙතයාං උපසංකම් පතිඨ හිතවා සරණෙසුපපඨා මිසාසනෙ සිධිරසතු. ”**

පෙර සඳහන් කළ පිටපත් වල කියන ලද වෙනස්කම් වලට අමතරව මෙම පිටපතෙහි **‘රාජ්‍ය**’ යන වචනය **‘රාජජය’** ලෙස ලියා ඇති බව දක්නට ලැබේ. එමෙන් ම **‘ඊ’** අක්ෂරය ලියා ඇත්තේ **‘ඉ් ’** ලෙස ය.

උද - ඉ්ට, ඉ්ෂ්‍යාවෙන්.

මෙම පිටපතෙහි **“හිං”** යන ශබ්ධය ලියා ඇත්තේ මෙසේ ය.

හී උද- ම හී දෙධනෙතා.

## DPV 65 පුස්කොළ පිටපත

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය සතු DPV 65 දළද පූජාවලිය **" දැඹව පුරාණ විහාරයට "** අයත් පුස්කොළ පිටපතකි. මෙහි මුළු පත් ඉරු ප්‍රමාණය 277 කි. පත් ඉරු කවලම්ව පවතින මෙහි දළද පූජාවලිය පවතින්නේ 213 පත් ඉරුවේ සිට 239 පත් ඉරුව දක්වා පමණි. ඒ අනුව දළද පූජාවලිය සඳහන් පත් ඉරු ප්‍රමාණය 26 කි. පත් ඉරුවක දිග සෙ.මී 53 ක් වන අතර පළල සෙ.මී 4.9 කි. **' සවස්ති '** ලෙස ආරම්භ කරමින් **'ඨෟ'** දක්වා පිටු නම් කොට තිබේ. පිටුවක පේළි 6-7 පමණ පවතී. අකුරු හංස ශෛලයට අයත් ය. කම්භය දැවයෙන් සාද ඇති අතර අලංකාර මෝස්තර සහිතය. හංස පූට්ටුව කම්භයේ දෙපස දක්නට ලැබෙයි. හූය කපු ය. මෙහි සකිය පිත්තල වලින් සාද රන් ආලේපිත කර ඇත.

මෙම 'දළද පූජාවලිය' පුස්කොළ පිටපත ආරම්භ වන්නේ මෙසේ ය.

**නමොබුඩාය."**

**සවසති නවරතන ශ්‍රී විරාජිත ලංකාතල රාජජ ධූරන්ධර නවරතනිරතරතනත්‍රය පරිපාලන මූර්ධාභිෂිකත කනක මනිමකුට මෞලිමාලාලංක්‍රිත ගුණගණාභරණ විභූසිත ත්‍රිසිංහලෛකචඡත්‍ර භුවනහිතකර භූවනෛකබාහු මනුසාසිත ධූරන්ධර පරශසත්‍රැ විකල විලොප නිවාරණ සන්ධි සන්ධානකර සේනනතරාමාත්‍ය අලගකෙකානාර ජයසිංහ ප්‍රතිරාජ සමීතරිත නාම ප්‍රසිඩ අග්‍රඅමාත්‍යයන් තුන්දෙන හට සඡිනිත පුණ්‍ය සමභාර ප්‍රදනය කොට කියනු ය."**

මෙම 'දළද පූජාවලිය' පුස්කොළ පිටපත අවසන් කොට ඇත්තේ මෙසේ ය.

**රාජ ධර්‍මම ම කොපෙනෙතා රඡයනතා මහාජනං රාජානොපිවිරං ධමමා පාලයනතු වසුන්ධරං. දළද පූජාවලියයි. ඉමං ලිඛිත පුඤ්ඤෙන මෙතෙතයාං උපසංකම් පතිඨ හිතවා සරනෙසුපපතිඨා මිසාසනෙ. ආයුෂ්‍ය මසතු බල මසතු සමාධිරසතු බොජඣඞග මසතු විජයොසතු සමඪිරසතු පාපාක්‍ෂයො සතු කරුණු සතු මහාජයොසතු මඞගල්‍යමසතු තම වාඤ්ඡිත සිඬිරසතු"**

RK 24 හි හා සෙසු පිටපත් වලට වෙනස්කම් වලට අමතරව මෙම පිටපතෙහි **'රාජ්‍ය'** යන වචනය **'රාජජය'** ලෙස ලියා ඇති බව පෙනෙයි. **'ඊ'** අක්‍ෂරය ලියා ඇත්තේ **'ඉ්'** ලෙස ය.

උදා - ඉ්ට, ඉ්ෂ්‍යාවෙන්.

 නම් අක්‍ෂරයක් ද මෙහි ඇත.

උදා - වාල 

**දළදා පූජාවලියෙහි භාෂා ලක්‍ෂණ**

දළදා පූජාවලියෙහි භාෂා ලක්‍ෂණ විමර්ශනය කිරීමේ දී මේ තුළ එකම කථා පුවතක් පැවතිය ද භාෂාව, අක්ෂර, යෙදුම් ආදියෙහි පුස්කොළ පිටපත් අතර යම් යම් වෙනස්කම් පවතී. එහෙත් එහි අන්තර්ගත කරුණු සහ අනෙකුත් භාෂා ලක්‍ෂණ එක සමාන ය. පාලි දඨා වංසය ඇසුරු කොට ගෙන රචිත බව සැලකෙන දළදා පූජාවලියෙහි ගද්‍ය සහ ගාථා එකට මිශ්‍රව පැවතීම විශේෂත්වයකි. එනම්,

උදා - " පස්සථ ඉමං තාපසං - ජටිලං උගග තාපනං "

අපරිමෙයො ඉතො කපෙප - අයං බුද්ධො භවිසසති

**" යනාදීන් 'එම්බා මහණෙනි! උග්‍ර වූ තපො තෙජස් ඇත්තා වූ මේ තාපසයන් බලවු. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි මා සේ ම බුදුව සියලු සත්‍වයන් සංසාර නැමැති සාගරයෙන් ගොඩනගාලා ශානත වූ නිර්‍වාණ දයක වන්නේය'යි මතු උපදනා නුවර ද ඔහු මවුපිය දෙදෙනා ද පුත්‍රකලත්‍ර වාහන ද බොධි වජ්‍රාසන අග්‍රශ්‍රාවකාදී වූ විශෙෂ ද ප්‍රකාශ කොට 'මේ සත්‍වතෙමේ මතු ගෞතම නම් බුදු වෙයි' යනාදීන් විවරණ දී වදරා තුන්වරෙක පැදකුණු කොට මල් අට මිටකින් පූජා කොට නික්මුණු කලහි "**

දළදා පූජාවලිය කුරුණෑගල යුගයට ආවේණික මිශ්‍ර සිංහල රීතියකට අනුව රචනා කර ඇත. දළදා පූජාවලියෙහි භාෂා ලක්‍ෂණ විමසීමේ දී මූලික වශයෙන් වාක්‍ය ගැලපීමේ දුර්වලතා හඳුනාගත හැක. පූර්ව ක්‍රියා සහ නිපාත මඟින් එකිනෙකට

සම්බන්ධ කළ දීර්ඝ වැකිවලින් දළදා පූජාවලිය සමලංකෘත ය. ඇතැම් එවැනි දීර්ඝ වැකි සාහිත්‍යමය ගුණයෙන් පෝෂිත ය. එනම්,

**" ඉක්බිති බුදුරජාණන් වහන්සේ ගණනායක සත්ලක්ෂයක් ප්‍රධාන කොට ඇති කෙළ ගණන් භික්ෂූන් වහන්සේ හා ලක්ෂ ගණන් භික්ෂුණීන් වහන්සේට සුවාසුදහසක් ධර්ම සකන්ධය 'අප්පමාදෙන සම්පාදෙථ භික්ඛවො' යනාදීන් හකුළුවා වදාරා අවශෙෂ බෙහෝ දිව්‍ය බ්‍රහමයන් ඇතුළු වූ සනරාමර ලොකයාහට බණ වදාරා සකන්ධ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවි කල්හි...."**

එසේ නමුත් ඇතැම් ස්ථායන් හි කෙටි වාක්‍ය ද යොදා ගෙන ඇති බවක් ද පෙනෙයි. එනම්,

**ඒ දළදා වහන්සේගේ අනුභාවයෙන් රල පතර සන්සිඳුනේ ය. උතුරු දිගින් හමන ලද පවන දක්ෂිණ දිශාවට හමන්නේ ය."**

මෙම යුගය වන විට බොහෝ පාලි ග්‍රන්ථ සිංහලයට හැරවීම සිදු විය. එසේම සිය නිර්මාණ සඳහා කතුවරුන් විසින් වෙනත් පාලි ග්‍රන්ථ ඇසුරු කිරීමට ද යොමු විය. දළදා පූජාවලිය රචනා කිරීමේ දී දඨා වංසය හැරුණු විට වෙනත් පාලි ග්‍රන්ථ ද යොදා ගත් නිසා භාෂා විෂමතා දැකිය හැක. එසේම ජාතක කථාවල සාරාංශය දැක්වීම ද මෙම කෘතියේ විශේෂත්වයකි. ජාතක කථා පහළොවක් ඒ සඳහා යොදා ගෙන ඇත. දඨා වංසය, මහාවංසය, දීපවංසය, සද්ධර්මරත්නාකරය, ජිලංකාරය, රසවාහිනිය ආදී ග්‍රන්ථ ඇසුරු ගර ගනිමින් විවරණ කථාව, සිද්ධාර්ථ කුමාර චරිතය, බුද්ධත්වය ලැබීම, ලංකාගමනය සහ පිරිනිවන් පෑම යන කථා පුවත් නිර්මාණය කරන්නට ඇති බව උපකල්පනය කල හැක. එම කෘති තුළ පවතින ඇතැම් ගාථා දළදා පූජාවලියට අන්තර්ගත කිරීම නිසා එම කෘති තුළ අඩංගු භාෂා ලක්ෂණ දළදා පූජාවලියට ප්‍රවිශ්ට වී තිබේ. එමෙන් ම මිශ්‍ර සිංහල ලේඛන රීතිය කෙරෙහි යොමු වුන කතුවරයා එදිනෙදා පොදු ජනවහරින් උපුටා ගත් වචන ද යොදා ගෙන ඇත. උපමා භාවිතය පිළිබඳව ද දළදා පූජාවලිය කතුවරයා අවධානය යොමු කර ඇත.

- භේරි නාද නැමැති සුගන්ධයෙන් ආ යාචක සමූහ නැමැති භ්‍රෑංග ශ්‍රෙණීන් දන නැමැති මුවරද සමූහයෙන් පිනවා
- බුද්ධ ශ්‍රී නැමැති චන්ද්‍රයා උදකරවා වෛනෙය ජන නැමැති කෞමුද වනයන් ප්‍රබොධ කරවමින්

- සන්ධ්‍යාවලාහයෙකින් නිකුත් රන් විදුලියක් සේ
- චක්‍රවර්ති රජක්හුගේ කන තුබූ රුවන් තෝඩුවක් ගිළිහී භූමියෙහි පතිතවනනාක් මෙන්
- වසවර්ති මාරයා ඇස වැලි ගසන්නා සේ
- රන් විදුලියක් නිල් වූ මෙඝකූටයක් වළඳනා කලක් පරිද්දෙන්
- සත්රුවන් කරඬුවක් විවෘත කරනනාක්හු මෙන් ද දසපාරමිතා නැමැති ජලයෙහි සමභූත වූ සර්වඥතාඥාන නැමැති සූර්ය රශ්මීන් විකශිත වූ ජිවහා නැමැති කර්ණිකා ඇති සුවිසුද්ධ අවිරළ දන්ත පන්ති නැමැති කෙශර පන්ති ඇති සුරක්ත වර අධර නැමැති පත්‍ර පරිවෘතව සද්ධර්ම නැමැති මධු බිංදු වැහෙන්නා වූ සශ්‍රීක වූ මුඛ නැමැති පද්මය විදහා

එමෙන් ම ආයුධ වර්ග, වෘක්ෂලතා, තූර්ය භාණ්ඩ, නොයෙක් රත්නයන් ආදියෙහි නාමාවලි දැක්වීම දළදා පූජාවලිය කතුවරයාගේ වර්ණනා රීතියෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එනම්,

**...චන්ද්‍ර චක්‍රාදී විවිධ ප්‍රකාර වූ ඛඩ්ග කුන්ත තෝමර භෙණ්ඩිවාලාදී වූ ආයුධ ගත්තා වූ දස බිම්බරක් මාරසේනාව පිරිවරමින්...."**

**...රාත්‍රි දිනයෙහි අප්‍රමාද වූ සිතින් සඳුන් කස්තුරු කපුරු අගරු දෙව් දුරු කළුවැල් තුවරලා දුම් ආදී වූ නානාවිධ සුගන්ධ ද්‍රව්‍යයෙන් ද නාග පුන්නාග පූග චම්පක සලලාසොක නීප සහකාර කර්ණිකාර කොවිලාර පාටලී සින්ධුවාර ආදී වූ පුෂ්ප ජාතීන් ද දැසමන් සීනිද්ද බෝලිද්ද සෞගන්ධි ආදී වූ එලසථ පුෂ්ප ජාතියෙන් ද, උත්පල කුමුද පුණ්ඩරීක පදුම යනාදී වූ ජලජ පද්මාදියෙන් ද අනෙක ප්‍රකාර පුෂ්ප ජාතියෙන් ද කරන ලද නිරන්තර පූජෝත්සවයෙන් ද, ආතතය විතතය ආතතවිතතය ඝනය සුසිරය යන පංචාංගික තූර්ය නාදයෙන් අනවරත පූජොත්සව කෙරෙමින් අන්වයානු ක්‍රමයෙන් නොයෙක් රජවරුන් විසින් යථොකත වූ සුචරිතය පවත්වා ආ කල්හි...."**

එසේ ම වාක්‍ය අලංකාර කිරීම සඳහා අනුප්‍රාසවත් ශබ්ධ විශේෂණ ද ඇතැම් ස්ථානයන් හි යොදා ගෙන ඇත. එනම්,

- කෘදෘෂටි ආදී වූ මිත්‍ථ්‍යා දෘෂටි

- ප්‍රාතිහාර්ය නැමැති ආශ්චර්ය
- දෘෂටිය නැමැති යෂටිය

එකම අරුත සපයන වචන දෙකක් එක තැන යෙදීම මඟින් ද බස රසවත් කර ගැනීමට දළඳ පූජාවලි කතුවරයා උත්සාහ කොට ඇත. එනම්,

- **අත් පොළන අත්පොළසනින් ද**
- **තමාගේ සිය නුවරින් අවුත්**

කෙසේ නමුත් දළඳ වහන්සේ පිළිබඳව රචනා කරන ලද වංස කතා අතුරින් සාමාන්‍ය ජනයාට අවබෝධ කර ගත හැකි අයුරින් සරල බස් වහරකින් රචිත එකම වංස කතාව වශයෙන් දළඳ පූජාවලියට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක් බව කිව යුතුම ය.

**සමාලෝචනය**

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය තුළ ඇති දළඳ පූජාවලිය පුස්කොළ පිටපත් යොදාගනිමින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසයටක උරුමකම් කියන පුස්කොළ ලේකන කලාවේ භාෂා ශෛලියේ සුවිශේෂත්වය අධ්‍යයනයට බඳුන කරන ලදි. විශේෂයෙන් ම සෙසු පුස්කොළ ග්‍රන්ථයන් හි බස් වහරෙන් ඔබ්බට ගිය මනා ශාස්ත්‍රීය හා ප්‍රබුද්ධ භාෂා සම්ප්‍රදායක් දළඳා පූජාවලිය නම් පුස්කොළ පොත් තුළ දක්නට ලැබෙන අතර මෙහි දී යොදාගෙන තිබෙන භාෂාව, අක්ෂර, යෙදුම් යනාදියට අනුව තෝරාගත් පුස්කොළ පිටපත් අතර යම් යම් වෙනස්කම් පැවතිය ද එහි අන්තර්ගත කරුණු සහ අනෙකුත් භාෂා ලක්‍ෂණ එක සමාන ය. එමෙන් ම දළඳා පූජාවලිය අධ්‍යයනය මගින් හඳුනාගත් සෙසු භාෂා ලක්ෂණ වශයෙන් කුරුණෑගල යුගයට ආවේණික මිශ්‍ර සිංහල රීතියකට අනුව රචනා කර තිබීම, වාක්‍ය ගැලපීමේ දුර්වලතා, පූර්ව ක්‍රියා සහ නිපාත මඟින් එකිනෙකට සම්බන්ධ කළ දීර්ඝ වැකිවලින් සමන්විත වීම, කෙටි වාක්‍ය ද යොද ගැනීම, දළඳ පූජාවලිය රචනා කිරීමේ දී දාඨා වංසය හැරුණු විට වෙනත් පාලි ග්‍රන්ථ ද යොද ගත් නිසා භාෂා විෂමතා දැකිය හැකි වීම, ජාතක කථාවල සාරාංශය දැක්වීම, එමෙන් ම මිශ්‍ර සිංහල ලේඛන රීතිය කෙරෙහි යොමු වුන කතුවරයා එදිනෙද පොදු ජනවහරින් උපුටා ගත් වචන ද ගැනීම, උපමා භාවිතය, ආයුධ වර්ග, වෘක්‍ෂලතා, තූර්ය භාණ්ඩ, නොයෙක් රත්නයන් ආදියෙහි නාමාවලි

දැක්වීම, වාක්‍ය අලංකාර කිරීම සඳහා අනුප්‍රාසවත් ශබ්ධ විශේෂණ යෙදීම, යනාදිය පෙන්වා දිය හැක. මෙවැනි වෙනස් මුහුණුවරකින් හා භාෂා ශෛලියකින් මෙම පුස්කොළ ග්‍රන්ථ රචනා කල ද දළද මෙහි ඇති විශේෂත්වය වන්නේ වියත් සමාජයට මෙන් ම සාමාන්‍ය ජනයාට ද අවබෝධ කර ගත හැකි අයුරින් සරල බස් වහරකින් හා මනා සාහිත්‍යමය ගුණයකින් දළඳා පූජාවලිය රචනා කර ඇති බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

රතනරංසි හිමි, (1954).දළද පූජාවලිය. කනදුල්ලේ (සංස්.), සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

ඔජඪ 65 දළද පූජාවලිය, දැඹව පුරාණ විහාරය, මාදිහෙල,ගලේවෙල

ඔජඪ 75 දළද පූජාවලිය, දැඹව පුරාණ විහාරය, මාදිහෙල,ගලේවෙල

ඍණ 24 දළද පූජාවලිය, රංකිරිමඩ රජමහා විහාරය, දොළුව, කඹුක් වැව

ණ 121 දළද පූජාවලිය, රන්කෙත පොත් ගුල් මාලිගා මහා විහාරය.

# Sri Lankan indigenous medicine related to intangible cultural heritage

**Menaka N.**
nishanthi@sjp.ac.lk
University of Sri Jayewardenepura, Sri Lanka

## *Abstract*

*In the course of human evolution, ever since humans began to live in groups, a culture and civilization have been built within them. The word "culture" has also been used to denote the intellectual and aesthetic formation of a society. In the early stages, culture meant the formation of the mind or the shaping of the mind. The late 18th through late 19th centuries saw the emergence and development of various conceptions related to culture. Here, culture first means a general condition or habit in the human mind. And the artistic and intellectual process is also known as "culture" in general. Culture does not refer to a specific development or polishing of a society, but rather to the entire social tradition or social heritage. Diversity and differences among people are seen in two ways. That is, based on physical characteristics as well as innate heritage or culture. Man has an innate heritage as well as a social heritage. Whatever genetic endowment a man receives, he is raised in his family from infancy. He learns from his family's manners and customs. Here, he learns the traditional practices of the society and acquires knowledge through experience and living. Every human society has a culture and its own wealth of knowledge. This study emphasizes the indigenous medicine related to the intangible cultural heritage of Sri Lankan society.*

***Keywords:*** *Intangible Culture, Intangible Cultural Heritage, Indigenous Knowledge, Indigenous Medicine, Alternative Medicine*

## හැඳින්වීම

යම් සමාජයකට අයත් සාමාජිකයකු වශයෙන් මිනිසා ලබාගන්නා දැනුම, ඇදහිලි විශ්වාස, කලා, සාරධර්ම, නීති, ගති පැවතුම්, චාරිත්‍ර වාරිත්‍ර සහ සෙසු දක්ෂතා ආදී සියල්ලෙහිම එකතුව සංස්කෘතියයි. සංස්කෘතිය යනු මානව විද්‍යාවට අයත් යෙදුමයි. සංස්කෘතිය යන වචනයෙහි නිරුක්තිය අනුව කියවෙන්නේ මැනවින් එක්තැන්ව ගොඩ නැගුණු දෙයකි. ''ස'' යන උපසර්ගය ''කෘ'' යන ධාතුව හා යෙදීමෙන් සැදුණු සංස්කෘතිය යන සංස්කෘත පදය අප සිංහල භාෂාවෙහි ද ව්‍යවහාර කරන්නේ ඉංග්‍රිසි ,ක්‍මකඑමරු, යන පදයට සමානවය (වික්‍රමසිංහ, 1976). ඒ අනුව සංස්කෘතිය යන වචනය සමාජමය, බුද්ධිමය හා සෞන්දර්යාත්මක හැඩ ගැස්සවීම සඳහා යොදන්නට ඇත.

සංස්කෘතිය හා සමාජය බොහෝවිට සමානාර්ථ ඇති පද ලෙස හැඳින්විය හැකිය. එනම් කිසියම් සමාජයකට සංස්කෘතියෙන් තොරව පැවතිය නොහැකිය. ඉන් අදහස් කරනුයේ කිසියම් සංවිධානය වූ ජීවන රටාවකින් තොරව සමාජයකට පැවතී සිටිය නොහැකි බවයි. සැමවිටම සංස්කෘතිය පවතින්නේ සමාජය පදනම් කොට ගෙනය. සංස්කෘතිය පිළිබඳ බොහෝ විද්වතුන් විසින් අර්ථ නිරූපන ඉදිරිපත් කොට ඇත.

## සංස්කෘතිය

සංස්කෘතිය සම්බන්ධයෙන් ප්‍රථම වරට විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කර ඇත්තේ ඊ. බී. ටයිලර් විසින් 1871 ප්‍රකාශයට පත් කළ ප්‍රාථමික සංස්කෘතිය නම් ග්‍රන්ථයෙහි ''සංස්කෘතිය යනු දැනුම්, ඇදහීම්, කලාව, සදාචාර ධර්ම, නීතිය, සිරිත් විරිත් හා සමාජයේ සාමාජිකයකු ලෙස මිනිසා විසින් ලබා ඇති අන් සියළුම දක්ෂතා හා ගති පැවතුම් ඇතුලත් සංකීර්ණ සියල්ලයි'' (Tylor, 1920). මෙහි දැක්වෙන සංකීර්ණ සියල්ල තුළ භෞතික, ආර්ථික හා ආධ්‍යාත්මික කරුණු ඇතුළත් වේ.

ඇතැම් විද්‍යාඥයන් සංස්කෘතිය හඳුන්වන්නේ ''සම්පූර්ණ සාමාජික සම්ප්‍රදා රටාවක් නැතහොත් සමාජයක උරුමයන්'' වශයෙනි. මෙම අදහසට අනුව සංස්කෘතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ සෙසු අයගෙන්, අපගේ වැඩිහිටියන් ගෙන් අප ඉගෙන ගන්නා ලද දැනුම්, ඇදහිලි, චාරිත්‍ර වාරිත්‍ර හා කලා ශිල්ප ආදියයි (සරච්චන්ද්‍ර, 1977). තවදුරටත් මේ පිළිබඳව විග්‍රහ කර බැලීමේදී පැහැදිලි වනුයේ සංස්කෘතිය කියනුයේ අතීතයෙන් උරුම වූ දේවල් හා අප විසින් එයට එකතු කරගන්නා දේවල්ය.

මින් අදහස් වනුයේ සමාජයේ වෙසෙන පුද්ගලයන්ගේ දිවිපෙවෙතෙහි අඩංගු වන දේ මූලික වශයෙන් තීරණය කරනුයේ සංස්කෘතිය බවය.

සංස්කෘතිය යන වචනයට උගතුන් විසින් නොයෙක් අර්ථ විවරණයක් ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව උගතුන් තුළ ඇති අදහස් විවිධය. එනම්,

- මනුෂ්‍යයා විසින් මෙතෙක් කල් එක්රැස් කොට දායාද වශයෙන් අපට තබා ගිය ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද සියල්ලම අප විසින් සංස්කෘති යැයි කියනු ලැබේ.
- සංස්කෘතිය නම් ජීවත්වන සමාජය හැඩගස්වා ගන්නා ආයුධයකි.
- සංස්කෘතිය නම් දැනුමයි.
- සංස්කෘතිය නම් මිනිසුන්ගේ ජීවිතය පිළිබඳ ක්‍රමයකි.
- ලෞකික ජීවිතයේ අභිවෘද්ධිය උදෙසා නිරායාසයෙන්ම පහල වන මනා ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵල වශයෙන් ද ආධ්‍යාත්මික සහ සදාචාර ජීවිතයේ බාහිර පෙනුමක් වශයෙන් ද සංස්කෘතිය විස්තර කළ හැකිය.
- සංස්කෘතිය නම් මානව විද්‍යාවේ ශාඛාවකි (විමලවංශ, 2000).

සංස්කෘතිය සම්බන්ධයෙන් ටයිලර් ඉදිරිපත් කළ විද්‍යාත්මක විග්‍රහයෙන් අනතුරුව එය පදනම් කරගෙන විවිධ මත ඉදිරිපත් කර ඇත. සංස්කෘතිය, සමාජ, මානව හා මනෝ විද්‍යාවන්ගේ මූලික සංකල්පයක් ලෙස පිළිගැනීමෙන් පසු එහි අර්ථය තව තවත් පුළුල් විය. ඇමරිකානු මානව විද්‍යාඥයකු වූ සී. විස්ලර් 'ඇමරිකානු මානව විද්‍යාඥයා' (American Anthropologist) නැමැති ග්‍රන්ථයෙහි සංස්කෘතිය පිළිබඳව විවරණයක් කරමින් ''භාෂාව, අවාහ විවාහ, ආචාර සමාචාර, කලාව, කර්මාන්ත ආදි සියලුම සාමාජික කටයුතු සංස්කෘතිය වශයෙන් සඳහන් කර ඇත (සරච්චන්ද්‍ර, 1977). වික්‍රමසිංහට (1976) අනුව, මෙතෙක් සංස්කෘතිය සම්බන්ධයෙන් කෙරී ඇති විග්‍රහයන් දෙස බැලූවිට ඒවායින් සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. එම විග්‍රහයන් පහත දැක් වේ.

''ජනතාවකගේ සමාජ හැසිරීම්වල සියලු පහළවීම් ද සමාජයේ ඒ හැසිරීම් බලපාන ලද පුද්ගලයන්ගේ ප්‍රතික්‍රියා ද ඒ හැසිරීම් වලින් නිශ්චය කරන ලද මිනිස් ක්‍රියාවලියේ නිෂ්පාදන ද සංස්කෘතියට ඇතුළත් වේ.''

**(ප්‍රැන්ස් බොයස්)**

''සාමාන්‍ය යෙදුමක් ලෙස සංස්කෘතිය යන්නෙන් අදහස් වන්නේ මනුෂ්‍ය වර්ගයාගේ සියලු සමාජ උරුමයයි. විශේෂ යෙදුමක් ලෙස සංස්කෘතියක් යන්නෙන් සමාජ උරුමයේ එක්තරා විලාසයක් අදහස් වේ''

**(රැල්ෆ් ලින්ටන්)**

''යම් ජන සමූහයක් විසින් කටයුතු කරන ආකාරයත්, උපකරණ හා ආයුධ නිපදවා පාවිච්චි කරන පිළිවෙළත්, ඔවුනොවුන් හා සමඟ මෙන් ම පිටස්තර අය සමඟ ද කල් ගෙවන ක්‍රමයත්, ඔවුන්ගේ සිතිවිලි හා ඒ සිතිවිලි පළ කිරීමට වචන භාවිත කරන ආකාරයත් සංස්කෘතියයි''

**(පොල් සියන්)**

''යම් ජනතාවකගේ සංස්කෘතිය නම් ඔවුන්ගේ කායික හා සමාජමය වුවමනාවන් පිරිමසා ගැනීම සඳහා ඔවුන් යොදාගන්නා භෞතික හා බුද්ධිමය උපකරණ සමූහය සහ සිය පරිසරයට ගැලපෙන පරිදි ඒවා යොදා ගැනීමය''

**(රැල්ෆ් ජීඩිංග්ටන්)**

''යම්කිසි ජන සමාජයකට අයත් ජනයාට පොදු එක්තරා ආකාරය හා එකිනෙකට සම්බන්ධ සිරිත් විරිත් සමූහයෙන් සංස්කෘතිය සමන්විත වේ.''

**(ජෝන් ගිලින්)**

''සංස්කෘතිය නම් සමූහික ජීවිතයේ රාශි භූත නිෂ්පාදනයයි''

**(කිම් බෝල් යංග්)**

මීට අමතරව සෝවියට් උගතුන් සංස්කෘතිය පිළිබඳව අර්ථ නිරූපණ දක්වා ඇත්තේ මෙසේය ''සංස්කෘතිය යනු ඉතිහාසය මුළුල්ලේ සමාජයක් විසින් තනන ලද භෞතික හා ආධ්‍යාත්මික සාරධර්මත් ඒවා පරම්පරාවෙන් පරම්පරාවට යවනු පිණිසත් ඒවා තනා ගැනීම සඳහාත්, ඒවා භාවිත කරනු පිණිසත් ගන්නා මාර්ගයන්ය'' (සරච්චන්ද්‍ර, 1977).

මේ පිළිබඳව තවදුරටත් විමසා බැලීමේදී පැහැදිලි වනුයේ සංස්කෘතිය යනු සමාජයක පවත්නා පොදු සිතුම් පැතුම් හා බාහිර ක්‍රියා පරම්පරාවේ විශේෂ ලක්ෂණ ඇත්නම්, එබඳු ලක්ෂණ සංස්කෘතිය නමින් හැඳින් වේ. එනම්,

- කථා ව්‍යවහාර (භාෂා)
- පරිහරණය කළ (ද්‍රව්‍යාත්මක) දේවල්
- විද්‍යාත්මක බුද්ධිය
- කලා ශිල්ප
- ගෘහ ජීවිතය හා සමාජය
- ආර්ථික ක්‍රමය හා තත්ත්වය
- පාලන ක්‍රමය
- යුද්ධ ක්‍රම හා අවි ආයුධ (විමලවංශ, 2000). මේවා විග්‍රහ කර බැලීමෙන් ඒ ඒ ජන සමාජයන්ට පමණක් ආවේණික වූ විශේෂ ලක්ෂණ දැකගත හැකි ය. ඒ සියල්ලම සංස්කෘතියට අයත් වේ.

**සංස්කෘතියේ ස්වභාවය**

සංස්කෘතිය පුද්ගලයාගෙන් පුද්ගලයාට සම්ප්‍රේෂණය වන අතර එය සමාජය තුළ විවිධ ස්වරූපයෙන් තැන්පත් වී තිබේ. සංස්කෘතිය නිරන්තරයෙන් සමාජය සමග සම්බන්ධ වී පවතින්නකි. සමාජයකින් වියුක්තව සංස්කෘතියක් පැවතිය නොහැකිය. කවර මට්ටමේ සමාජයක වුවද කිසියම් හෝ සංස්කෘතියක් දක්නට ලැබේ. එය පුද්ගලයා සමාජ ජීවියෙකු වශයෙන් ජීවත්වීමේ දී ගොඩනගා ගන්නා චර්යා ධර්ම සමූහයක් වන අතර සමාජයක පැවැත්ම සඳහා අනිවාර්ය ක්‍රියාදාමයක් වේ (ආරියපාල, 1962).

සංස්කෘතිය නිරන්තරයෙන් සමාජය සමඟ මෙන්ම පරිසරය සමඟ ද බැඳී පවතියි. කිසියම් සමාජයක් තුළ සංස්කෘතිය බිහිවන්නේ පරිසර සාධක පදනම් කරගෙනය. එසේම සංස්කෘතිය කිසියම් ජන කොට්ඨාසයකට හෝ ප්‍රදේශයකට ආවේණික හෝ සුවිශේෂී දෙයක් වන හෙයින් පරිබාහිර සමාජවල දී හෝ ප්‍රදේශවලදී එය වලංගු නොවේ. එක් සමාජයක් පිළිගන්නා ලද දෙයක් තවත් සමාජයක් බැහැර කළ හැකිය. එසේම ඒ ඒ පුද්ගලයා හා සමාජ කණ්ඩායම්, ජීවත්වන පරිසරය අනුව සමාන සංස්කෘතික පද්ධතිය තුළ වුවද විෂමතා දක්නට ලැබේ. ශ්‍රී ලාංකික සිංහල සංස්කෘතිය පොදුවේ සමානත්වයක් පෙන්නුම් කළත්, ප්‍රදේශ අනුව ඊට අයත් වන චාරිත්‍ර, වාරිත්‍ර, භාෂාව වැනි සංස්කෘතිකාංගවල වෙනස්කම් දක්නට ලැබේ (අංකුඹුර, 2016).

සංස්කෘතියෙහි ස්වභාවය පිළිබඳව කරුණු දැක්වීමේදී සමාජයක සාමාජික ක්‍රියා සමාජයක් බැඳ තබන දැලක් ලෙස හඳුන්වා ඇත. මඟුල් තුලාවක් වුවත්, කුඹුරේ හේන් වුවත්, ගෙදර දොරේ වුවත්, මෙවැනි සමාජික ක්‍රියාවන් නොකඩවාම එම සමාජයේ වෙසෙන්නන් අතින් සිදු වේ. මෙහිදී සංස්කෘතිය යනු මෙම සාමාජික ක්‍රියාවන්ට පසු පසින් ඇති බලවේගයක් ලෙස දක්වා ඇති අතර එය පහසුවෙන් හඳුනාගෙන විස්තර කළ නොහැකිය (අමුණුගම, 1999).

සංස්කෘතියෙහි ස්වභාවය අධ්‍යයනය කිරීමේදී එහි මූලික ලක්ෂණ කිහිපයක් හඳුනාගෙන ඇත. එනම්,

- සංස්කෘතිය ජන්මයෙන් නොව පුරුද්දෙන් ලැබූ දෙයකි.
- සංස්කෘතිය ආයාසයෙන් ප්‍රගුණ කෙරෙන්නෙකි.
- සංස්කෘතිය සාමාජික ආකල්පයකි.
- සංස්කෘතිය විවිධ සංකල්ප (අදහස්) පදනම් කර ගත්තකි.
- සංස්කෘතිය ආත්ම තෘප්තිය දනවන්නකි.
- සංස්කෘතිය ඔරොත්තු දෙන සුළුය.
- සංස්කෘතිය ඒකාබද්ධ කරන්නකි (සරච්චන්ද්‍ර, 1977). මෙයට අනුව පැහැදිලි වනුයේ දියුණු නොදියුණු සෑම මිනිසෙකුටම සංස්කෘතියක් ඇති බවයි. තනි පුද්ගලයකු වශයෙන් නොව සමාජයක් වශයෙන් මිනිසා ජීවත්වීමට හුරු පුරුදු වූ දිනයේ සිටම ඔහු වටා සංස්කෘතියක් ද ගොඩනැගේ. සමාජයේ ජීවත්වන පුද්ගලයාට එම සමාජයෙන් හිමිවන දායාදය නැතහොත් උරුමය සංස්කෘතියයි. මේ අනුව පැහැදිලි වන කරුණක් වනුයේ සංස්කෘතිය

පිළිබඳව අධ්‍යයනය කිරීමේදී යම් ප්‍රදේශයකට නැතිනම් සමාජ කණ්ඩායමකට අයත් සංස්කෘතීන් නැතිනම් උප සංස්කෘතීන් අධ්‍යයනය කිරීම වඩාත් සාර්ථක බවයි.

සමාජ විද්‍යානුකූලව බැලූ කල සංස්කෘතියෙහි ප්‍රභේද දෙකකි. එනම්,

- භෞතික සංස්කෘතිය
- අභෞතික සංස්කෘතිය

භෞතික සංස්කෘතිය යටතට ගැනෙනුයේ මිනිසා විසින් නිපදවා ගත් හෝ නිර්මාණය කරන ලද දේවල්ය. එනම් වැව්, දා ගැබ්, ප්‍රතිමා, ගොඩනැගිලි, කලා නිර්මාණ, භූගෝලීය පිහිටීම, මෙන්ම පාරිසරික උරුමයන් මේ යටතට ගැනේ. අභෞතික සංස්කෘතිය යටතට ගැනෙනුයේ මානව කණ්ඩායම් විසින් චිරාත් කාලයක් තිස්සේ පවත්වා ගෙන ආ විවිධ අදහස්, උදහස්, සිතුම් පැතුම්, ඇදහිලි විශ්වාස, සිරිත් විරිත්, දැනුම හා හැකියාවන්ය (අංකුඹුර, 2016).

**අස්පර්ශ්‍ය සංස්කෘතිය**

සමාජ හා මානව විද්‍යාවට අනුව කිසියම් නිශ්චිත සමාජයක පොදු ජනතාවගේ සමාජ උරුමය ලෙස පොදුවේ සංස්කෘති හඳුන්වන අතර ජනතාවගේ සමාජ විඥානය වශයෙන් අස්පර්ශ්‍ය සංස්කෘතිය හඳුන්වනු ලැබේ (විජේසේකර, 1995). එය මානවයාගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා හා වුවමනා පදනම් කරගෙන බිහි වූ අදහස්, ආකල්ප, දෘෂ්ටි කෝණ, විශ්වාස, සංකල්ප න්‍යාය හා නිශ්චය යනාදි සියල්ලෙහිම එකතුවකි.

2003 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද යුනෙස්කෝ සංස්කෘතික ප්‍රඥප්තියට අනුව අස්පර්ශ්‍ය සංස්කෘතිය යනුවෙන් හඳුන්වා ඇත්තේ ''කිසියම් පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් හෝ සමාජයක් විසින් සිය සංස්කෘතික උරුමයේ කොටසක් වශයෙන් පවත්වාගෙන එනු ලබන ව්‍යවහාරයන්, නිරූපණයන්, ප්‍රකාශනයන්, දැනුම හා කුසලතා ඇතුළු සමස්තය'' වශයෙනි. එයට කිසියම් සමාජයක පවත්නා සමාජ චර්යයා, වත්පිළිවෙත්, උත්සව අවස්ථා, දැනුම හා හුරුපුරුදු, ආකල්ප, ඇදහිලි හා විශ්වාස, භාෂාව, සාහිත්‍යය, කලාව, පාරම්පරික ශිල්ප සහ කර්මාන්ත යන අංග ඇතුළත් වේ (ඔහී්කඩ ෂබඡ්බටසඉකැ ඣකඑමර්ක ,ැරසඡ්ටැල 2003*ග

දකුණු කොරියාවේ සංස්කෘතික උරුමය පිළිබඳ ජාතික පර්යේෂණ ආයතනය (හ්එසදබ්ක ඍැ්ප්රජය ෂබ්එසඑමඑැ දෙ ක්මකඑමර්ක ාැරසජ්ටැ-හසෂකා* විසින් අශ්පර්ශ්‍ය සංස්කෘතිය වශයෙන් හඳුන්වා ඇත්තේ ''සංගීතය, නර්තනය, නාට්‍ය කලාව, ක්‍රීඩා, උත්සව, සටන් කලා සහ ආශ්‍රිත වෙනත් කලාවන්, ශිල්පීය කර්මාන්ත, ආහාර, නිෂ්පාදන තාක්‍ෂණය හා ඓතිහාසික තොරතුරු, අධ්‍යාපනික හා කලාත්මක වටිනාකමක් සහිත දේශීයත්වය නිරූපණය කරන මානව ක්‍රියාකරකමක් හා වෙනත් දෛනික කටයුතු'' යනාදියයි.

මේ අනුව අස්පර්ශ්‍ය සංස්කෘතිය යනු සංස්කාතියේ ස්පර්ශ කළ නොහැකි, භෞතිකව හඳුනාගත නොහැකි අංශයයි. එනම් සමාජයේ පුද්ගලයන් විසින් කරන ලද නිර්මාණ හෝ සාදන ලද වස්තූන් නොව ඒවාට පාදක වූ දැනුම, ආකල්ප හා කුසලතා යනාදියයි. යම් සමාජයක පුද්ගල කණ්ඩායමක් සතු දැනුම, කුසලතා, ආකල්ප නිර්මාණශීලීත්වය, ආචාර ධර්ම, සිරිත් විරිත්, ඇවතුම් පැවතුම්, රුචි අරුචිකම්, ඇදහිලි හා විශ්වාස, තාක්‍ෂණය, ශිල්ප ක්‍රම, භාෂාව, කලාව සහ සාහිත්‍යය යන අංශ සියල්ල එක්ව ගත් කළ එකී සමාජයට හෝ පුද්ගල කණ්ඩායමට අයත් අස්පර්ශ්‍ය සංස්කෘතිය හඳුනාගත හැකිය.

පුද්ගලයාගේ හා සමාජයේ උරුමයක් වශයෙන් පැවත එන අස්පර්ශ්‍ය සංස්කෘතිය මිනිසා සමාජය සහ පරිසරය සමඟ දක්වන ප්‍රතිචාර, සොබා දහම හා පවතින අන්තර් සබඳතාවය සහ ඔවුන්ගේ ඉතිහාසය යන සාධක ඔස්සේ නිරන්තරයෙන් ප්‍රතිනිර්මාණය වෙමින් වතී. මේ මඟින් මිනිසාට සිය ගෝත්‍රය සම්බන්ධ අනන්‍යතාව සංජානනය කරන අතර ම සංස්කෘතික විවිධත්වය හා මානව නිර්මාණශීලීත්වය සඳහා පවතින ගරුත්වය අභිවර්ධනය කිරීමක් ද සිදු කරයි (එසහ්ජ්ල 2012*.

අස්පර්ශ්‍ය සංස්කෘතිය මිනිසාගේ සිතුම් පැතුම්, අදහස් උදහස් සහ විශ්වාස ආදිය මත පැවත එන්නකි. එමෙන් ම ලිඛිතව හෝ විධිමත් ලෙස වාර්තාගතව නොමැති අතර ම සම්ප්‍රදායක් ලෙස පාරම්පරිකව පැවත එයි. කිසියම් සමාජයක තත්කාලීන අවශ්‍යතා, සිතුම් පැතුම්, රුචි අරුචිකම්, හැකියාවන් සහ ආකල්ප යනාදිය නිරූපණය කරනු ලබන්නේ අස්පර්ශ්‍ය සංස්කෘතිය තුළිනි.

**අස්පර්ශ්‍ය සංස්කෘතිය උරුමය**

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය යන සංකල්පය ලෝකයේ බිහිවන්නේ යුනෙස්කෝව මැදිහත් වීමත් සමග 1989 න් පසුවය. ඊට පෙර මෙම සංකල්පය වෙනත් ආකාරයකින් ද ඉදිරිපත් වී තිබේ. 1950 ගණන්වල ජපානයේ සංස්කෘතික උරුමය සුරැකීම සඳහා නීති සම්පාදනය කර ඇත (Miyata, 2012). 1950 අගෝස්තු 29 වන දින අංක 276 දරණ කැබිනට් පනත මඟින් ජපානය සංස්කාතික දේපල ආරක්ෂා කිරීමේ නීතිය (Law for the Protection of Cultural Properties) සම්මත කර ගත් අතර එහිදී සංස්කෘතික දේපළ අතරට අස්පර්ශ සංස්කෘතිය ද ඇතුළත් කර තිබුණි. මෙයට අනුව පැහැදිලි වනුයේ ජපානය වැනි රටවල් 20 වන සියවසේ මැද භාගයේ පටන්ම සංස්කෘතිය සුරැකීමට කටයුතු කිරීමේදී අස්පර්ශ්‍ය සංස්කෘතිය කෙරෙහි ද අවධානය යොමුකර ඇති බවය.

ලෝකයේ ප්‍රමුඛපෙළේ සංවිධානයක් වන යුනෙස්කෝ (UNESCO) සංවිධානය මඟින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය අධ්‍යනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර ඇත. යුනෙස්කෝ සංස්කෘතික කටයුතු පිළිබඳ මණ්ඩලය වර්ෂ 1990 සිට ''ලෝකයේ මතකය සුරැකීම'' යනුවෙන් ආරම්භ කළ ව්‍යාපෘතිය මඟින් ලෝකයේ විවිධ රටවල පවතින අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය එක්රැස්කර සංරක්ෂණය කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. 2003 වර්ෂයේදී යුනෙස්කෝ සංවිධානයේ වාර්ෂික සමුළුවේදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රඥප්තියක් සම්මත කරගන්නා ලදී (UNESCO Intangible Cultural Heritage, 2003). අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සම්බන්ධයෙන් දැනට ප්‍රකාශයට පත් වී ඇති වැදත්ම ලියවිල්ල වශයෙන් මෙය හැඳින්විය හැකිය. මෙය ප්‍රකාශයට පත්කිරීමේ මූලික අරමුණ වී ඇත්තේ,

- අස්පර්ශ්‍ය සංස්කෘතිය අර්ථ දැක්වීම
- අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සම්බන්ධයෙන් පුද්ගලයන්, පුද්ගල කණ්ඩායම් හා සමාජ කොටස් සතු වගකීම් හඳුනා ගැනීම.
- ප්‍රාදේශීය ජාතික හා අන්තර් ජාතික වශයෙන් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.

ඒ අනුව මෙම ප්‍රඥප්තිය මගින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය අර්ථ දක්වා ඇත්තේ ''ප්‍රජාවන් කණ්ඩායමක් හෝ පුද්ගලයන් තමන්ගේ සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස හඳුනාගන්නා ක්‍රියාකාරකම් නියෝජනයන් ප්‍රකාශනයන් දැනුම හා කුසලතා මෙන්ම උපකරණ, භාණ්ඩ කෞතුක භාණ්ඩ හා ඒ හා සම්බන්ධ වූ සංස්කෘතික ප්‍රදේශ හෝ කලාප'' වශයෙනි. මෙහි අස්පර්ශ්‍ය සංස්කෘතියට උරුමයට අයත් අංග ලෙස විග්‍රහ කර ඇත්තේ,

- සමාජ චර්යා වත් පිළිවෙත් හා උත්සව අවස්ථා
- ස්වභාව ධර්මය හා විශ්වය සම්බන්ධයෙන් වන දැනුම හා හුරුපුරුදු
- භාෂාව ඇතුළු වාචික සම්ප්‍රදායන් හා ප්‍රකාශයන්
- ප්‍රසංගික කලා
- පාරම්පරික ශිල්පය

යුනෙස්කෝව සහ ජපාන සංස්කෘතික නියෝජිතායතනය එක්ව The safeguarding of Tangible and Intangible cultural Heritage: Towards and Integrated Approach යන මැයෙන් සංවිධානය කරන ලද සමුළුවේදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය පිළිබඳ කර ඇති අර්ථකථන විමසීමේ දී අස්පර්ශ්‍ය සංස්කාතික උරුමය සිව්වැදෑරුම් ලෙස විග්‍රහ කර ඇත. එනම්,

1. සම්ප්‍රදායික, නූතන හා සජීවී ලෙස පවත්නා දෙයකි (Traditional, contemporary and living at the same time)
2. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය අතීතයෙන් උරුම වූ සම්ප්‍රදායක් ලෙස නූතනය දක්වා පැවත එන්නක් පමණක් නොව විවිධ සමාජ හා සංස්කෘතික කණ්ඩායම් විසින් නිරන්තරයෙන් බිහි කරන්නක් වන බව මෙහිදී විග්‍රහ කර තිබේ.
3. පුද්ගලයන් තුල අන්තර්ගත වූවකි (Inclusive)
4. පුද්ගලයන් වෙනත් පුද්ගලයන් හා සමාජ කණ්ඩායම් සමඟ සංස්කෘතිය නිරන්තරයෙන් හුවමාරු කර ගනී. එසේ සබඳකම් පවත්වන පුද්ගල හා සමාජ කණ්ඩායම් තම අසල්වාසීන් මෙන්ම ලොව කොතනක හෝ සිටින්නන් වීමට ද ඉඩ ඇත. මෙහිදී ඔවුන් සිය පරිසරයට අනුකූලතාවයක් දක්වන අතර

සංස්කෘතික අනන්‍යතාවය ද අතීතයේ සිට වර්තමානය ඔස්සේ අනාගතය දක්වාම සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි.

5. සමාජය නිරූපණය කරන්නකි (Representative)
6. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ වටිනාකම රඳාපවතින්නේ සමාජය තුළ එහි භාවිතය, පරම්පරාවෙන් පරම්පරාවට විකාශනය වීම සහ සමාජයේ පවත්නා සම්ප්‍රදායන්, කුසලතා හා චාරිත්‍ර වාරිත්‍ර අනුවය.
7. සමාජය මත පදනම් වූවකි (Community based)
8. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හඳුනාගත හැකි වන්නේ ද එය නිර්මාණය කරන, පවත්වාගෙන යන හා සම්ප්‍රේෂණය කරනු ලබන සමාජය අනුවය. අදාළ සමාජය තුළ පිළිගැනීමකින් තොරව අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය පිළිගැනීමකට ලක් නොවේ. එසේ ම අදාළ සමාජයේ පොදු පිළිගැනීමකින් තොරව කිසියම් සංස්කෘතිකාංගයක් එම සමාජයේ උරුමයක ලෙස පිළිගත නොහැක.

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය යන සංකල්පය විග්‍රහ කිරීමත්, උරුමය කළමනාකරණයේදී මුහුණපාන ගැටලු පිළිබඳව පොදුවේ සාකච්ඡා කිරීම මෙම සමුළුවේ අරමුණ විය. මෙහිදී සංස්කෘතික උරුමයේ ස්පර්ශ්‍ය හා අස්පර්ශ්‍ය යන දෙපාර්ශවය පිළිබඳව සාකච්ඡා කර ඇති අතර අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හැදෑරීම හා ආරක්ෂා කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු වී තිබේ (UNESCO, 2004)'

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය යන සංකල්පය ශ්‍රී ලංකාවේ මෙතෙක් ප්‍රචලිත නොවූවද මෙම උරුමය ජනශ්‍රැතිය, දේශීය දැනුම ඃඡබාසටැබදමී ණබදැකැාටැ* වැනි වෙනත් නම් වලින් පරම්පරාගතව ආරක්ෂා වී වර්තමානය දක්වා පැමිණ ඇත. ශ්‍රී ලංකාවේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයට අයත් සමහර අංග දැනටමත් නැති වී යාමේ අවදානමකට ලක්ව ඇත. අස්පර්ශනීය සංස්කෘතික උරුමය යනු අපගේ මුතුන්මිත්තන්ගෙන් දීර්ඝ කාලයක් තිස්සේ උරුම වී පැවතගෙන ආ ස්පර්ශ කළ නොහැකි සංස්කෘතික සම්ප්‍රදායන්ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමයට වාචික සම්ප්‍රදාය, රංග කලාවන්, සමාජ සිරිත් විරිත්, පුද පූජා, ජනශ්‍රැතිය, සංස්කෘතික උත්සව, දැනුම, හැකියාවන්, විශ්වාස, සාම්ප්‍රදායික ශිල්ප ආදිය අයත් වේ. මෙම අංග ස්පර්ශ කළ නොහැකි වුව ද ඒවා අපේ සංස්කෘතික උරුමයේ වැදගත් අංග වේ.

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සෑම රටකම පවතින අතර ඒවා ඒ ඒ රටවලට අනන්‍ය වේ. මෙම උරුමය නවීකරණයත් සමඟ වෙනස්වීම් වලට භාජනය වන අතර මෙය ජනතාව අතරම පවතිමින් ජනතාව විසින්ම ඉදිරියට ගෙන යනු ලබයි. අස්පර්ශනීය සංස්කෘතික උරුමය බොහෝ විට පරිසරය හා බැදී පවතී. මෙය සාමූහිකත්වය හා බැඳී පවතින බැවින් ප්‍රජාව අතර අන්‍යෝන්‍ය හා සමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරීමට ද ඉවහල් වේ (අමරසිරි, 2014). ශ්‍රී ලංකාව අස්පර්ශනීය සංස්කෘතික උරුමය අතින් ඉතා සාරවත් රටකි. ශ්‍රී ලාංකීය සමාජයේ ඇදහිලි විශ්වාස, පුද පූජා, සිරිත් විරිත්, ශාන්ති කර්ම, යන්ත්‍ර මන්ත්‍ර, ජන කවි. ජන ගී, ජන කතා, ජන නාට්‍ය, ආගමික පුද පූජාවන්, වන්දනා, පෙරහැර යනාදී සංස්කෘතික අංග අතිවිශාල ප්‍රමාණයක් පවතින අතර මේ සියල්ල අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් වේ. මීට අමතරව සිංහල අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් හා චාරිත්‍ර හා ශාරීරික රෝග සුව කිරීමට අදාළ වූ දේශීය වෙදකම ද මානසික සුවය ඇති කිරීමට අදාළ ශාන්ති කර්ම යටතට ගැනේන තොවිල්ල සෙත් කවි, දෙහි කැපීම්, නූල් බැඳීම්, යන්ත්‍ර දැමීම් ආදීය ද මීට ඇතුළත්ය. මෙහි දී විශේෂයෙන් අවධානය යොමු කරනු ලබන්නේ ශාරීරික රෝග සුව කිරීමට අදාළ වූ දේශීය වෙදකම පිළිබඳවය.

## ශ්‍රී ලංකාවේ දේශීය වෙදකම (Sri Lankan Indigenous Medicine)

ශ්‍රී ලංකාවේ ශතවර්ෂ ගණනක් තිස්සේ පැවත එන දේශීය වෙදකම සම්පූර්ණයෙන්ම පදනම් වන්නේ දේශීය දැනුම මතය. දේශීය දැනුම යනු පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන තාක්ෂණය හා අත්දැකීම් මත පදනම් වූ ප්‍රායෝගික සාමාන්‍ය දැනීම වේ.  දිවයිනේ විදග්ධ සාහිත්‍යයේ දේශිය දැනුම ගැන එතරම් සඳහන් නොවුණ ද සමාජයේ සාමාන්‍ය ජන කොටස් විසින් නිෂ්පාදිත දැනුම විදග්දයන්ගේ සම්භාවනාවට ලක් වූ බවක් නොපෙනේ. පොදුවේ එම දැනුම ''ග්‍රාම්‍ය '' දැනුමක් සේ සැලකිණි. '' ග්‍රාම්‍ය ''යන සකු පදය අශිෂ්ට, පිටිසර, අවිදග්ධ යන අරුත් සහිත වූවකි. එහෙයින්, ග්‍රාම්‍ය දැනුම යනු නූගත්, පිටිසරයන්ගේ දැනුමයි (Ranasinghe, 2006).

ශ්‍රී ලංකාව තුළ දේශිය දැනුම යනු මානව පද්ධතියේ දැනුමයි. ශ්‍රී ලංකාව තුළ දේශිය දැනුම ගැබ්ව ඇති මුලික ශිල්ප ක්‍රමයක් වන්නේ,

- කෘෂි කර්මාන්තය

- කලාව හා අත්කම්
- නිවාස
- වාරිමාර්ග
- වෛද්‍ය විද්‍යාව
- ජනකලාව
- වනාන්තර ආදියයි.

මෙම විෂය පථයන් යටතේද විවිධ විෂය පරාසන් ගණනාවක් පවතියි. එනම්

- කෘෂි කර්මාන්තය - වී වගාව, ගෙවතු වගාව, වැසි ජලය හා වාරි කෘෂි කර්මාන්තය, හේන් වගාව, සත්ව පාලන, ධීවර, අස්වැන්න නෙළීම.
- කලාව හා අත්කම් - යකඩ හා වානේ නිෂ්පාදනය, කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා ගෘහස්ත උපකරණ, ආයුධ, මැටි භාණ්ඩ, රෙදි විවීම, වඩු කර්මාන්තය, පින්තාරු කිරිම, මූර්ති.
- ආහාර හා පෝෂණය - පසු අස්වනු නෙලිමේ ක්‍රමය, ආහාර සංරක්ෂණය, ආහාර පුරුදු, ආහාර පිසීම.
- නිවාස - ජනතාවගේ නිවාස හා ආගමික ස්ථාන.
- වාරිමාර්ග - වැසි ජලය එකතු කිරිමේ ක්‍රමවේදය, වැව් නිර්මාණය, ඇල මාර්ග හා ජල මාර්ග, ජල කළමණාකරණය, පානීය ජලය හා ගෘහස්ත ජල කළමණාකරණය.
- වෛද්‍ය විද්‍යාව - මිනිසුන් සඳහා වු වෛද්‍යක්‍රම, සතුන් සඳහා වු වෛද්‍ය ක්‍රම, බොහෙත් ද්‍රව්‍ය, බෙහෙත් නිෂ්පාදනය, රෝග හඳුනාගැනීම, ජෝතිෂ්‍ය.
- ජන කලා - ජන ගී, ජන කතා, ඓතිහාසික සිද්ධීන්, ඇදහිලි හා විශ්වාස, සිරිත් විරිත්.
- වනාන්තර - වන සංරක්ෂණය, කළමණාකරණය වනාන්තර හා වෙනත් ස්වභාවික සම්පත් භාවිතය ආදියයි (Ranasinghe, 2008).

දියුණු ශිෂටාචාරයක් සහිතව අප රට ගොඩ නැගුණේ ඈත අතීතයේ සිටය. අද දියුණුවේ ඉහලම ස්ථානයට පැමිණ සිටින අපරදිග ජනයා ම්ලේච්ඡව ජීවත් වූ යුගයක ලක්වැසියා කෘෂිකර්මාන්තය හා වාරිකර්මාන්තය පදනම් කරගත් දියුණු

ආර්ථිකයකින් ද, බුදුදහමින් ඔප්නැගුණු සදාචාර සම්පන්න ගුණවගාවකින්ද, කලා ශිල්පාදියෙන් පිළිඹිබු වන සියුම් රස වින්දනයකින් ද පොහොසත්ව සිටියහ. පාරම්පරික දැනුමෙන් පෝෂණය වී අනාදිමත් කාලයක

සිට පැවත එන ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළින් බිහි වූ නිර්මාණයන් අදටත් විශ්මජනකය. නවීන විද්‍යාවේ මානයන්ට හසු නොවෙමින් වර්තමාන තාක්ෂණය අභිබවා යන මෙම නිර්මාණයන්ගේ පදනම වන්නේ පාරම්පරික දැනුමයි. සාමාන්‍ය ජන ජීවිතයේ ජීවනාලිය වූ කෘෂිකර්මාන්තයේ සිට අති සූක්ෂම දේශීය වෛද්‍ය ක්‍රම දක්වාම ගැබ්ව ඇත්තේ ද මෙම පාරම්පරික දැනුමයි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ ද මෙරට මිනිසා ආයුධ හා උපකරණ භාවිත කර ඇති බවට පුරා විද්‍යා කැණීම්වලින් සොයා ගෙන තිබේ. කාබන් කාලනිර්ණයන් අනුව දිවයිනේ මෙතෙක් හමුවී ඇති පැරණිතම ජ්‍යාමිතික ක්ෂුද්‍ර ගල් මෙවලම්වල ඉතිහාසය වසර 28000 පමණ කාලයකට ද ජ්‍යාමිතික නොවන ගල් මෙවලම් වල ඉතිහාසය වසර 125,000 පමණ කාලයකට ද අයත් බව තහවුරු කර තිබෙන අතර බටහිර ජාතීන්ට වඩා බොහෝ සෙයින් පැරණි වූත්, දියුණු වූත් දැනුමක් ශ්‍රී ලාංකිකයා සතුව පැවති බව පුරා විද්‍යා සාධක අනුව තහවුරු කර ඇත (කංකානම්ගේ, 2006). මෙවැනි මෙවලම් නිෂ්පාදනය සහ භාවිතය සඳහා ඔහුන්ට සිය දැනුම හා

අත්දැකීම් උපකාරී වන්නට ඇති අතර මෙය අපේ සම්ප්‍රදායික දැනුමේ මූලාරම්භය ද වේ (වාදසිංහ, 2015).

පුරා විද්‍යාත්මක සාධක අනුව විජය රජුගේ ලංකාවතරණයට පෙර සිටම ලංකාවාසීන් දැනුමින් යුත් පිරිසක් වූහ. විජය රජු ඇතුලු පිරිස ලක්දිවට ගොඩබට අවස්ථාවේ කුවේණිය කපු කටිමින් සිටි බව පැවසේ. ඒ අනුව එකළ සමාජය තුළ පේෂ කර්මාන්තය පිළිබඳ දැනුමක් පැවති බව විශ්වාස කළ හැකිය. විජයාවගමනය සිදු වන අවස්ථාවේදී යක්ෂ, නාග හා දේව යනුවෙන් ජනකොටස් ත්‍රිත්වයක් මෙරට වාසය කර ඇති අතර ඔහුන්ටම ආවේණික දැනුම් සමුදායක් තිබී ඇත.

ආර්යයන් විසින් ඉන්දියාවේ දැනුම් පද්ධතීන් මෙරට ස්ථාපිත කිරීමත්, ජනාවාස ආරම්භ කිරීමත් සමඟ ආදිවාසී ජනතාව එම ප්‍රදේශ වලින් දුෂ්කර ප්‍රදේශවලට සංක්‍රමණය වූ බවට සාක්ෂි තිබේ. ආර්යයන් මෙරටට ගෙන ආ දැනුම දේශීය ජන කොටස් විසින් නිෂ්පාදිත දේශීය දැනුමේ සමහර කොටස් සමඟ මිශ්‍ර වූ බව පිළිගත

හැක. පසු කාලීනව ආර්යයන් තව දුරටත් ප්‍රතිග්‍රහිත දැනුම් සම්භාරයක් ඉන්දියාවෙන් මෙරටට රැගෙන ආ බව පෙනේ. ආගම්, කලා ශිල්ප ආදිය නිදසුන් ය (රණසිංහ, 2006).

බුදුන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමත් සමග ගස්වැල්, ජලය, අන්ධකාරය, ආලෝකය, ඉර හඳ වැනි ස්වභාවධර්මයේ වස්තූන්ට පමණක් සීමා වූ දේශීය ඥානය බෞද්ධ දර්ශනයට අනුකූලව නිර්මාණය විය. ඒ අනුව පසු කාලයේදී දේශීය ඥානය යනු අනෙකක් නොව සරලබව, කරුණාව, මෛත්‍රිය හා ඉවසීම වැනි බෞද්ධ සිතුම් පැතුම් බවට පත් විය (මැදවැව, 1998). එය තව දුරටත් වර්ධනය වීම සිදු වූයේ මහින්දාගමනයත් සමග ය. සඟමිත් තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමග මෙරටට ආ රැගෙන ආ දහඅටක් වූ කුලශ්‍රේණි ක්ෂේත්‍ර දහඅටක් සම්බන්ධව පාරම්පරික දැනුමක් රැගෙන විත් මෙරට ස්ථාපිත කරනු ලැබීය.මේ අනුව බුදුදහමේ බලපෑම හේතුවෙන් විශිෂ්ට තාක්ෂණික ඥානයක් ශ්‍රී ලංකාවට හිමි විය. මේ අනුව දේශීය දැනුම ශ්‍රී ලංකාව තුළ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ දැකගත හැකිය. මේ අතුරින් දේශීය වෙදකමට ඉතාමත් වැදගත් ස්ථානයක් හිමි වේ.

ශ්‍රී ලංකාවේ දේශීය වෙදකම සම්බන්ධයෙන් ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇත. අනුරාධපුර යුගයේදී ලොව ප්‍රථම වරට රෝගීන් වෙනුවෙන් කැපවුණු ආරෝග්‍යශාලා පද්ධතියක් මිහින්තලා කඳු මුදුනේ ඉදිවූයේ ද වසර තුන් දසහසකට පමණ කලක සිට පරපුරෙන් පරපුරට පැවත එන වට්ටෝරු ක්‍රම පාදක කරගත් මෙම පාරම්පරික දේශීය වෙදකම හේතුවෙනි. අතීතයේ දී රාජ්‍ය පාලකයින් දේශීය වෙදකම සම්බන්ධයෙන් උනන්දු වූ බව මූලාශ්‍ර ගත තොරතුරු වලින් ද පැහැදිලිවේ. බුද්ධ දාස රජතුමා රෝගීන් හා සතුන් සඳහා වෙදකම් කළ බවත් සෑම ගමක් පාසාම වෙදහල් සාදා ඒවායෙහි සේවයට වෙදුන් යෙදවූ බව සඳහන් වේ (සුමංගල සහ බටුවන්තුඩාවේ, 1996). මීට අමතරව සෞඛ්‍යය දියුණු කිරීම සඳහා කටයුතු කළ බව ශිලා ලේඛන මූලාශ්‍ර වල ද සඳහන් වේ. දේශීය වෙදකම සම්බන්ධයෙන් වන ප්‍රසිද්ධ ආයතන, ආරෝග්‍යශාලාවන් ගැන මෙන්ම එම ස්ථාන වලට දෙන දීමනාවන් හා ඒවායේ භුක්තිය පිළිබඳව 10 වෙනි ශතවර්ෂයට අයත් සෙල්ලිපිවල දක්නට ලැබේ. "වෙදහල්" මෙන්ම "මහවෙද්නා" ආදී වචන වලින් පැහැදිළි වන්නේ අතීතයේ දී දේශිය වෙදකම ඉතාමත් දියුණු තත්වයක පැවති බවය. ශ්‍රී ලංකාවේ දේශීය වෙදකමට උතුරු හා දකුණු ඉන්දියානු බලපෑම් ලැබී ඇත. වසර දහස් ගණනක් තිස්සේ පැවත එන මෙම දේශීය වෙදකම විවිධ සංස්කෘතික ඇගයීම් හා ධර්මතා වලින් පෝෂණය වී ඇත.

දේශීය වෙදකම සමහර අවස්ථාවල දී ගොඩ වෙදකම ලෙස ද හඳුන්වා ඇත. සිංහලේ සඳහන් වන '' ගොඩයා '' යන පදය ද නුගත් ගැමියා යන අරුත් සහිත වූවකි. අද පවා දේශීය වෙදකම පරිහාසයට ලක් කිරීම සඳහා '' ගොඩ වෙදා '' ''ගොඩ වෙදකම '' යන පද යෙදුම් වශයෙන් භාවිත කරනු පෙනේ. එසේම ගෙදර දොරේදී වෙදකම් සඳහා භාවිත කරන ද්‍රව්‍ය අත් බෙහෙත් යනුවෙන් හඳුන්වනු ලබයි. අත් බෙහෙත් යනුවෙන් හඳුන්වනු ලබන්නේ කිසිම වෘත්තීය උපදෙසක් නොමැතිව පහසුවෙන් සකස් කර ගත හැකි බෙහෙත් වලට වේ. මෙම දේශීය වෙදකම පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන තාක්ෂණයෙන් හා අත්දැකීම් මත පදනම් වූ ප්‍රායෝගික සාමාන්‍ය දැනුමකි. මෙම අදාළ දැනුම සංස්කෘතිය තුළ ජීවත්වන ජනතාවගෙන් වෙන් කළ නොහැකිය.

අතීත සමාජයේ ජීවත් වූ මිනිසුන්ගේ සියලුම ලෙඩ රෝග සඳහා ප්‍රතිකාර කරන ලද්දේ දේශීය වෛද්‍ය ක්‍රමය මඟිනි. මේ සඳහා උපකාරී වූයේ ශ්‍රී ලංකාවේ වනාන්තර ඇතුලු ස්වභාවික පරිසරය වේ. පරිසරයෙන් එකතු කර ගන්නා ඖෂධ මඟින් අතුරු ආබාධ වලින් තොරව රෝගියෙකු, නිරෝගී පුද්ගලයෙකු බවට පත් කිරීමේ හැකියාව දේශීය ඖෂධ සතු විය (අබේවර්ධන සහ යාපා 2011). හිත හා සුඛ ආයුෂය වින්දනය කිරීමටත්, අහිත හා දුක්ඛ ආයුෂ අත්හැරීමටත් මූලික මාර්ගගෝපදේශ සපයන දේශීය වෛද්‍ය ක්‍රමය ස්වභාවධර්මය හා සත්ත්වයා අතර පවත්නා අභේදනීය ආශ්චර්යාත්මක සම්බන්ධතාව ප්‍රදර්ශනය කරවන්නකි. ශ්‍රී ලංකා දේශයේ පෞරාණිකව මුඛ පරම්පරාගතව පැවති දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පශ්චාත් කාලීනව පුස්කොළ පොත්වල බහා සංරක්ෂණය කරන්නට විද්වත් වෛද්‍යාචාර්යවරු සමත් වූහ. දේශීය අනන්‍යතාවයක් සහිතව දිවයින පුරා ව්‍යාප්තව පැවති දේශීය වෙදකම සමස්ත ප්‍රජාව අතර බටහිර වෛද්‍ය ක්‍රමයටත් වඩා ගෞරවණීයත්වයට පාත්‍ර වෙමින් ජනප්‍රිය වූයේ එලදායී ප්‍රතිකාර විධීන්ගේ ප්‍රාතිහාර්යයෙනි. මෙහිදී මිනිස් හිසෙහි සිට දෙපතුළ දක්වා වූ රෝගයන් සඳහා මෙන්ම ඒ සඳහා වන ප්‍රතිකාර, ඖෂධ වට්ටෝරු ආදිය පිළිබඳ හසල දැනුමක් ඔවුන් සතු විය.

ඒ සඳහා විවිධ පිළියම් වශයෙන් නස්න කිරීම්, බෙහෙත් තෙල් ඇඟ ගෑම, තැවීම, පොල් පලා, ගොටු කොළ ආදී ඖෂධ බහා පිසින ලද බෙහෙත් කැඳ දීම, තෙල් වර්ග බොන්නට දීම, බාහිර පාවිච්චිය සඳහා පලා බෙහෙත් හා කල්ක ලබාදීම සිදු කළ බව සඳහන්වේ (ධර්මකීර්ති, 1997). ශාරිරික හා මානසික සුවය මත නොව ඒ හා සමගාමීව අධ්‍යාත්මික සුවතාව ද වර්ධනය කිරීමේ අභිලාෂය උදෙසා රෝග වළක්වා ගැනීම,

රෝග වලට ප්‍රතිකර්ම හා සුව කිරීම වැනි දේ දේශීය වෙදකම මඟින් ඉටු කිරීමට දේශීය වෛද්‍යවරු කටයුතු කර ඇත. දේශීය වෙදකම හා බැඳුණ ඇදහිලි හා විශ්වාස මෙන්ම අභිචාර විධි (යන්ත්‍ර මන්ත්‍ර) මිනිසාට වැළඳුනු රෝග සුව කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත. මෙහි දී ඖෂධී බලය ශරීරයට කාවැද්දීම සඳහා මෙම අභිචාර විධි යොදා ගන්නට ඇත. මෙසේ ගැමි සමාජය තුළින් බිහි වූ දේශීය වෙදකම උපයෝගි කරගෙන සියළු සර්වාංග රෝග සඳහා ප්‍රතිකර්ම සිදු කර ඇති බව පැහැදිළි වේ.

**සමාලෝචනය**

වර්තමානය සමාජයේ ජීවත් වන බොහෝ දෙනා මේ වන විට යොමු වී ඇත්තේ බටහිර වෛද්‍ය විද්‍යාව දෙසට වන අතර දේශිය වෙදකමට එතරම් වැදගත්කමක් හිමි නොවේ. ලේඛනගත තොරතුරු වලට අනුව දේශිය වෙදකම පිළිබඳ අපට ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇති බව පැහැදිළිය. වර්තමානයේ සුව කළ නොහැකි රෝග සඳහා අතීතයේදී ප්‍රතිකාර කර ඇති බව මෙම ලේඛන වලට අනුව පැහැදිලිවේ. මෙවැනි වටිනාකමක් ඇති දේශිය වෙදකම වර්තමාන සමාජය තුළින් ගිලිහෙමින් පවතින නිසා එය සංරක්ෂණය කර රැකගත යුතු උරුමයක්ය යන්න පිළිබඳව වර්තමාන සමාජය දැනුවත් කිරීම සිදුකළ යුතුය.

## විමර්ශන

අංකුඹුර, එම්. (2016). ශ්‍රී ලංකේය අස්පර්ශ සංස්කෘතික උරුමයඃ ගාඩි ජන සමාජය ඇසුරෙනි. කර්තෘ ප්‍රකාශනයකි.

අබේවර්ධන, වයි. සහ යාපා ඒ. එන්. (2011). ශ්‍රී ලංකාවේ දේශීය දැනුම සමග බැඳි මිත්‍යාමත. සරසවි ලේඛා, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

අමරසිරි, පී. ඩී. (2014). ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම. ජාතික පුස්තකාල විමර්ශන, 1(1), 62-73.

අමුණුගම, එස්. (1999). සංස්කෘතිය, සමාජය හා පරිසරය. සදීපා ප්‍රකාශකයෝ.

ආරියපාල, ඇම්. බී. (1962). මධ්‍යකාලීන ලංකා සමාජය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

කංකානම්ගේ, එස්. (2006). අපේ පාරම්පරික දැනුම. කර්තෘ ප්‍රකාශනයකි.

ධර්මකීර්ති. (1997). සද්ධර්මාලංකාරය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මැදවැව, එස්. (1998). ශ්‍රී ලාංකීය දේශීය ඥානය හා ජෛව විවිධත්වය. සොබා, 7(01), 50-52.

රණසිංහ, පී. (2006). ශ්‍රී ලංකාවේ දේශීය දැනුම, එහි ස්වභාවය. සංරක්ෂණය හා සංවර්ධනය, කැලණිය විශ්වවිද්‍යලය.

වාදසිංහ, එල්. ජී. ඩී .එස්. (2015). දේශීය දැනුම හා එහි වැදගත්කම. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයඃ 25 වන සංවත්සරය, සමරු කලාපය, 281- 303.

විමලවංශ, බී. (2000). අපේ සංස්කෘතිය, සමයවර්ධන ප්‍රකාශකයෝ.

විජේසේකර, එන්. (1965), ලංකා ජනතාව, ගුණසේන සහ සමාගම.

වික්‍රමසිංහ, කේ. ඩී. පී. (1976). අපේ සංස්කෘතික උරුමයඃ ෂ කාණ්ඩය. කර්තෘ ප්‍රකාශනයකි.

සරච්චන්ද්‍ර, බී. (1977). අපේ සංස්කෘතික උරුමය හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිසරයඃ 1 කාණ්ඩය. කර්තෘ ප්‍රකාශනයකි.

සුමංගල එච්. සහ බටුවන්තුඩාවේ පී. (1996) මහාවංශයඃ දෙවන කොටස. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Miyata, S. (2012). *The Safeguarding of the Intangible Cultural Heritage in Japan***.** http://www.accu.or.jp/ich/en/pdf/c2005subreg_Jpn2.pdf

Ranasinghe, P. (2006). Indigenous Konwledge in Sri Lanka, *Vidyarthi*, *Annual of the Alumni Association of the Department of Library and Information Science: University of Kelaniya*.134-143.

Ranasinghe, P. (2008). Preservation and Provision of Access to Indigenous Knowledge in Sri Lanka, *World Library and Information Congress: 74th Ifla Conference and Council*, https://archive.ifla.org/IV/ifla74/papers/106-Ranasinghe-en.pdf

Tylor, E.B. (1920), *Primitive Culture,* Vol.1. John Marray, London.

UNESCO Intangible Cultural Heritage. (2003). *Text of the Convention for the Safeguarding of the Intangible Cultural Heritage.* https://ich.unesco.org/en/convention

UNESCO. (Ed.). (2006). *Procedings Acts*: *International Conference on the Safeguarding of Tangible and Intangible Cultural Heritage: Towards an Integrated Approach,* UNESCO. https://unesdoc.unesco.org/search/N-EXPLORE-15ecd003-c613-4697-aeec-fbd4868b3f11

# Use of Piriven Libraries by the Pirivena Teachers for their Teaching Process

**Somananda S.**

somananda@kln.ac.lk

Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka

## *Abstract*

*Buddhist temples were the foundations of Sri Lankan old education system. The education of Sri Lanka which commenced at "Kalapprasada Pirivena" in Anuradhapura first, Developed as "Pirivena" subsequently. Piriven Library is the main information center for the Pirivena education process. The Piriven Libraries, which represent the academic libraries, are increasing the knowledge and skills of the students in various subjects and languages, and fulfill the teacher's academic information requirements. Accordingly, the problem of the research was, "Does the teachers use the Pirivena libraries effectively to explore the information need in order to make their teacing process a success?". The main objective of the study was to identify the use and usage patterns of pirivena library among teachers and other objectives was identifying the problems in relation with the usage of libraries.*

*The study based on the survey method and population of the study were all pirivena teachers in the western province. Stratified sample method was used to select the sample for the study. Primary data was collected by distribution of questionnaires under the stratified random sampling system among the respective teachrs. MS excel software was used to analyse the primary data obtained through the questionnaires.*

*It was revealed that, most of the teachers from the sample do not use libraries during their teacing process. The teacher who is maintaining Pirivene library had Lack of proper understanding of the library and the information services it provides. Suggestions were made to organize programs that positively influence the teachers about the importance of library use and by implementing, these can provide sustainable solutions for these issues. The institutions responsible for the library sector, including the Ministry of Education, the National Library must come forward for that.*

***Keywords** : Piriven Libraries, Academic Libraries, Information Needs, Academic Information, Piriven Education.*

## හැඳින්වීම

ක්‍රි. පු. තෙවන සියවසේ සිදු වූ මහින්දාගමනයෙහි ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය පිරිවෙන් සහ මූලායතනයන් කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක විය. මෙම සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය ගොඩනැඟී තිබුණේ බුදුසමයෙහි අතිවිශිෂ්ට ඉගැන්වීම් පදනම් කොට ගනිමින් ය (අදිකාරි, 1991අ). එය පිරිවෙන් අධ්‍යාපනය, ආරාමික අධ්‍යාපනය යන නාමයන්ගෙන් හඳුන්වනු ලැබීය. විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව පැවැතියේ මෙකී පිරිවෙන් අධ්‍යාපනය වූ අතර එකී පිරිවෙන් අධ්‍යාපනයෙහි මුඛ්‍ය අරමුණ වූයේ, අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ පුද්ගලයෙකු සමාජගත කිරීමයි. එබැවින් පළමුව ත්‍රිපිටකය, පෙළ හා අටුවාවන්ට පමණක් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සීමාවිය. නමුත් පසුකාලීනව විවිධ ටීකා. ප්‍රකරණත්, සංස්කෘත, ව්‍යාකරණ ඡන්දස්, අලංකාර, කෝෂ, නිඝණ්ඩු, වෛද්‍ය ශාස්ත්‍රය යන විෂයයන් ද, එසේම විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාට තහනමට යටත් වූ කාව්‍ය, නාටකාදී ගර්හිත විද්‍යා ද පිරිවෙන් ක්‍රියාවලියට එකතුවිය (අදිකාරි, 1991ආ). මෙසේ ක්‍රමානුකූලව විකාශනය වෙමින් පැවති පිරිවෙන් අධ්‍යාපනය ක්‍රිස්තු පූර්ව යුගයේ සිට 19 වැනි සියවස දක්වා මෙරට ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක විය.

## පිරිවෙන් අධ්‍යාපනය

පිරිවෙන් නැමති අධ්‍යාපනික ආයතනය මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරාම ආශ්‍රිතව බිහි වුවත් පිරිවෙන යන වචනය භාරතීය බෞද්ධ පරිසරයේ ඇසුරෙන් ගොඩනැඟී ඇති බැව් පෙනේ. පිරිවෙන වචනය "පරිවෙණ" යන පාලි වචනයෙහි තත්වයකි. පරිවෙණං සමජ්ජිතබ්බං යන තැන්හි පිරිවෙන යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ, මිදුල හෝ ගෙයක් වැනි ස්ථානයකි (සුමන හිමි, 2015අ). භික්ෂූන් වහන්සේලා ජීවත් වූ කුටිය ද පිරිවෙන් නාමයෙන් හඳුන්වා ඇත. මුල්කාලීනව භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානයක් වශයෙන් පිරිවෙන හැඳින්වුව ද පසුව එය භික්ෂූන්ගේ අධ්‍යාපනික මධ්‍යස්ථානය බවට පත්විය. ආරම්භක වකවානුව තුළ දී භික්ෂු අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වූ පිරිවෙන පසුව ගිහි-පැවිදි දෙපක්ෂය සඳහා ම අධ්‍යාපනය ලබා දෙනු ලබන අධ්‍යාපනික ආයතනයක් බවට පත්විය.

1959 පිරිවෙන් නියෝග මාලාව යටතේ එතෙක් කනිෂ්ඨ. ජ්‍යේෂ්ඨ සහ විශ්වවිද්‍යාල අනුබද්ධ ආයතන වශයෙන් පැවති පිරිවෙන් වර්ගීකරණය මූලික පිරිවෙන්, මහා

පිරිවෙන් සහ විද්‍යායතන පිරිවෙන් ලෙස යළි වර්ග කරන ලදී. මෙහි මූලික පිරිවෙන් හරහා භික්ෂුවකට අවශ්‍ය මූලික අධ්‍යාපනය ලබා දෙනු ලබයි. මහා පිරිවෙන මූලික පිරිවෙනේ විෂයමාලාව ඉගැන්වෙන අතර ඊට අමතරව ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග සඳහා සහ අපොස උසස් පෙළ විභාගය සඳහා ද ගිහි පැවිදි දෙපාර්ශවය ම සුදානම් කරනු ලබයි. විද්‍යායතන පිරිවෙන් ආයතන සෘජුව ම කලාප අධ්‍යාපන කාර්යාලයන්හි අධීක්ෂණය යටතේ සාමාන්‍ය පාසල් විෂය මාලාව ක්‍රියාත්මක කරමින් හය වසරේ සිට දහතුන වසර දක්වා ඉගැන්වීම් කටයුතු සිදු කරයි (සුමන හිමි, 2015ආ).

පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථ වන්නේ, පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම, සැරියුත් මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම, දේශීය, විදේශීය ධර්ම දූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් ලබාදීම, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසාදීම යනාදිය යි (1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත). මෙකී පරමාර්ථයන් සාධනයෙහි ලා පාරිවේණික ශිෂ්‍යයන්ට මෙන් ම ආචාර්යවරුන්ට ද සුවිශේෂී වගකීමක් පැවරේ. විශේෂයෙන් ම පිරිවෙන්හි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායිව පවත්වාගෙන යාමේ දී වැඩි වගකීමක් පාරිවේණික ආචාර්යවරයා මත පැටවේ. එකී වගකීම සපුරාලීම සඳහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු සේවා සපයනු ලබන ප්‍රධානතම ආයතනය වන්නේ පිරිවෙන් පුස්තකාලය යි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පුස්තකාල සේවා අතර ඉපැරණිතම පුස්තකාල සේවාව පිරිවෙන් පුස්තකාල සේවාව යි. අනුරාධපුර පොළොන්නරු යුගවල භික්ෂු අධ්‍යාපනික ආයතන තුළ ක්‍රියාත්මක වූ පුස්තකාල "පොත්ගුල්" යන නමින් හඳුන්වනු ලැබීය (රණසිංහ, 2006). පොත්ගුල භික්ෂූන් වහන්සේලා අධ්‍යාපනය හා ආගමික අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය වන්නාවූ පොත්පත් එක් රැස් කර කරමින් උපයෝජක සේවා පවත්වාගෙන් ගොස් තිබේ. පොත්ගුල් තුළ එක්රැස් කොට තිබූ පොත්පත් එකතු උපයෝගී කරගනිමින් භික්ෂූන් වහන්සේලා සහ පාරිවේණික ශිෂ්‍යයෝ සිය කියවීම, ලිවීම ආදිය ප්‍රගුණ කළහ.

පිරිවෙන් පුස්තකාලයක මෙහෙවර වන්නේ, පිරිවෙන් අධ්‍යාපන ඉලක්කයන් සපුරාගැනීම පිණිස පාරිවේණික ශිෂ්‍ය ප්‍රජාවගේ හා පිරිවෙන් ආචාර්යවරුන්ගේ තොරතුරු හා තොරතුරු සම්පත් අවශ්‍යතා සපුරාලීමත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනයට කටයුතු කිරීමත් ය. වර්තමානය වන විට අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන පිරිවෙන් ඒකකයෙහි ලියාපදිංචි පිරිවෙන් ප්‍රමාණය අටසීය දාසය (816) කි (Annual School Census Report, 2020). මෙකී සෑම පිරිවෙන් ආයතනයක් සඳහා ම පුස්තකාලයක් ගොඩනැංවීම අනිවාර්ය බව රජය විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග නම් වූ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සෑම පිරිවෙනකට ම පුස්තකාලයක් හා කියවීම් ශාලාවක් තිබිය යුතු බව දක්වා ඇත. මෙම ගැසට් පත්‍රයට ප්‍රකාරව සෑම පිරිවෙනකටම පුස්තකාලයක් පැවතීම අනිවාර්ය වන අතර පුස්තකාල එකතුව සංවර්ධනය කිරීමට හා පුස්තකාලය නඩත්තු කිරීමට ආධාර ලබාදීමට ද රජය මෙම පනතින් ම බැඳී ඇත. මෙකී පසුබිම යටතේ සිදු කරනු ලැබූ මෙම අධ්‍යනයෙහි පර්යේෂණ අරමුණු පහතින් දක්වා ඇත.

**අධ්‍යනයෙහි අරමුණු**

- පාරිවේණික ආචාර්යවරුන් සිය ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේ දී පිරිවෙන් පුස්තකාල භාවිතය අධ්‍යයනය කිරීම.
- පාරිවේණික ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීම.
- පුස්තකාල භාවිතයේ දී ආචාර්යවරුන් මුහුණපාන ගැටලු හඳුනාගැනීම.


**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබූ පර්යේෂණ විධික්‍රමය වූයේ සමීක්ෂණ විධික්‍රමය යි. පර්යේෂණය සංගහනය වූයේ බස්නාහිර පළාතේ පාරිවේණික ආචාර්යවරුන් ය. එම සංගහනය ඇසුරෙන් නියැදිය තෝරා ගැනීමේ දී Krejcie සහ Morgon (1970) යන දෙ දෙදෙනා විසින් හඳුන්වා දෙනු ලැබූ Krejcie and Morgon Table යොදාගනු ලැබීය. එම වගුවට අනුව අධ්‍යයනයේ නියැදිය තෝරා ගැනීමේ දී ස්ථරගත අහඹු නියැදි ක්‍රමය භාවිත කරන ලදි. ඒ අනුව මූලික පිරිවෙන් මහා පිරිවෙන් හා විද්‍යායතන

පිරිවෙන් යන ස්ථර තුනම නියෝජනය වන පරිදි අධ්‍යයන නියැදිය වශයෙන් පිරිවෙන් ආචාර්යවරුන් 118 දෙනෙකු අහඹු ලෙස තෝරා ගෙන ඔවුන් වෙත ප්‍රශ්නාවලි බෙදා දෙමින් අධ්‍යයනය සඳහා වූ ප්‍රාථමික දත්ත රැස් කර ගනු ලැබීය. එසේ රැස් කර ගනු ලැබූ ප්‍රාථමික දත්තයන් Ms Excel මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදි.

**සාකච්ඡාව**


පාරිවේණික ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීම




*ප්‍රස්තාර 4-1 ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතය*


උක්ත අංක 01 ප්‍රස්තාරයට අනුව ප්‍රතිචාර දක්වා ඇති ආචාර්යවරුන්ගෙන් වැඩි දෙනෙකුගේ අදහස වී ඇත්තේ ඔවුන් ඉගැන්වීමේ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේ දී පිරිවෙන් පුස්තකාල භාවිත නොකරන බවයි. එහි ප්‍රතිශතය 70%කි. සිය ඉගැන්වීමේ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය අරමුණු කොට ගෙන පිරිවෙන් පුස්තකාල භාවිත කරනු ලබන ආචාර්යවරුන්ගේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 30%ක් වේ. මේ අනුව ආචාර්යවරුන්ගෙන් බහුතර ප්‍රමාණයක් සිය ඉගැන්වීම්

ක්‍රියාවලිය ඵලදායී කර ගැනීම සඳහා පිරිවෙන් පුස්තකාල භාවිත නොකරන බැව් පැහැදිළි වේ.




*ප්‍රස්තාර 4-2 ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතයේ ස්වභාවය*


ප්‍රස්තාර අංක 02ට අනුව ආචාර්යවරුන්ගෙන් බොහෝ පිරිසක් පුස්තකාලය භාවිත කරනු ලබන්නේ කලාතුරකිනි. එහි ප්‍රතිශතාත්මක අගය වන්නේ 55%කි. දෙවනුවට වැඩිම ප්‍රතිචාරයක් හිමිව ඇත්තේ මසකට වරක් යන්න සඳහා වන අතර ඒ සඳහා 30%ක ප්‍රතිශතයක් ලැබී තිබේ. දිනපතා පුස්තකාලය භාවිත කිරීම යන්න සඳහා ලැබී ඇත්තේ ඉතා අවම මට්ටමේ ප්‍රතිචාරයකි. එහි ප්‍රතිශතාත්මක අගය 8%ක් ලෙස දැක්වේ. මෙයින් පැහැදිළි වන්නේ පිරිවෙන් පුස්තකාල භාවිත කරනු ලබන ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතයෙහි ස්වභාවය සතුටුදායක මට්ටමක නොපවතින බවයි.




*ප්‍රස්තාර 4-3 පුස්තකාල භාවිත කිරීමට හේතු*

මෙම අංක 03 ප්‍රස්තාරයට අනුව ආචාර්යවරුන් අතුරින් වැඩි ප්‍රමාණයක් පුස්තකාලය භාවිත කරනු ලබන්නේ, සිය විෂයානුබද්ධ දැනුම වර්ධනය කර ගැනීම සඳහා ය. එහි ප්‍රතිශතය 32%කි. දෙවැනුවට වැඩිම ප්‍රතිචාරයක් හිමිව ඇත්තේ විනෝදාස්වාදය සඳහා යන්න වෙනුවෙනි. එය 26%ක අගයක් ගනී. සැලකිය යුතු ආචාර්යවරුන් ප්‍රමාණයක් ඉගැන්වීමේ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණට පුස්තකාල භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා ඇත අතර එහි ප්‍රතිශතය 17%ක් වේ. මෙහිදී අවම ප්‍රතිචාරයක් ලැබී ඇත්තේ සිය ඉගෙනීමේ කටයුතු සඳහා තොරතුරු ගවේෂණය සඳහා යන්නට ය. එහි ප්‍රතිශතාත්මක අගය 10%කි. මීට අමතරව විනෝදාස්වාදය සඳහා ද ඇතැම් ආචාර්යවරුන් පුස්තකාල භාවිත කරනු ලබයි.

පුස්තකාල භාවිතයේ දී ආචාර්යවරුන් මුහුණපාන ගැටලු හඳුනාගැනීම




*ප්‍රස්තාර 4-4 පුස්තකාල භාවිතයේ මුහුණපාන ගැටලු*

උක්ත අංක 04 ප්‍රස්තාරයට අනුව පිරිවෙන් ආචාර්යවරුන් පුස්තකාල භාවිතයේ දී මුහුණපාන ගැටලු අතර ප්‍රධානතම ගැටලුවක් නම් පිරිවෙන් පුස්තකාල සඳහා විධිමත් පුස්තකාලයාධිපතිවරයෙකු නොමැතිවීමයි. ඒ සඳහා දක්වා ඇති ප්‍රතිචාරයන්හි අගය 30%ක් වේ. එසේම පුස්තකාලය භාරව සිටින ආචාර්යවරයාට පුස්තකාල සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් නොමැතිවීම නිසා ද ආචාර්යවරුන් විවිධ ගැටලුවලට මුහුණපාන බැව් මෙම ප්‍රස්තාරයෙන් පැහැදිළි වේ. මන්ද දෙවැනුවට වැඩිම ප්‍රතිචාර ප්‍රමාණයක් ලබා දී ඇත්තේ එකී කරුණ වෙනුවෙන් නිසාවෙනි. එහි ප්‍රතිශතය 26%කි. පුස්තකාලයෙහි නව තොරතුරු මූලාශ්‍රය නොමැතිකම ද ආචාර්යවරුන් මුහුණපාන ගැටලු අතර එක් ගැටලුවකි. ඒ බැව් සනාථ වන්නේ පුස්තකාල එකතුව යාවත්කාලීන නොවීම යන ප්‍රකාශය වෙත 22%ක් පමණ ප්‍රතිචාර දක්වා තිබීමෙනි. ඊට අමතරව සපයනු ලබන තොරතුරු සේවා ගුණාත්මක මට්ටමෙහි නොවීම හා තොරතුරු ගවේෂණ පහසුකම් නිසි පරිදි නොමැතිවීම ද ආචාර්යවරුන් වෙත ඇති ගැටලු වේ.

මේ අනුව උක්ත දත්ත විශ්ලේෂණය තුළින් පිරිවෙන් වර්ග තුනම නියෝජනය කරනු ලබන ආචාර්යවරුන් අතුරින් වැඩි ප්‍රමාණයක් සිය ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීමේ දී පිරිවෙන් පුස්තකාල භාවිත නොකරන බවත්, එසේම පිරිවෙන් වර්ග තුනෙහි ම පුස්තකාල භාවිත කරනු ලබන ආචාර්යවරුන් අතුරින් වැඩි පිරිසක් සිය විෂයානුබද්ධ දැනුම දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේ දී පිරිවෙන් පුස්තකාල භාවිත කරන බවත් ප්‍රධාන වශයෙන් ම අනාවරණය කර ගන්නා ලදී.

## නිගමන

පාරිවේණික ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේ දී පිරිවෙන් පුස්තකාල භාවිතය පිළිබඳව සිදු කරන ලද මෙම අධ්‍යයනය තුළින් පහත නිගමනවලට එළඹෙන ලදි.

- පාරිවේණික ආචාර්යවරුන් සිය ඉගැන්වීමේ ක්‍රියාවලිය ඵලදායී කර ගැනීමෙහිලා අවශ්‍ය තොරතුරු ගවේෂණයේ දී පිරිවෙන් පුස්තකාල භාවිත කරනු ලබන්නේ ඉතා අවම මට්ටමකිනි.
- පුස්තකාල එකතුව සමබර නොවීම, එකතුව යාවත්කාලීන නොවීම, නව තොරතුරුවලින් සමන්විත තොරතුරු මූලාශ්‍රය පුස්තකාල එකතුවට එක්වීමේ ප්‍රවණතාවය අවම වීම පිරිවෙන් පුස්තකාල ආශ්‍රයෙන් දැකිය හැකි බරපතල ගැටලුවකි.
- විධිමත් පුස්තකාලයාධිපතිවරයෙකු නොමැති වීම නිසාවෙන් පිරිවෙන් පුස්තකාලයෙහි කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට නොහැකි වී ඇත.
- පුස්තකාලය භාරව කටයුතු කරනු ලබන ආචාර්යවරයාට පුස්තකාලය පිළිබඳවත්, එමඟින් සැපයිය තොරතුරු සේවා හා පුස්තකාල සේවා පිළිබඳවත් ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම ආචාර්යවරුන්ගේ පුස්තකාල භාවිතය අවම මට්ටමක පවතීමට ප්‍රධාන හේතුවකි.
- නව තාක්ෂණය භාවිත නොකිරීම, පුස්තකාල ද්‍රව්‍ය නිසි ලෙස සංරක්ෂණය නොකිරීම හා නිසි ග්‍රන්ථ සංවිධාන ක්‍රම සහ ප්‍රමිති භාවිත නොකිරීම තුළින් ගුණාත්මක පාඨක සේවාවක් සැපයීමට පුස්තකාලයට නොහැකිවී තිබීම.

**යෝජනා**

පිරිවෙන් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ නිමග්න පාරිවේණික ආචාර්යවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීමට හා එම තොරතුරු සිය අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ලබා ගැනීමට ඇති ප්‍රධානතම තොරතුරු මධ්‍යස්ථානය වන්නේ පිරිවෙන් පුස්තකාලය බව හඳුනාගන්නා ලදී. එය එසේ වුවත් මෙකී පිරිවෙන් පුස්තකාල පාරිවේණික ආචාර්යවරුන් සිය ඉගෙනුම් ක්‍රියාවලිය ඵලදායී කර ගැනීම සඳහා වැඩි වශයෙන් භාවිත නොකරන බවත්, එවැනි කණගාටුදායක තත්ත්වයක් ඇති වීමට විවිධ හේතු සාධක මුල් වී ඇති බවත් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කර ගන්නා ලදී. පිරිවෙන් පුස්තකාල පද්ධතිය තුළ ඉස්මතු ව තිබෙන මෙකී ගැටලුකාරී තත්ත්වයන් මඟ හරවා ගෙන පිරිවෙන් අධ්‍යාපනය ක්‍රියාවලියට ඍජු දායකත්වයක් සපයනු ලබන ප්‍රධාන තොරතුරු මධ්‍යස්ථානයක් බවට පිරිවෙන් පුස්තකාල පත්කිරීම අරමුණු කර ගෙන මෙම යෝජනා ඉදිරිපත් කෙරේ.

- පිරිවෙන් පුස්තකාලයාධිපති වෘත්තිය ස්ථාපිත කිරිම.
- දැනට පුස්තකාලය භාරව කටයුතු කරන ආචාර්යවරුන් ඉලක්ක කරමින් වැඩමුළු හා පුහුණු වැඩසටහන් හඳුන්වා දීම.
- සමබර තොරතුරු සහිත නව්‍ය තොරතුරු මූලාශ්‍රයන්ගෙන් සමන්විත පුස්තකාල එකතුවක් ගොඩනැංවීම හා එම එකතුව යාවත්කාලීන කිරීම.
- පිරිවෙන් පුස්තකාල සඳහා යෝග්‍ය, පහසුවෙන් භාවිත කළහැකි වර්ගීකරණ ක්‍රමයක් සකස් කොට එයට අනුව එකතුව සංවිධානය කිරීම.
- පාරිවේණික ආචාර්යවරුන් පුස්තකාලය වෙත ආකර්ෂණය කරගැනීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- තොරතුරු ගවේෂණ පහසුකම් ඇති කරලීම සඳහා ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණික සම්පාදනය කිරීම.
- පුස්තකාලය වෙත අන්තර්ජාල පහසුකම් ලබා දීම.
- පුස්තකාලය සඳහා තොරතුරු සන්නිවේදන පහසුකම් සපයාදීම.

## විමර්ශන

අධිකාරම්, ඊ. ඩබ්ලිව්. (1963). පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. කොළඹ : කේ.කේ. ජී. ජයවර්ධන සහ සමාගම

අබයරත්න, අදිකාරි (1991). ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන. කඩවත : තිවිර ප්‍රකාශක

ඇඳගම, මාලනී (1994). ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල ආරම්භය හා වර්ධනය. සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය, පින්වත්ත : සද්ධර්මාකර පිරිවෙන

කුරුප්පු, ඩබ්ලිව්. (1964). ලංකාවේ සුප්‍රසිද්ධ විද්‍යාපීඨ. අධ්‍යාපනයේ සියවස, කොළඹ : අධ්‍යාපන අමාත්‍යංශය

පඤ්ඤාකර හිමි, නාත්තන්ඩියේ (1967). පුරාණ ලංකාවේ පොත්ගුල් හා ඒවායේ ආරක්ෂාවට භික්ෂූන්ගෙන් සිදුවූ සේවාව. Seylon library reiw: Journal of the Ceylon library association,

පඤ්ඤාලෝක හිමි, මීගොඩ (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. මරදාන : ගොඩගේ

පියරතන හිමි, ලැගුම්දෙණියේ (2006). අනුරාධපුර යුගයේ ආරාමික පුස්තකාල. පුස්තකාල විද්‍යා ලේඛන, සමුච්චය කැලණිය : පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය

රණසිංහ, ආර්. අයි. එස්. (2006). පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය. මහරගම : කර්තෘ

ලගමුව, ඒ (19947). ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල ආරම්භය සහ වර්ධනය. සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය, පින්වත්ත : සද්ධර්මාකර පිරිවෙන

සුමන හිමි, අතලේ (2015). සම්භාව්‍ය අධ්‍යාපනයෙහිලා වනපොත්කරණයේ උපයෝගීතාවය. කොළඹ : ගොඩගේ

# Study on public library service in Sri Lanka referring to IFLA/UNESCO Public library Missions stated in the Manifesto 2022: based on Polonnaruwa Distric

**Tharuka M.G.P**

mgpth241@kln.ac.lk

Department of Library and Information Science, University of Kelaniya, Sri lanka.

## *Abstract*

*Public libraries are a worldwide institution. They exist in different societies with different levels of growth and cultures. As they operate in different contexts, the service provided and the style of providing the service varies. Public library services should operate in a modern and appropriate manner, as indicated by the 2022 IFLA/UNESCO Public Library Performance Facts. Through this survey, it was studied that public libraries in Sri Lanka conduct their services based on the performance facts stated in this mission statement. In the study, the awareness of public librarians about the performance facts stated in the mission statement and the level of operation of these facts in public libraries were examined. 07 librarians of main public libraries under the 07 Pradeshiya Sabhas of Polonnaruwa district were used as the study sample. Questionnaires and open interviews were used to collect primary data and the secondary data were obtained using printed and electronic sources. According to the data of this survey, the awareness of the public librarians on the performance facts mentioned in the IFLA/UNESCO was at a minimum level. Libraries face several issues and challenges when they apply those performance facts for their services, such as staff training issues, physical problems, poor reader and staff attitude and further identified library services in the public library system of Sri Lanka are very minimally implemented. According to the survey data, among the public libraries selected as the sample, the level of awareness about IFLA/UNESCO public library performance facts is about 57%. 45% of library staff possessed degree or diploma qualifications in library science. As a result, they face many difficulties in providing their services that have greatly affected the service quality improvement. In order to successfully implement the IFLA/UNESCO performance facts for the public libraries, the library services offered by those libraries should be well planned and should implement international standards and guidelines.*

**Keywords:** *IFLA/UNESCO Public Library Manifesto, Public Libraries, Library Service, Library Standards, Library Management.*

## හැඳින්වීම

මානව වර්ගයා එදා මෙදා තුළ පැමිණි ගමන් මගට තොරතුරු අත්‍යවශ්‍ය අංගයක් වූ බව නොරහසකි. ලොව පුස්තකාල සංකල්පය මිනිස් දැනුම ලේඛනගත කිරීමේ ඉතිහාසය දක්වා දිව යයි. එසේ ලේඛනගත කරන ලද යම් යම් තොරතුරු මූලාශ්‍ර එක්රැස් කිරීමට මිනිසා නිතැනින්ම හුරුපුරුදු වී ඇත. ලේඛනගත තොරතුරු මූලාශ්‍ර සංරක්ෂණය කිරීමේ අරමුණින් "ද්‍රව්‍ය ගබඩාව" අර්ථයෙන් එකල පුස්තකාල හැඳින්වූ අතර පොත් බලාගැනීමට "ගබඩා භාරකරුවෙකු " ඒ සඳහා පත්කොට තිබිණි. මේ සංකල්පය ක්‍රමයෙන් වෙනස් ව එක්තැන් කරන ලද ද්‍රව්‍ය පාඨක ප්‍රයෝජනය සඳහා පරිහරණයට ලබාදිය යුතුය යන සංකල්පය ජනප්‍රියත්වයට පත් විය. පාඨකයන් වෙනුවෙන් පොත්පත් එක්රැස් කරන ආයතනය පුස්තකාලය විය. මෙලෙස බිහිවූ පුස්තකාලය අතීතයේ ඥාන කෝෂ්ඨාගාරය ලෙසින් ව්‍යවහාර වූ අතර වර්තමානය වන විට නූතන තාක්ෂණය පෙරදැරි කොටගෙන තොරතුරු මධ්‍යස්ථානය දක්වා සංවර්ධිත අවධියකට පැමිණ ඇත. විවිධ සමාජ සන්දර්භ තුළ මනුෂ්‍යයාගේ තොරතුරු අවශ්‍යතා විවිධාකාර වන අතර එකී තොරතුරු අවශ්‍යතා ඉටු ඉටුකිරීමට වත්මන් සමාජය තුළ පුස්තකාල වර්ග කිහිපයක් බිහි වී ඇත.

ඒවා නම් පාසල් පුස්තකාල, මහජන පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, විශේෂ පුස්තකාල සහ ජාතික පුස්තකාල වේ. සෑම පුස්තකාල වර්ගයකම සේවය අපේක්ෂා කරමින් පැමිණෙන සුවිශේෂී පාඨක කණ්ඩායමක් සිටී. මෙලෙස පැමිණෙන පාඨකයින් හට සේවය ඉටු කිරීම සෑම පුස්තකාල වර්ගයකම යුතුකම හා වගකීම වෙයි. ජාති, කුල, ආගම්, භාෂා, වයස්, තාරාතිරම් ආදී කිසිදු භේදයකින් තොරව සමාජයේ සෑම පුද්ගලයෙකුටම අවස්ථා හිමිවන ලෙස  සේවා සැපයීම මහජන පුස්තකාලයක වගකීම වෙයි. ඒ අනුව කිසියම් ප්‍රාදේශීය සමාජයක් තුළ වෙසෙන මානව කොට්ඨාසයක් සඳහා කිසිදු භේදයකින් තොරව තොරතුරු සේවා සපයන පුස්තකාල විශේෂයක් ලෙස මහජන පුස්තකාල හඳුනාගත හැකිවෙයි. මහජන පුස්තකාල යන්න ඉෆ්ලා /යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥාප්තියට අනුව මෙසේ දැක්විය හැකිය.

"මහජන පුස්තකාලය ලොව පුරා ව්‍යාප්තව පවත්නා ආයතනයකි . එය එකිනෙකට වෙනස් වූ සංවර්ධන මට්ටම් සහ සංස්කෘතීන්ගෙන් සමන්විත විවිධ සමාජයන්හි

පවතින්නකි. ඒවා විවිධ සන්දර්භ තුළ ක්‍රියාත්මක වන බැවින් සපයන්නා වූ සේවය මෙන්ම සේවය සපයන විලාසයද එකිනෙකට වෙනස් වේ." (IFLA/UNESCO,1994)

එසේම මහජන පුස්තකාල යන්න American Library Association (ALA) ශබ්ද මාලාවට අනුව පහත පරිදි නිර්වචනය කර ඇත.

"මහජන පුස්තකාලය යනු ජන සමාජයක , දිස්ත්‍රික්කයක හෝ අදාළ ප්‍රදේශය තුළ ජීවත් වන සියල්ලන්ටම නොමිලේ සේවය සපයනු ලබන සම්පූර්ණයෙන් හෝ කොටසක් මහජන අරමුදලින් මූල්‍යමය ආධාර ලබන ආයතනයකි. "( ALA, 2007 )

මහජන පුස්තකාලයක උපයෝජක පිරිස බහු ආගමික, බහු සංස්කෘතික, බහු ජාතික, විවිධ වයස් පරතර ඇති, විවිධ රැකියාවන්හි නියුක්ත පිරිසකි. ඔවුන්ගේ අරමුණු හා අපේක්ෂා විවිධ ය. "මහජන පුස්තකාලය අනවරතයෙන් ම ජාති භේද, අධ්‍යාපනික හා වෘත්තීය භේද, ලිංග භේද, සමාජ හා ජීවන තත්ත්ව භේද ඉක්ම වූ ආයතනයක් ලෙස පවත්වාගෙන යා යුතුය" (ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනයඃ මහජන පුස්තකාල ප්‍රමිති, 1977) මේ අනුව සෑම උපයෝජකයෙකුගේ ම තොරතුරු අවශ්‍යතාවන් ඉටු කරගත හැකි වන පරිදි මහජන පුස්තකාලයක කාර්යභාරය සකස් විය යුතු ආකාරය ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තියෙහි සඳහන් වේ. එම ප්‍රඥප්තියෙහි මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශනයේ කරුණු දොළහක් (12) දක්වා ඇත. ඒවා නම්,

**2022 ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තියෙහි සඳහන් මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශනයේ කරුණු**

- කිසිඳු බාධාවකින් හෝ වාරණයකින් තොරව ප්‍රජාවට තොරතුරු ලෝකය වෙත පිවිසීම සඳහා අවකාශය ලබා දීම, විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය මෙන්ම යාවජීව අධ්‍යාපනය සඳහා උපකාර කිරීම සහ ජීවිතයේ සෑම අවස්ථාවකදීම තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දීම.
- පුද්ගලික නිර්මාණාත්මක සංවර්ධනය සඳහා අවස්ථා ලබා දීම, සහ පරිකල්පනය, නිර්මාණශීලිත්වය උත්තේජනය කිරීම.
- උපතේ සිට වැඩිහිටි විය දක්වා ළමුන් තුළ කියවීමේ පුරුදු ඇති කිරීම සහ ශක්තිමත් කිරීම.

- සාක්ෂරතා වර්ධන කටයුතු ආරම්භ කිරීම,අනුබලය දීම සහ සහභාගී වීම තුළින් ප්‍රජාවගේ කියවීම් හා ලේඛන කුසලතා ගොඩනැංවීම සහ මාධ්‍ය තොරතුරු සාක්ෂරතා හා විද්‍යුත් සාක්ෂරතා හැකියාවන් සියලු පාඨක ප්‍රජාව තුළ වර්ධනය කිරීම හා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් බිහිකිරීමේ කාර්යයේ මධ්‍ය ලක්ෂයක් ලෙස ක්‍රියා කිරීම.
- හැකි සෑම අවස්ථාවකදීම ඩිජිටල් තාක්ෂණය තුළින් පාඨකයන්ට සෘජුව හා දුරස්ථව තොරතුරු මූලාශ්‍ර වෙත පිවිසීමට අධ්‍යාපනය ලබා දීම.
- සියලු පුරවැසියන්ගේ සියලු ප්‍රජා තොරතුරු ලබා ගැනීම සඳහා සහාය වීම හා සහභාගිවීම.
- පර්යේෂණ ප්‍රතිඵල සෞඛ්‍යකාරණා වැනි විද්‍යාත්මක දැනුමට පිවිසීමට සියලු ජනයාට අවකාශ සැලසීම හා ඔවුන් විද්‍යාත්මක ප්‍රගමනයේ කොටස්කරුවන් බවට පත් කිරීම.
- ප්‍රාදේශිය ව්‍යවසායන්ට,සංගම්වලට සහ උද්‍යෝගශීලි කණ්ඩායම්වලට ප්‍රමාණවත් තොරතුරු සේවාවන් සැලසිම.
- ප්‍රජාවේ අභිමතයට ගැලපෙන ලෙස ප්‍රාදේශීය සහ දේශීය දත්ත දැනුම හා දේශීය උරුමය, වාචික සම්ප්‍රදාය ආරක්ෂා කිරීම හා ඒවාට ප්‍රවේශය ලබා දීම.
- අන්තර් සංස්කෘතික සම්ප්‍රදාය පෝෂණය කිරීම හා සංස්කෘතික විවිධත්වය සඳහා අනුබල ලබා දීම.
- සංස්කෘතික උරුමය සකල කලාවන් අගය කිරීම විද්‍යාත්මක ජයග්‍රහණ සහ නව සොයා ගැනීම් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සහ සාම්ප්‍රදායික හා විද්‍යුත් මාධ්‍ය පිළිබඳ අවබෝධය ලබාදීම.

**මහජන පුස්තකාල අරමුණු හා කාර්යයන්.**

මහජන පුස්තකාලය සම්පත් ඥාණයේ හා සංස්කෘතික සංවර්ධනයේ කැඩපතක් විය යුතුය. යාවත්කාලින තොරතුරු ලබාදීමත්, ඒවා සිත් ගන්නා අයුරින් පාඨකයා අතර ප්‍රචාරය කර හැරීමත් අවශ්‍ය නිදහස් හා නිවහල් අදහස් ජනනය කිරීම සඳහාත් මහජන පුස්තකාලය මෙසේ සකස් වීම වැදගත් වේ. අදහස් හා දැනුම හුවමාරු කර ගැනීමට සහාය වීම මහජන පුස්තකාලයේ මුලික පරමාර්ථය විය යුතුය. සමාජය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහ ද, නිරන්තරයෙන්ම තම තමන්ගේ දැනුම

වර්ධනය කරගැනීම සඳහා ද, විද්‍යාත්මක මෙන්ම කලාත්මක දියුණුවක් සමග සමාජයේ පෙරමුණ ගැනීමට ද, මහජන පුස්තකාලය ළමයින්ට මෙන්ම වැඩිහිටියන්ටත් උපකාරී වන ආයතනයක් විය යුතුය.

මහජන පුස්තකාලයක ප්‍රමුඛ සුවිශේෂී අරමුණු ඇතුලත් සම්පූර්ණ ලේඛනයක් තවම බිහිවී නොමැත. අනාගතයේ ද එවැන්නක් බිහි නොවනු ඇත. මක්නිසාදයත් මහජන පුස්තකාලය යනු සමාජයත් සමග කාලෝචිතව වැඩෙන ආයතනයක් වන බැවිනි. එලෙස වර්ධනය නොවන්නේද මහජන පුස්තකාලයට පැවැත්මක් නොමැතිය. එනම් පාඨක අවශ්‍යතාවයන් සමග පෙරට යාමට අපොහොසත් වී වර්ධනය නැවතුන ආයතනයක් බවට පත්වෙයි. එක් එක් මහජන පුස්තකාලයේ සුවිශේෂී අරමුණු ඒ ඒ සමාජ ප්‍රවණතා විසින් මෙහෙයවනු ලබන්නේය. කෙසේ වුවද සෑම මහජන පුස්තකාලයකට ම පොදුවේ ඉටු කරනු ලබන කාර්යයන් අතුරින් කිහිපයක් ඒ ඒ අරමුණු යටතේ පහත දැක්වේ.

1. පාඨක ජනතාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.

- පොත්පත් ඇතුළු දැනුම් ද්‍රව්‍ය පරිශීලනයට මග පෙන්වීම.
- මූලාශ්‍ර වලින් තොරතුරු සපයා ගැනීමට සහය වීම හා තොරතුරු සපයා ගැනීමේ කුසලතා වර්ධනය කිරීම, තොරතුරු මූලාශ්‍ර හඳුන්වා දීම හා ප්‍රචාරණය කිරීම.
- පාඨක විමසීම් වලට ප්‍රතිචාර වශයෙන් සාහිත්‍ය සමීක්ෂණ ආදී වෘත්තීය කාර්යයන් ඉටු කිරීම.

2. පාඨක ජනතාවගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීමට සහාය වීම.

- පාඨ ග්‍රන්ථ, අතිරේක කියවීම් ද්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඇතුළු ඉගෙනුම් සම්පත් හඳුන්වා දීම, මෙහෙයවීම හා සැපයීම.
- වෘත්තීය කුසලතා සඳහා අවශ්‍ය මූලාශ්‍ර සැපයීම හා මග පෙන්වීම.
- ස්වයං අධ්‍යයන කුසලතා වර්ධනයට සහාය වීම හා අවස්ථා නිර්මාණය කිරීම.
- අවිධිමත් අධ්‍යාපන කටයුතුවලට ක්‍රියාශීලිව සහායවීම.
- විධිමත් අධ්‍යාපනයේ නිරතවන්නන් සඳහා අවශ්‍ය සම්පත් සැපයීම.

- විවිධ විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන හා පර්යේෂණ වලට සහායවීම හා සම්පත් සැපයීම.

3. ජනතාවට සිය විවේක කාලය ප්‍රයෝජනවත් අයුරින් ගත කිරීමට මග පෙන්වීම, අවස්ථා සැලසීම හා සහායවීම.

- විනෝදාංශ හා කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය මුලාශ්‍ර හා සම්පත් සැපයීම.
- සමුහ ක්‍රියාකාරකම් ආදී සමාජ සහභාගිත්වය වර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා දිරිමත් කිරීම.
- ගෘහණියන්, දුබලයින්, ආබාධිතයින් ආදී පසුබට සමාජ කොටස් වලට සේවා සැපයීම.
- සමාජයට වැදගත්වන විවිධ කාර්යය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජනතා උනන්දුව අවදි කරවීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, විනෝදාංශ වෘත්තීය කුසලතා ආදිය හඳුන්වාදීම, ඒ සඳහා සමාජය දිරිමත් කරවීම හා සහභාගිත්වය වර්ධනය කිරීම.

4. ජනතාවගේ සංස්කෘතික, සාමාජීය හා සෞන්දර්යාත්මක රුචිකත්වයන් හා ඇගයුම් වර්ධනය කිරීමට උපස්ථම්භකවීම, සහායවීම හා අවශ්‍ය සම්පත් සැපයීම.

- විශිෂ්ට හා සම්භාව්‍ය කෘති, විද්වතුන් ආදී සමාජ ප්‍රගමනයට සහායවන විවිධ සාධකයන් හඳුන්වාදීම හා ඒවා ජනතා අවධානයට ලක් කිරීම.
- පොදු කටයුතු කෙරෙහි ජනතා සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා විවිධ ජන කණ්ඩායම් හා සංවිධාන සමග සාමුහිකව හා සහයෝගිතාවයෙන් කටයුතු කිරීම.
- සෞන්දර්ය ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවාට ජනතා සහභාගිත්වය ලබා ගැනීම.
- පාඨක ජනතාවගේ සාහිත්‍ය, කලා රුචිකත්වයන් වර්ධනය කිරීමට අවශ්‍ය ස්ථානෝචිත හා කාලෝචිත පියවර ගැනීම.
- ජන ජීවිතයට බලපාන විවිධ කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කරවීම මගින් ක්‍රියාශීලි සමාජ ජීවිතයක් ගෙනයාමට ජනතාව මෙහෙයවීම.

- පුස්තකාල වැනි ජන ජීවිතය පෝෂණය කරන ආයතනවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට ජනතාවට දිරි දීම, පෙලඹවීම හා මග පෙන්වීම. ( ගුණසේකර, 1998 )

The Public Library ¦ It’s Origins" Purpose and Significance ys සඳහන් පරිදි මහජන පුස්තකාලයක අරමුණු ලෙස දක්වා ඇත්තේ,

- යාවජීව අධ්‍යාපනයට ඉඩ කඩ ලබාදීම.
- සැම දෙනාටම සියලුම විෂයයන්වල ඇති නව දැනුම ලබාදීම.
- ජාතික, ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් පවත්නා තොරතුරු සම්බන්ධ දේශපාලන වගකීම්වලින් තොරව උපකාර කිරීම හා පක්ෂග්‍රාහී බවින් තොරව සියලු වාර්තා, විවේචන හා අදහස් බෙදාහැරීම.
- පර්යේෂකයන්ට, සැලසුම්කරුවන්ට, තාක්ෂණ විශේෂඥයන්ට අවශ්‍ය නවතම තොරතුරු ලබාදීම.
- මානවයා පිලිබඳ පවතින ලේඛන අනාගත පරපුර උදෙසා අවශ්‍ය සංස්කෘතික වාහක වශයෙන් සහ පර්යේෂණ සඳහා අවශ්‍ය මූලාශ්‍ර වශයෙන් සංරක්ෂණය කොට තැබීම.
- විවේක කාලය නිසියාකාරව ගත කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම.
- සමාජ සුභසාධනය සඳහා සමාජීයකරණය වූ චින්තනයේ නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම. (Murison, 1971)

**පර්යේෂණ පරමාර්ථය හා අරමුණු**

**ප්‍රධාන අරමුණ**

- ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශනය යටතේ ශ්‍රීලංකාවේ මහජන පුස්තකාල සේවය ක්‍රියාත්මක වීම පිළිබඳව අධ්‍යයනය කිරීම.

**උප අරමුණු**

- මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිලිබඳ විමර්ෂණය සහ ඒ සඳහා භෞතික හා මානව සම්පත්වල දායකත්වය ගවේෂණය කිරීම.
- ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී එල්ල වී ඇති බාධා හඳුනාගැනීම හා එම බාධා වලට විසඳුම් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි අධ්‍යනය කිරීම.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේදී පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති මහජන පුස්තකාල තුලින්, ප්‍රදේශය පුරා විසිරි යන පරිදි ප්‍රාදේශීය සභා හත (07) ආවරණය කරමින් තෝරාගත් මහජන පුස්තකාල හත (07) ඔස්සේ ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු 12 යටතේ මෙරට මහජන පුස්තකාල සේවාව පිළිබඳව විමර්ෂණාත්මකව අධ්‍යයනයට ලක් කළ අතර මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදී. මෙලෙස පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගන්නා ලද මහජන පුස්තකාල හත (07) තුල පුස්තකාලයාධිපතිවරුන් වෙත ප්‍රශ්නාවලි ලබා දී දත්ත එක්රැස් කරන ලදී. එමෙන්ම පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් වෙතින් සම්මුඛ සකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමවේදයන් මගින් තොරතුරු ලබා ගැනීම සිදු විය. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා විග්‍රහගත ප්‍රශ්ණාවලියක් සැලසුම් කරන ලද අතර අවශ්‍ය කරණු වඩ වඩාත් තහවුරු කරගැනීම සඳහා දුරකථන සංවාද ඔස්සේ පුස්තකාලයාධිපතිවරුන්ගෙන් තොරතුරු රැස් කර ගන්නා ලදී. පර්යේෂණයෙහි ද්විතීක දත්ත රැස් කිරීම සඳහා පොත් සඟරා පර්යේෂණ ලිපි වෙබ් අඩවි පරිශීලනය කරන ලදි. ප්‍රශ්ණාවලි මගින් ලද තොරතුරු Google spread sheet MS Excel 2016 මෘදුකාංග යොදාගනිමින් වගු ප්‍රස්ථාර යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදී.

**අධ්‍යයන ප්‍රතිඵල**

**01. පුස්තකාල කාර්යමණ්ඩල තොරතුරු**

මහජන පුස්තකාල සේවා සැපයීමේදී පුස්තකාල කාර්යමණ්ඩලයේ දායකත්වය ඉතා වැදගත් වේ. කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් පාඨකයන් වෙත සැපයීම

කාර්යමණ්ඩලය තුලින් අපේක්ෂා කෙරේ. අධ්‍යනය සඳහා තෝරාගත් මහජන පුස්තකාල තුල සිටින කාර්යමණ්ඩල ප්‍රමාණ පිළිබඳව සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණයි. එය පහත වගුවෙන් තවදුරටත් පැහැදිළි කර ගත හැකිය.

| **පුස්තකාලය** | **ප්‍රමාණය** | **ප්‍රතිශතය %** |
|---|---|---|
| ලංකාපුර මහජන පුස්තකාලය | 02 | 11% |
| මැදිරිගිරිය මහජන පුස්තකාලය | 02 | 11% |
| දිඹුලාගල මහජන පුස්තකාලය | 03 | 17% |
| පොලොන්නරුව මහජන පුස්තකාලය | 04 | 22% |
| මින්නේරිය මහජන පුස්තකාලය | 03 | 17% |
| වැලිකන්ද මහජන පුස්තකාලය | 02 | 11% |
| බකමූණ මහජන පුස්තකාලය | 02 | 11% |

*වගුව 1 පුස්තකාල කාර්යමණ්ඩල තොරතුරු*

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය,2022.*

උක්ත දත්ත වලට අනුව තෝරාගත් නියැදියෙහි මහජන පුස්තකාල කාර්යමණ්ඩල ප්‍රමාණ අනුව එහි ප්‍රතිශත පොලොන්නරුව මහජන පුස්තකාලය 22%ක් ද, දිඹුලාගල මහජන පුස්තකාලය සහ මින්නේරිය මහජන පුස්තකාල දෙකෙහි 17%ක් ද, ලංකාපුර, මැදිරිගිරිය, වැලිකන්ද සහ බකමූණ යන මහජන පුස්තකාල තුල එම ප්‍රතිශතය 11%ක් වේ.

**02ග කාර්යමණ්ඩල අධ්‍යාපන තත්ත්වය**

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා හත(07) යටතේ පාලනය වන ප්‍රධාන මහජන පුස්තකාල හත(07) තුල එහි කාර්යමණ්ඩල අධ්‍යාපන තත්ත්වය පිළිබඳව විග්‍රහ කිරීමේදී පුස්තකාලයාධිපතිවරුන් සාමාන්‍ය උපාධි සහ ඩිප්ලෝමා මට්ටමේ වන අතර සහකාර පුස්තකාලයාධිපතිවරු බහුතරයක් ඩිප්ලෝමා මට්ටමේ අධ්‍යාපනික සුදුසුකම් සපුරා තිබෙන අතර පුස්තකාල සහායකවරු අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ මට්ටමේ වන අතර පුස්තකාල කම්කරු සේවක මට්ටම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ මට්ටමේ පවතී. එම කරුණු පහත වගුව තුලින් මනාව ගම්‍ය වේ. ( මහජන පුස්තකාල හත තුල එහි කාර්යමණ්ඩල සාමාජිකයින් 16ක් පහත වගුව තුල බෙදීමකට ලක් කර ඇත.)

| තනතුර | අධ්‍යාපන තත්ත්වය | | | | | |
|---|---|---|---|---|---|---|
| | සා.පෙළ / උ.පෙළ | පුස්තකාල ඩිප්ලෝමා | සාමාන්‍ය උපාධිය | විශේෂ උපාධිය | සමාජීය ශාස්ත්‍රපති | සමාජීය විද්‍යාපති |
| පුස්තකාලයාධිපතිවරුන් සංඛ්‍යාව | | 5 | 2 | | | |
| සහකාර පුස්තකාලයාධිපති වරුන් සංඛ්‍යාව | | 2 | | | | |
| පුස්තකාල සහායක සංඛ්‍යාව | 5 | | | | | |
| පුස්තකාල කම්කරු සංඛ්‍යාව | 4 | | | | | |
| වෙනත් | | | | | | |
| එකතුව | 9 | 7 | 2 | | | |


*වගුව 2 කාර්යමණ්ඩල අධ්‍යාපන තත්ත්වය*

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය,2022.*

## 03ග ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිළිබඳව ඇති දැනුවත්භාවය

මෙහිදී මහජන පුස්තකාලයාධිපතිවරුන්ගෙන් ලබාගත් සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි හරහා ඔවුන්ගේ ඉෆ්ල/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිළිබඳව ඇති දැනුවත්භාවය විශ්ලේෂණය කරන ලදී. එහිදී තෝරාගත් මහජන පුස්තකාල හත (07) අතරින් පොලොන්නරුව මහජන පුස්තකාලය, මින්නේරිය මහජන පුස්තකාලය, මැදිරිගිරිය මහජන පුස්තකාලය සහ දිඹුලාගල මහජන පුස්තකාලය යන පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන් ඒ පිළිබඳව දැනුවත් බවත්, බකමූණ මහජන පුස්තකාලය, වැලිකන්ද මහජන පුස්තකාලය සහ ලංකාපුර මහජන පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන් ඒ පිළිබඳව


නොදැනුවත් බවත් ගම්‍ය විය. ඒ අනුව එහි දත්ත විශ්ලේෂණය පහත ප්‍රස්තාරය තුලින් විග්‍රහ වේ.




*ප්‍රස්ථාර 5-1 මහජන පුස්තකාල කාර්ය සාධන කරුණු පිළිබඳව ඇති දැනුවත්භාවය*

*උක්ත දත්ත වලට අනුව නියැදිය ලෙස තෝරාගත් මහජන පුස්තකාල අතරින් ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිළිබඳ දැනුවත් ප්‍රතිශතය 57%ක් වන අතර දැනුවත් නොමැති ප්‍රතිශතය 43%ක් බව ගම්‍ය වේ.*


## 04. පුස්තකාල සේවාවන් සැපයීම සඳහා භාවිතා කරනු ලබන සන්නිවේදන මාධ්‍ය




*ප්‍රස්ථාර 5-2 සන්නිවේදන මාධ්‍ය භාවිතය*

පුස්තකාල සේවාවන් සැපයීම සඳහා නියැදියේ සියලු ම පුස්තකාල මුද්‍රිත මාධ්‍ය භාවිතා කරනු ලබයි. මැදිරිගිරිය මහජන පුස්තකාලය, පොළොන්නරුව මහජන පුස්තකාලය, මින්නේරිය මහජන පුස්තකාලය තම පුස්තකාල සේවාවන් සැපයීම සඳහා අන්තර්ජාලය භාවිතා කරනු ලබන අතර විද්‍යුත් මාධ්‍ය සහ වෙනත් මාධ්‍යයන් භාවිතයක් සිදු නොවේ. මෙය ප්‍රතිශතයක් ලෙස ගත් කළ මුද්‍රිත මාධ්‍ය භාවිතය 100% ද, අන්තර්ජාලය භාවිතය 43% ද විද්‍යුත් මාධ්‍ය භාවිතය 0%ක් ද, වෙනත් මාධ්‍යන් භාවිතය 0% ද, ලෙස දැක්විය හැකිය.


**05. පුස්තකාල සේවා සැපයීම සඳහා භාවිතා කරනු ලබන භාෂා මාධ්‍ය**




*ප්‍රස්ථාර 5-3 භාෂා මාධ්‍ය භාවිතය*

උක්තයෙහි සඳහන් ආකාරයට සියලුම මහජන පුස්තකාල තම පුස්තකාල සේවා සැපයීම සඳහා සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය භාවිතා කරනු ලබයි. එමෙන්ම වැලිකන්ද මහජන පුස්තකාලය සහ පොළොන්නරුව මහජන පුස්තකාලය තම සේවාවන් දෙමළ භාෂා මාධ්‍ය භාවිතය තුලින්ද ලබා දෙන අතර කිසිඳු පුස්තකාලයක් වෙනත් භාෂා මාධ්‍යක් භාවිතා කරනු නොලැබේ. (4.22 වගුව) මෙය ප්‍රතිශතයක් ලෙස ගත් කළ සිංහල මාධ්‍ය භාවිතා කරන 100% ද, ඉංග්‍රීසි මාධ්‍ය භාවිතා කරන 100% ද, දෙමළ භාෂා මාධ්‍ය භාවිතා කරන 29% ද, වෙනත් භාෂා මාධ්‍ය භාවිතා කරන 0% ද ලෙස දැක්විය හැකිය.


**06. මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු සහ අභියෝග**




*ප්‍රස්ථාර 5-4 ගැටලු සහ අභියෝග*

උක්තයෙහි සඳහන් ආකාරයට සියලුම මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය සම්පත් හිඟතාවය, භෞතික සම්පත් හිඟතාවය, මානව සම්පත් හිඟතාවය, කාර්යමණ්ඩල දැනුම හා පුහුණුව ප්‍රමාණවත් නොවීම, කාර්යමණ්ඩල ආකල්පමය ගැටලු මෙන්ම පාඨක ආකල්පමය ගැටලු ඒ අතරින් බහුලව දක්නට ලැබේ. තෝරාගත් මහජන පුස්තකාල ප්‍රතිචාරයන් හා විග්‍රහ කිරීමේදී 31%ක ප්‍රතිශතයක් මූල්‍ය සම්පත් හිඟතාවය මෙන්ම 30%ක ප්‍රතිශතයක් භෞතික සම්පත් හිඟතාවය ලෙස දක්වා තිබේ. මානව සම්පත් හිඟතාවය, කාර්යමණ්ඩල ආකල්ප සහ පාඨක ආකල්පමය ගැටලු පවතින බව 13%ක ප්‍රතිශතයක් දක්වා තිබේ. කාර්යමණ්ඩල දැනුම සහ පුහුණුව ප්‍රමාණවත් නොවීම සහ වෙනත් ගැටලු 0%ක ප්‍රතිශතයක් ගනු ලබයි.

### 07. මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු ක්‍රියාත්මක කිරීමේදී කාර්යය මණ්ඩලයෙන් සහ මව් ආයතනයෙන් ලැබෙන දායකත්වය




*ප්‍රස්තාර 5-5ගැටලු සහ අභියෝග*

ඉෆ්ලා/ යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු ක්‍රියාත්මක කිරීමේදී පුස්තකාල කාර්යමණ්ඩලයෙන් සහ මව් ආයතනයෙන් ලැබෙන දායකත්වය පිලිබඳව උක්ත දත්ත ඇසුරින් විග්‍රහ කිරීමේදී තෝරාගත් මහජන පුස්තකාල අතරින් 28%ක ප්‍රතිශතයක් "ඉතා හොඳයි" යනුවෙන් ද, 29%ක ප්‍රතිශතයක් "හොඳයි" යනුවෙන් ද, 43%ක බහුතරයක් "සාමාන්‍ය" යනුවෙන් ද ප්‍රතිචාර දක්වා තිබේ. "දුර්වල" සහ " ඉතා දුර්වල" මට්ටම් පිළිබඳව 0%ක අගයක් ගනු ලබයි.

## නිගමන

අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාල වල පුස්තකාලයාධිපතිවරුන් සහ කාර්ය මණ්ඩල විසින් පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක කරන අතර ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිළිබඳව දැනුවත්භාවයෙන් සහ අවබෝධයෙන් යුතු මහජන පුස්තකාලයාධිපතිවරු ප්‍රමාණය 57%ක් පමණ වන අතර 43%ක පමණ ප්‍රතිශතයක් ඒ පිළිබඳව දැනුවත් භාවයකින් තොරව තම සේවාවන් ක්‍රියාත්මක කරන ආකාරයක් දක්නට ලැබේ. තෝරාගත් නියැදියට අනුව ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාලවල පුස්තකාල සේවාවන් ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු වලට අනුව සේවාවන් ක්‍රියාත්මක කිරීමේ දී මූලික මහජන පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක කරනු ලැබුවද නිසි අවබෝධයකින් යුතුව මෙහෙවර ප්‍රකාශන කරුණු වලට අනුව මහජන පුස්තකාල සේවාව ක්‍රියාත්මක වන්නේ ඉතා දුර්වල මට්ටමකින් වීම කැපී පෙනෙන කරුණකි.

බහුතර මහජන පුස්තකාල ප්‍රමාණයකට මූල්‍ය හිඟතාවය, භෞතික සම්පත් හිඟතාවය හා මානව සම්පත් හිඟතාවය ආදිය ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු වලට අනුකූලව පුස්තකාල සේවාවන් සැපයීමේදී එහි ක්‍රියාකාරිත්වයට එල්ල වී ඇති ප්‍රධානතම බාධක වේ. එමෙන්ම පුස්තකාල කාර්යමණ්ඩල දැනුම හා පුහුණුව ප්‍රමාණවත් නොවීම ද තවත් එක් ගැටලුවකි. එමෙන් ම පුස්තකාල සේවාවන්හි ක්‍රියාකාරිත්වය සඳහා එල්ල වී ඇති අනෙකුත් බාධාවන් ලෙස අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම්, චක්‍රලේඛවල පවතින දුර්වලතා, මව් ආයතනයෙන් ලැබෙන සහාය ප්‍රමාණවත් නොවීම මෙන්ම වෘත්තිමය වශයෙන් පුස්තකාලයාධිපතිවරුන්ට සමාජයේ පවතින පිළිගැනීම ප්‍රමාණවත් නොවීම ආදිය පෙන්වා දිය හැකිය. තෝරාගත් නියැදිය අධ්‍යයනයේදී ලබාගත් සම්මුඛ සාකච්ඡා

හරහා මනාව ගම්‍යමාන වන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන්ට සහ කාර්යමණ්ඩල සඳහා ලැබෙන පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් නොවන බවත් එහිදී ඉෆ්ලා/යුනෙස්කෝ ප්‍රඥාප්තීන් තුල සඳහන් මහජන පුස්තකාල මාර්ගෝපදේශයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති බවත්ය. එහිදී ඉෆ්ලා/යුනෙස්කෝ මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු පිළිබඳව ප්‍රමාණවත් තරම් අවබෝධයක් බහුතරයක් වූ පුස්තකාලයාධිපතිවරුන් සහ කාර්යමණ්ඩල සඳහා නොමැති බව නිගමනය කල හැකිය.

## නිර්දේශ

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල මගින් ලබා දෙන පුස්තකාල සේවාවන් සැලසුම් සහගතව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා මාර්ගොපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය. මහජන පුස්තකාලයක පැවැත්ම රඳා පවතින්නේ පුස්තකාල සේවාවේ ක්‍රියාකාරිත්වය මතය. එම නිසාවෙන් පුස්තකාල සේවාවන් මනා සැලසුමකින් යුතුව ක්‍රියාත්මක කිරීම කළ යුතුය. මහජන පුස්තකාල මගින් ලබා දෙන පුස්තකාල සේවාවන්හි අන්තර්ගතය විධිමත් පරිදි සකස් කල යුතු අතර ඒ සඳහා පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ උපදෙස් හා අධීක්ෂණය ලබා ගනිමින් ගුණාත්මක බවින් පිරිපුන් පුස්තකාල සේවාවක් පාඨකයාට ලබා දිය යුතු වෙයි. ඉෆ්ලා/යුනෙස්කෝ ප්‍රඥාප්ති ආශ්‍රයෙන් මහජන පුස්තකාල සේවාවන් සඳහා වූ මාර්ගෝපදේශයන් පිළිබඳව මෙරට මහජන පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන් සහ කාර්යමණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මහජන පුස්තකාල තුල මහජන පුස්තකාල මෙහෙවර ප්‍රකාශන කරුණු වලට අනුකූලව පුස්තකාල සේවාවන් සිදු කිරීමේදී එහි ක්‍රියාකාරීත්වයට එල්ල විය හැකි බාධා මඟහරවා ගැනීමට කටයුතු කළ යුතු වෙයි. විශේෂයෙන්ම පුස්තකාල සේවාවන්ට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මව් ආයතනය මත පමණක් පදනම් නොවී ප්‍රදේශයේ ධනපතියන්ගෙන්, පෞද්ගලික ආයතන වලින්, පොත් ප්‍රකාශකයින්ගෙන්, ප්‍රදේශයේ ජනතාව හා එක්ව මුදල් ඉපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදී විවිධ ක්‍රම මගින් මූල්‍යමය වශයෙන් පවතින බාධාවන් මඟහරවා ගත යුතු වේ.

## විමර්ශන

Aldershot, Ray Prytherch (1987), Harrold’s Librarian Glossary and Reference Book, Gorwer.

Blurton,c. (1999). New direction in education, in UNESCO’s world communication and information 1999-2000, UNESCO, Paris.

Harrold, L.A. (1997), Harrold’s Librarian Glossary.

Latimer, K. (2007) Users and Public Space: What to Consider When Planning Library Space, Berlin, New York (Walter de Gruyter – K.G. Saur): IFLA Library Building Guidelines: Developments & Reflections.

Mccabe, G.B., & Kennedy, J.R. (2003). Planning the Modern Public Library Building, London: The Libraries Unlimited Library Management Collection.

අමරසිංහ,එන්, සංස් (1987) මහජන පුස්තකාල ප්‍රමිති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ.

අමරසිරි,උපාලි(2005) පොත්ගුල් රැකගැනීම සඳහා යුනෙස්කෝ සංවිධානයේ කාර්යභාරය, පුස්තකාල ප්‍රවෘත්ති,

අලහකෝන්, උදිත පරි.(2003), මහජන පුස්තකාල සේවාව, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ.

වීරසිංහ, එම්.එම්.කේ (2000) පොතපත වතගොත, කර්තෘ, දළුගම.

# Human libraries representing the humans in place of books: an orverview on the human libraries as a new approach in the field of libraries

**Wijerathna M.G.H.K**

erandakaushalya1@gmail.com

Department of Library and Information Science, University of Kelaniya, Sri Lanka

## *Abstract*

*Libraries are the main institutions that continue to provide that blood to the people. At present, when libraries are considered, libraries have been created which provide information that is not limited to any physical space. Today, along with the development of modern technology, new concepts have entered the field of libraries. Instead of traditional libraries, library concepts such as digital libraries, virtual libraries, and green libraries have emerged. A concept not second to these concepts has recently entered the field of library science. That is the concept of human library. The concept of human library is one of the most unique concepts that is developing in the world today. There are no books in these human libraries. There are only people. The main objective of this is to positively change individual behavior, attitudes, and thoughts using language and library mechanisms. Through this article the human library, the characteristics of human library, human books, international human library concept, human library programs operating in Sri Lanka, importance of using human library concept in Sri Lanka have been focused.*

***Keywords*** *: Library Services, Human Library, Human Book, Reader Service, Library System*

## හැඳින්වීම

### මානව පුස්තකාල

පුස්තකාල යනු පාඨකයින්ට කියවීමට අවශ්‍ය පොත් පත්, අධ්‍යනය කිරීමට හා හුවමාරු කර ගැනිමට තොරතුරු ලබා දෙන ස්ථානයකි. එහිදි පාඨකයා කියවන්නේ පොත ලියා ඇති ආකාරය වේ. නමුත් මානව පුස්තකාලය යනු සැබෑ පොත්, සජීවි පොත් සමග පාඨකයන්ගේ අදහස් හා තොරතුරු සංවාදයක ස්වරූපයෙන් හුවමාරු කර ගන්නා ස්ථානයකි. මානව පුස්තකාල සංකල්පය ලොව පුරා ජනප්‍රිය වෙමින් පවතින අතර බොහෝ විට සම්ප්‍රදායික පුස්තකාල විසින් සත්කාරත්වය සපයන අතර විවිධ ප්‍රජා සංවිධාන සැකසුම් තුළ සිදු විය හැකිය. මානව පුස්තකාලවල දේශීය ඉතිහාසය හා සංස්කෘතික උරුමයන් සඳහා නව ප්‍රවේශයක් ලබා දෙන අතරම නව ආකාරයේ දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනිමේ හැකියාව ඇත.

කෘතිම බුද්ධිය යොදාගෙන දැනුම මෙහෙයවන ක්‍රමයක් පසුපස මිනිසා හඹා ගිය ද සියල්ලටම වඩා මනුෂ්‍ය බුද්ධිය තවමත් ඉදිරියෙන් සිටින්නේ කෘතිම බුද්ධිය නිර්මාණය කරන්නේ ද මනුෂ්‍ය බුද්ධිය නිසාවෙනි. මෙම බුද්ධිමය සංදර්භය තුළ ගොඩනැගෙන්නාවූ ලෝකයේ නවතම පුස්තකාල සංකල්පය වනුයේ මනුෂ්‍ය පුස්තකාල නැතිනම් Human Library යන සංකල්පයයි. මෙම සංකල්පය REAL PEOPLE REAL CONVERSASION යන තේමාව ඔස්සේ රටවල් 70 ට වැඩි ප්‍රමාණයක් අදවන විට ඔවුන්ගේ පුස්තකාල සේවාවන් කරනු ලැබේ. කෙසේ වෙතත් කෙටි හමුවීමකින් ලෝකය වෙනස් ආකාරයට බැලීමට ඇති අවස්ථාවක් ලෙස Karen Bardonaro විසින් මානව පුස්තකාල සංකල්පය අර්ථ දක්වා ඇත. එනම් විනාඩි 30 ක වැනි සංවාදයක නිරතවන අතර ඒ හරහා ඔවුන්ගේ ජීවිතය තුළ පරාවර්තනිය වෙනසක් ඇති කර ගැනිමට හැකි වේ .

කෙනෙකුගේ ආකල්ප වෙනස් කිරීමේ ක්‍රමයක් ලෙසත් අන්තර් කණ්ඩායම් සබඳතා වර්ධනය කිරීමටත් සමාජ දූරස්ථභාවය අවම කිරීම සඳහාත් මානව පුස්තකාල ප්‍රයෝජනවත් විය හැකිය (Groyecka etal , 2019). මානව පුස්තකාලය යනු ප්‍රජා සමාජිකයන්ගේ බාධක බිඳ දැමීමට සහ එකින්නෙකාගේ අත්දැකීම්වලින් ඉගෙනීමට සම්බන්ධ කර ගැනිම සඳහා නිර්මාණය කර ඇති සිදුවීමය (Watking , 2004). හයිද්‍රාබාද්හි මානව පුස්තකාල නිර්මාතෘ හාර්ෂාඩ් ඩින්කර් ෆාඩ්ට අනුව මානව

පුස්තකාලය අසිරු ප්‍රශ්න අපේක්ෂා කරන, අගය කරන සහ පිළිතුරු සපයන ස්ථානයක් ලෙස හඳුන්වා ඇත. තවද ඇමරිකානු පුස්තකාල සංගමයේ මහජන පුස්තකාල වෙබ් පිටුවෙහි Programming Library ලිපිය හරහා මානව පුස්තකාල අර්ථ විග්‍රහ කර ඇත්තේ මානව පුස්තකාල යනු ජීවමාන හුස්ම ගන්නා පුස්තකාලයක්වන අතර කතා ඔවුන්ගේ ජීවිත වන බව දක්වා ඇත.

මානව පුස්තකාල සංකල්පය 2000 දි ඩෙන්මාර්කයේ ආරම්භ විය. එහි ආදර්ශ පාඨය වන්නේ 'යමෙකු විනිශ්චය කිරිම යන්නයි' නිවාස නැතිකම, විකල්ප ජීවන රටාවන්, ආබාධිතයන් වැනි සමාජ තත්ත්වයන්ගෙන් අගතියෙන් මිදිමට උචිත ස්ථානය මානව පුස්තකාලය වේ (Bordonaro , 2020 ) . මෙම මානව පුස්තකාල යනු ලාභ නොලබන සමාජ සම්බන්ධතා ශක්තිමත් කරවන සමානාත්මතා ව්‍යාපෘතියක් වන අතර මහජනතාවට නොමිලේ සේවය සපයනු ලැබේ (මානව පුස්තකාල සංවිධානය, 2020). මෙය සංවිධානය කිරිම සඳහා අධික මුදල් ප්‍රමාණයක් වැය කිරිමට අවශ්‍ය නොවේ. සුපිරි වෙළඳසැල් , දුම්රිය ස්ථාන හෝ ජනාකිර්ණ ප්‍රදේශවල පුස්තකාල සංවිධානය කිරිම ඉතා සුදුසු වේ (අරුණැල්ල, 2019) . මෙම මානව පුස්තකාල සංකල්පය හරහා මිනිසුන්ගේ ආකල්ප , සිතුවිලි , සංජානනය සහ හැසිරීම් ධනාත්මකව වෙනස් කිරිමටත් ඒ හරහා ගෞරවනීය සංවාදයක් ඇති කිරිමටත් මානව පුස්තකාල හරහා හැකියාව ලැබේ .

## මානව පුස්තකාලයෙහි ලක්ෂණ

බොහෝ පුස්තකාල අදවන විට ඩිජිටල් සංකල්පය ක්‍රියාත්මක වේ. එහිදි e- books , e- journals , mp3 players වැනි දෑ එහි අන්තර්ගත විය හැකි ය. නමුත් අපහට මානව පුස්තකාල හරහා සජිවි තොරතුරු මුලාශ්‍රයන් ඔස්සේ ඒකරාශි වි අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනිමට හැකි ය. මානව පුස්තකාල හරහා ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරිම සන්නිවේදනය දිරිමත් කිරිම හා අගතිය තුරන් කිරිම සිදු වේ . විවිධ පුද්ගලයන් දැන හඳුනා ගැනිමට ද මෙය අවස්ථාවක් වන්නේ ය. මානව පුස්තකාල පිළිබඳ සංකල්පය ඉතා සරලය. පොතක් එහි කවරයෙන් විනිශ්චය කරනවා වෙනුවට අද්විතිය ජීවන අත්දැකිම් රැස් කරගත් කතන්දර ඇති පුද්ගලයෙකු ඔබට නොමිලේ ලබා ගත හැකි ය. ඒ හරහා ඔබගේ ගැටලුවලට පිළිතුරු ලබා ගත හැකි ය.

මානව පුස්තකාල යනු දුෂ්කර ප්‍රශ්න අපේක්ෂා කරන , අගය කරන ස්ථානයකි. මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍යයෙන් එකිනෙකා එකා සමග කතා කිරීමට අවස්ථාවක් නොමැති පුද්ගයින් අතර ඵලදායි පුද්ගලික සංවාදයකට පහසුකම් සැලසීම සහ එම නිසා පොදු අගතින් හා ඒකාකෘතිවලට අභියෝග කිරීමයි. මානව පුස්තකාල යනු මිනිසුන්ගේ පුස්තකාලයකි. එය පොත් සමග මිනිසුන් ආදේශ වේ.

මානව පුස්තකාල සංවිධානය විසින් මානව පුස්තකාලයේ ඉලක්කයන් (Goals of Human Library) ඉදිරිපත් කර තිබේ .

- සංවාදයේ සහ අවබෝධයේ අවකාශයන් නිර්මාණය කිරීම .
- මානව අයිතින්ට ගරු කිරීම , ප්‍රවර්ධනය කිරීම.
- වෙනස් කොට සැලකීම , ඒකාකෘතිකරණය , අගතිය බැහැර කිරීම.
- දැනුම හා අත්දැකීම් හරහා පුද්ගලයින්ගේ අභිවෘද්ධිය වර්ධනය කිරීමට හැකි වීම.
- අනෙකා කෙරෙහි විවෘතභාවය සහ පිළිගැනීම පිළිබඳ ආකල්ප හැඩගැස්ස වීම සිදු වේ .

මෙවැනි ඉලක්කයන් පදනම් කර ගනිමින් මානව පුස්තකාල සංකල්පය බිහි වී ඇති බව මානව පුස්තකාල සංවිධානය සඳහන් කරනු ලැබේ .

මානව පුස්තකාලවල සංවාදවල යෙදෙන පුද්ගලයින් පොත් කියවා සාකච්ඡා කර සමාන අදහස් ඇති පාඨකයින් සමග ඔවුන්ගේ අදහස්, තොරතුරු හා අත්දැකීම් බෙදා ගනු ලැබේ. මානව පුස්තකාලවල සහභාගිවන්න් එක් පදනමක් මත සංවාදවල යෙදීමට සහ කතා බෙදා ගැනීමට ලැයිස්තුවක් තෝරා ගත හැකි ය. මෙහිදී එකම ජීවමාන පොතක් තෝරා ගැනීමට දෙදෙනෙකුට හෝ කිහිප දෙනෙකුට හැකි ය (Sharda & Rao ,2020) . සුළුතර කණ්ඩායම් හා විවිධත්වය කෙරෙහි කෙනෙකුගේ ආකල්ප වෙනස් කිරීමේ ක්‍රමයක් ලෙස මෙම මානව පුස්තකාලයේ ඵලදායිතාවය ඉවහල් වේ (Miliken , Bartel & Kurtzberg ,2003 ). මානව පුස්තකාල ක්‍රමය සමාජයේ විවිධ සුළු ජාතින්ගේ නියෝජිතයන් එක්රැස් කිරීම සඳහා ගෝලීය වශයෙන් මර්දනකාරී මෙවලමක් ලෙස භාවිත කරනු ලැබේ. ඔවුන් ස්වේච්ඡාවෙන් ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට ගෞරවය මත පදනම් වූ ක්‍රියාකාරී සංවාදයක් භාවිත කරමින් අගතින් මඟ හරවා ගැනීමට අන් අයට උපකාරී කරනු ඇත (ප්‍රසාදනී

සහ රිවේරා , 2007). මෙම වැඩසටහන් පුස්තකාල සඳහා ධනාත්මක මහජන සම්බන්ධතා ලෙස ක්‍රියා කරයි. පුස්තකාලය තුළ මහජනයා නැවත තහවුරු කිරීමට මානව පුස්තකාල ඉවහල් වේ . ප්‍රජා සම්බන්ධතා සහ සහජීවනය වර්ධනය කිරීමේ අනිවාර්යය අංගයක් ලෙස දැක්විය හැකි ය.

The Hindu පුවත්පතේ Read the Humans : Human Library .ලිපිය තුළ සඳහන් කරනුයේ මානව පුස්තකාල සැලසුම් කර ඇත්තේ සංවාද තුළින් ඒකාකෘති හා අගතියට අභියෝග කළ හැකි සංවාද හා ධනාත්මක රාමුවක් ගොඩනැගීම සඳහා වන බවයි. අන් අයගේ වෙනස්කම් අගය කිරීමටත් ඔවුන්ගේ අත්දැකීම්වලට සවන්දෙමින් හා සම්බන්ධ වෙමින් සමාජ බාධක තේරුම් ගැනීමට උපකාරී වන බවයි. මානව පුස්තකාල සංවිධාන වෙබ් පිටුව තුළ සඳහන් වන පරිදි මානව පුස්තකාලය වසර ගණනාවක් තිස්සේ වැඩිහිටියන් සඳහා පැවති අතර එය පළමු වරට ළමුන් සඳහා පවත්වා ඇත. ළමයින්ට හා වැඩිහිටියන්ට වඩා ක්ෂණිකව ලෝකය  ගැන කුතුහලයක් ඇත. ඒ අනුව 2019 දී ජූලි 23 වන දින කෝපන්හේගන්වල පළමු මානව පුස්තකාලය එළි දක්වා ඇත.

**මානව පොත්**

පොත යනු මානව වර්ගයා උදෙසා මානව වර්ගයා විසින් නිර්මාණය කළ සුවිශේෂී මෙවලමකි . (වීරසූරිය , 2018 ). සම්ප්‍රදායික පුස්තකාලය තුළ පොත මෙලෙස නිර්වචනය කළ ද මානව පුස්තාලය තුළ තිබෙන මානව පොත ඉතාමත් සුවිශේෂී වන්නේ ය. මානව පුස්තකාලය තුළ මානව පොත් යනු ප්‍රජාව තුළ අපකීර්තියට පත් වූ කණ්ඩායමක් නියෝජනය කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුද්ගලයෙකු වන අතර ඔවුන්ගේ පෞද්ගලික අත්දැකීම් මත පදනම්ව යම් මාතෘකාවක් පිළිබඳව පවසන හෝ තේරුම් ගෙන ඇති දේ අභියෝගයට ලක් කිරීම සඳහා පාඨයන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකි ය (මානව පුස්තකාල සංවිධානය,2020). මෙය සජීවී පොත් , මිනිස් පොත් යන නම්වලින් ද බොහෝ පර්යේෂණ ලිපි හා සාහිත්‍ය ගවේෂණ තුළ සඳහන් කර තිබේ .

ඩෙන්මාර්කයේ ආරම්භ වූ මානව පුස්තකාලය 'මම විවෘත පොතක් ' යන වාක්‍ය කාණ්ඩයට අරුතක් සපයනු ලැබේ . මානව පුස්තකාලය අද්විතීය ජීවන කතා ඇති අය මෙහි ස්වේච්ඡා පොත් ලෙස වේ. නිශ්චිත කාලයක් තුළ ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසීමට , ඔවුන්ගේ කතාවලට සවන්දිය හැකි වේ. එම පොත් සිත් ඇඳගන්නා සුලු

හා සුහදශීලිය ය. එහිදි ඔබට සරණගාතයෙකු හා සමග කතා කළ හැකි ය. PISD රෝගයෙන් පෙළෙන සොල්දාදුවෙක් , නිවාස නැති පුද්ගලයෙක් , HIV රෝගයට ලක් වුවන් වැනි අය මෙහි මානව පොත් ලෙස කටයුතු කරනු ලැබේ (Dobreski & Huang , 2015 ). ඒ අනුව ජීවිතයේ විවිධ අභියෝගයන්ට ඉතාමත් සාර්ථක අයුරින් මුහුණ දුන් පුද්ගලයින් තම අත්දැකීම් ඇසුරු කර ගනිමින් පාඨකයා නොහොත් සහභාගිවන්නා සමග සිය අත්දැකීම් , අදහස් හා තොරතුරු හුවමාරු කරගනිමින් ඔවුන්ට ද සිය අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන්නට මනා වු ප්‍රේරකයක් මෙම මානව පුස්තකාලයෙහි මානව පොත් හරහා ලබා දෙනු ලැබේ .

මෙම පොත් කතන්දර සිත් ඇද ගන්නා සුලු හා හද කම්පා කරවන ඒවා දක්වා විහිදේ . මානව පුස්තකාල සංවිධානයේ එකම පරමාර්ථය වන්නේ පොතක් එහි කවරයෙන් හෝ එහි මාතෘකාව හෝ ලේබලය මගින් ඔබට සැබවින්ම විනිශ්චය කළ නොහැකි බව මිනිසුන්ට පෙන්වීමට එය උපකාරී වේ. . ජීවමාන පොත් නළුවන් නොවන අතර මානව පුස්තකාලය ඔවුන්ගේ සාකච්ඡා මත පදනම් වුවකි. මොවුන් නළුවන් නොවනුයේ ඔවුන්ගේ සැබෑ අත්දැකීම්වලට මුහුණ දුන් පිරිසක් වන නිසා ය.

මෙහිදි මානව පුස්තකාල සංවිධානයේ මානව පොතක් විමට මාර්ගගත අයදුම් පත්‍රය පුරවා පාඨකයන් හමු විමට කැමති දැයි , ඔබට බෙදා ගත යුතු අත්දැකීම් මොනවාදැයි මානව පුස්තකාල සංවිධානයට පැවසිය යුතු ය. එවිට සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර සියල්ල හොඳ සුදුසුකම් සේ පෙනේ නම් , ඔබට නව පොතක් සඳහා පුහුණුක් වෙනුවෙන් ආරාධනා කරනු ලැබේ . එම පුහුණුව අවසානයේ ප්‍රකාශන හැකියාව තක්සේරු කරන්නේ ය. සියල්ල හොඳින් සිදු වේ නම් මානව පුස්තකාලයේ සත්කාරත්වයේ සිදුවිම් සඳහා ආරාධනා කරන්නේය. මෙලෙස වු ක්‍රියාවලියක් ඔස්සේ මානව පොතක් විමේ හැකියාව ඇත. ඕනෑම පුද්ගලයෙකුට මානව පොතක් විය හැකි අතර ඒ සඳහා උක්ත සඳහන් කළ සුදුසුකම්වලින් ද පරික්ෂණවලින්ද සමන්විත විම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. මෙම මානව පුස්තකාලය තුළ ඇති මානව පොත් සඳහා කිසිදු මුදලක් ලබා නොදෙන අතර එය සමාජ ස්වේච්ඡා සේවාවක් ලබාදෙන පුද්ගලයින් ලෙසට මෙම මානව පොත් තවදුරටත් මානව පුස්තකාල වෙබ් පිටුව තුළ විග්‍රහ කර තිබේ .

මානව පොතක් ලබා ගන්නා අයුරු මානව පුස්තකාල සංවිධානය ඉතාමත් සරලව පහත පරිදි ඉදිරිපත් කර තිබේ .

1. මානව පුස්තකාලය පැවැත්වෙන ස්ථානය වෙත යන්න .
2. සුචිකරණය / නාමාවලිය (catalog) පරික්ෂා කර පොතක් තෝරා ගන්න .
3. (මානව පුස්තකාලව පැවැත්වෙන ස්ථානයට පිවිසි විට මානව පොත් හා එහි විස්තර ප්‍රදර්ශන පුවරු ඔස්සේ ප්‍රදර්ශනය කර තිබේ. )
4. ඉන් අනතුරුව මානව පුස්තකාල මේසේ ලියාපදිංචි වන්න
5. (මෙහිදි මානව පුස්තකාල මේසය තුළ මානව පුස්තකාල වැඩසටහන සංවිධාන කරන පිරිස් සිටිනු ලැබේ)
6. එහිදි එම වැඩසටහන සංවිධානය කරනු ලබන ස්වේච්ඡා සේවකයෙකු ඔබව මානව පොතට හඳුන්වා දෙනු ලැබේ .
7. පොත හා සමග කතා කිරිමට විනාඩි 20 ක කාලයක් ලබා දෙනු ලැබේ.
8. ඔබට උදව් අවශ්‍ය නම් පරිවර්තකයෙකුගේ සහාය ද ලබා ගත හැකි ය.
9. (මානව පොත් සහ පාඨකයා / සහභාගිවන්නා අතර පොදු භාෂාවක් නොදන්නේ නම් පරිවර්තකයෙකුගේ සහාය ද ලබා ගත හැකි ය.)

මිට අමතරව මානව පුස්තකාල සංවිධානය විසින් මානව පොත් සහ පාඨකයන් අතර අයිතිවාසිකම් කිහිපයක් ඉදිරිපත් කර තිබේ .

- පොත් සහ පාඨකයින්ට ගෞරවයෙන් සැලකිමට අයිතියක් ඇත.
- ඕනෑම ප්‍රශ්නයක් ඇසිමට පොත් සහ පාඨකයින්ට අයිතියක් ඇත.
- අවශ්‍ය නැතිනම් ප්‍රශ්නයකට පිළිතුරු නොදී සිටිමට පොත් සහ පාඨකයින්ට අයිතියක් ඇත.
- පොත් සහ පාඨකයින්ට අවශ්‍ය නම් සංවාදය අවසන් කිරිමට ද අයිතියක් ඇත.

මානව පොත සහ පාඨකයාගේ අයිතිවාසිකම් පිළිබඳව විවිධ පර්යේෂකයින් විවිධ අයුරින් විග්‍රහ කර තිබේ. මානව පොත් විමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අය ,

විශේෂිත පෞද්ගලික අත්දැකීම් හෝ ජීවිතය පිළිබඳව ඉදිරි දර්ශනයක් ඇති අය වන අතර ඔවුන් යම් ආකාරයකින් ඒකාකෘතිකරණයට ලක්ව ඇත. පාඨකයන් යනුවෙන් හැඳින්වෙන ප්‍රජාවේ සෙසු සමාජිකයන් සමග විවෘතව කතා කිරිමට මිනිස් පොත් එකඟ වේ. වැඩසටහනට සහභාගි විමට කැමති ඕනෑම අයෙකුට සම්බන්ධ විය හැකි ය. එක් එක් පොත් සඳහා මාතෘකාවක් සහිත විස්තර සහිත නාමාවලියක් පිරික්සිමෙන් පසුව පාඨකයෙකුට කෙටි කාලයක් සඳහා පරික්ෂා කිරිම සඳහා පොතක් තෝරා ගනියි. පසුව පාඨකයාට පොත හමුවන්නේ එකින් එක සංවාදයන් සඳහා ය. පාඨකයන්ට ප්‍රශ්න ඇසිමට , උපදෙස් ලබා ගැනිමට , විකල්ප ඉදිරි දර්ශන ගැන ඉගෙන ගැනිමට සහ පොදු කරුණු සොයා ගැනිමට හැකි ය. සංවාදවලට නිශ්චිත දිශාවක් නොමැති අතර කාලය ද අද්විතීය වේ (Groyecka etal , 2019 ) .

මානව පුස්තකාලයට පාඨකයෙකු ලෙස හෝ පොතක් ලෙස සහභාගි විමට කිසිම පුද්ගලයෙකුට බල කිරිමක් අවශ්‍ය නොවිය යුතු ය. ජිවමාන පොත් සෑම විටම නියෝජනය කරන්නේ අගතිය , ඒකාකෘතිකරණය වෙනස්කොට සැලකිම සහ වර්ගවාදයට මුහුණ දෙන විවිධ සුළුතරයන් සහ වෙනත් කණ්ඩායම් ය. සමානාත්මතාය ප්‍රවර්ධනය කිරිම පදනම් වි ඇත්තේ ස්වේච්ඡා සේවකයන් මිස මුල්‍යමය වාසි මත නොවන බැවින් ජිවමාන පොත්වලට ගෙවනු නොලැබේ . එක් එක් පුස්තකාලාධිපතිවරයාට සහ සෑම පොතකටම ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ලබා දි ඇති බවටත් , සෑම පාඨකයෙක්ම මානව පුස්තකාල රීති පිළිබඳව දැනුවත්ව සිටින බවටත් වග බලා ගත යුතු වේ.

**ජාත්‍යන්තර මානව පුස්තකාල සංකල්පය**

**ජාත්‍යන්තර මානව පුස්තකාල සංකල්පයෙහි විකාශනය**

මානව පුස්තකාලය යනු මිනිසුන් අතර සංවාදයකට පහසුකම් සැලසිම සඳහා ජාත්‍යන්තර පිළිගත් සිදු විමකි . මානව පුස්තකාල සිදුවිම්වල අරමුණ වන්නේ සහභාගිවන්නන් (පොත් ලෙස හැඳින් වේ) . ස්වේච්ඡාවෙන් තම කතන්දර පැවසිම සහ අනෙකුත් සහභාගිවන්නන් (පාඨකයන් ලෙස හැඳින්වෙන) මෙම පොත් සමග සංවාද පැවැත්විම මඟින් මිනිසුන් අන් අය ගැන ඒකාකෘති හා පූර්ව නිගමන බිඳ දැමිමකි (Ferrara , Kremer and Ghilardi , 2007).

1990 වසරේ ඩෙන්මාර්කයේ කොපන්හේගන් නුවර තරුණ ක්‍රියාකාරී පිරිසක් වූ Dany Abergel , Asma Mouna , Christoffer Erichsen , Ronni Abergal කණ්ඩායමේ මිතුරෙකු 1993 වසරේ පිහි ඇනුමකට ලක් වූ අතර ඔහු එයින් දිවි ගලවා ගන්නා ලදි. මෙයින් පසු මෙම තරුණ ක්‍රියාකාරීන් , තරුණ කණ්ඩායම් අතර ප්‍රචණ්ඩත්වයට එරෙහිව නව මාතයක් ගොඩනැගූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම මානව පුස්තකාල බිහි විය. ඒ අනුව ඔවුන් Stop the violence නම් රාජ්‍ය නොවන සංවිධානය පිහිටුවා ගත් අතර ඔවුන්ගේ අදහස වූයේ ඕනෑම පුද්ගලයෙකු ප්‍රචණ්ඩත්වය සඳහා නැඹුරුතාවයක් පවතින බවයි . ප්‍රතිවාදියා සමග මුහුණට මුහුණලා අදහස් හුවමාරු කර ගැනීමට හැකියාවක් පවතින්නේ නම් දෙපාර්ශ්වය අතර පවතින අදහස් නොගැලපීම ඉවත්කර ප්‍රචණ්ඩත්වය මග හැරිය හැකි බව යි .

2000 ජූලි මාසයේ දි Roskilde උත්සවයේ දි මානව පුස්තකාල සංවිධානය විසින් මානව පොත් 75 ක් පරිශීලනයට අවස්ථාව ලබා දි ඇත . Roskilde උත්සවය යනු මහා පරිමාණ සංගිත උළෙලක් වන අතර යුරෝපයේ සහ ලොව පුරා සියලු දෙනා ආකර්ෂණය කරයි . එම වසරේදි (2000 ) 10 , 000 ට අධික පිරිසක් මෙම උළෙලට සහභාගි වි ඇත . උත්සවය සඳහා නිර්මාණය කරන ලද මෙම උත්සවය සමරනු ලැබූ පළමු මානව පුස්කාලය මෙය වේ . මෙය හරහා ධනාත්මක මතවාදයන් නිර්මාණයට අවස්ථාවක් බිහි වි ඇත (The outsideers , 2016) .

පසුකාලීනව මෙම මානව පුස්තකාල සංකල්පය ලෝකය පුරා ව්‍යාප්ත වූ අතර මේ සඳහා දේශීය පුස්තකාල ක්‍රියාකාරිත්වය හා ඒ තුළින් සපයන සේවා විශාල වශයෙන්




*රූපසටහන 2 මානව පුස්තකාල සංකල්පයේ ව්‍යාප්තිය*

ඉවහල් වි ඇත. ඒ අනුව වර්ධනය වෙමින් 2005 වර්ෂයේදි :ධවැබය්ටැබ ඡමඉකසජ

ඛසඉර්රහ කැඛඵර්ක සහ ඛසඉර්රහ දෙ ෘැඛප්රන ආයතන විසින් පළමු සජීවි පුස්තකාල ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි . 2006 වර්ෂයේ දි ස්වීඩනයේ කසඉර්රහ දෙ ඒකපද ඤසඵහ හිදි ද , 2008 වර්ෂයේදි ඔක්තෝම්බර් මාසයේ ඇමරිකාවේදි ද , මෙලෙස පළමු සජීවි මානව පුස්තකාල පළමු වරට බිහි විය . ඇමරිකාවේ කැලිෆෝර්නියා නගරයේ ිඛජ් ඵදඛසජ් ඡමඉකසජ කසඉර්රහ හි දි පැවති මානව පුස්තකාල හමුවේ සජීවි මානව 14 ක් පරිශීලනයට අවස්ථාව හිමි වු අතර ඛමාසිචී ල ර්මාායසිචී ල ඞැටැජ්රස්ඛ ල උැකක ී නඛදඅඛ චමඉකසියසඛට යදම්ෑ ල ධ්ඃජ් ිපැරසජ්ඛිල යදපැකිෑ අදපැඛ වැනි ක්ෂේත්‍රයන් මේ අතර වේ ඃඅරුැණැල්ල , 2019* වර්තමානයේ මානව පුස්තකාල නිල වෙබ් අඩවියට අනුව අද වනවිට රටවල් 80 ට වැඩි ප්‍රමාණයක මෙම සංකල්පය ව්‍යාප්ත වි ඇත .

**ශ්‍රී ලංකාවේ මානව පුස්තකාල සංකල්පය**

**ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන මානව පුස්තකාල වැඩසටහන්**

මානව පුස්තකාලයක් යනු මිනිසුන් අතර සාකච්ඡාවක් සහ අවබෝධයක් හරහා ඇති කර ගන්නා සංකල්පයකි. එය සම්ප්‍රදායික පුස්තකාලයකට සමානව ක්‍රියාත්මක වන අතර පරිශීලකයන්ට විවිධ ක්ෂේත්‍රයන්හි පොත් සෙවීමට හා කියවීමට ද හැකි ය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අන්තර්ක්‍රියාකාරි ඉගෙනීම දිරිමත් කළත් අධ්‍යන හා සිසුන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමක දක්වා නොවේ . මෙහිදි මානව පුස්තකාල හරහා විෂය විශේෂඥයන් සහ සිසුන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා මානව පුස්තකාල සංකල්පය හඳුන්වා දි ඇති බව සඳහන් කරනු ලැබේ . (Adhikari , Manatunga and Silva ,2016 ) .

H.I.S.M Adhikari , P.K.S Manatunga and M.A.L Silva ' ULA ARSULA ' සඟරාවේ Talk to an expert : a pilot study on Human Library , University of Colombo නම් ලිපිය හරහා පැහැදිලි කරනුයේ , 2016 දි කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයට ඇතුළු වුවන් සඳහා අනුස්ථාපන වැඩසටහනක් අතතුර මෙම මානව පුස්තකාල වැඩසටහන ක්‍රියාත්මක වු බව යි . මෙය ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල පුස්තකාලයක සංවිධානය කරන ලද පළමු අවස්ථාව මෙය වේ යන්න එම පර්යේෂණ ලිපිය තුළ සඳහන් කර තිබේ . මෙය විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ පවත්වා ඇත . මෙහිදි විශේෂඥයන් 17 දෙනෙකු සම්බන්ධ කරගෙන

ඇත . මෙහිදි සෑම කණ්ඩායමක් සඳහාම වෙන් කරන ලද උපරිම කාලය මිනිත්තු 15 – 20 ක් වු අතර නව කණ්ඩායමක් ද ඒ අනුව පවරා ඇත . මෙම වැඩසටහන අවසානයේ දි පරිශිලකයන්ගේ මෙන්ම විශේෂඥයින්ගේ ප්‍රතිපෝෂණ හා යෝජනා ලබා ගෙන ඇත. මෙම පර්යේෂණය තුළ අහඹු ලෙස සහභාගවුවන්ගෙන් (650 ) 15 % ක් නියැදිය ලෙස 100 ක් තෝරාගෙන ඇත . මෙහිදි නියදියෙන් 56 . 62 % ක් මානව පුස්තකාලයේ දි හමු වු නව අත්දැකිම් හා අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳව බෙහෙවින් සැහිමට පත් වි ඇති අතර 48 . 38 % ක් සැහිමට පත් වි ඇත . මෙම මානව පුස්තකාල වැඩසටහනට සම්බන්ධ වු මානව පොත් සඳහන් කරනුයේ තමන් මුහුණ දුන් නව අත්දැකිම් පිළිබඳව බෙහෙවින් සැහිමට පත් වු බවත් අනාගතයේ දි එවැනි උත්සවයන් සඳහා සහභාගි විමට කැමැත්ත ප්‍රකාශ කර ඇත . තවද මෙම පර්යේෂණ ලිපිය හරහා තවදුරටත් පැහැදිලි කරනුයේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පුස්තකාලයක ප්‍රථමවරට පවත්වන ලද මානව පුස්තකාල වැඩසටහන සාර්ථක වු බවත් ය . එසේම මෙම පර්යේෂණය හරහා අධ්‍යයන සිසුන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරිම සඳහා මානව පුස්තකාල පිළිබඳව නව සංකල්පය වෙනත් පහසුකම් සඳහා ඇතුළත් කිරිමට ද අධ්‍යන නිර්දේශ ඉදිරිපත් කර තිබේ . 2016 සිට 2019 දක්වා මානව පුස්තකාල වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන පැමිණ ඇත .

ඉන් අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 60 වැනි සංවත්සරය නිමිති කරගෙන 2019 මාර්තු 27 වන දින මානව පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක වි ඇත (library@sjp.ac.lk , 2020) . මෙහිදි මානව පොත් ලෙස ,

- පුජ්‍යපාද යසස්සි හිමි
- ඌරුවරිගේ වන්නිල ඇත්තෝ
- කෞශල්‍යා ප්‍රනාන්දු
- තිලක් කන්දේගම
- මතුගම සෙනෙවිරුවන්
- සහන් රත්වල

යන සම්පත්දායකයින් සම්බන්ධ වි ඇත . තවද පාඨකයන්ට මෙහිදි එක් සම්පත්දායකයෙකු සමග පැය දෙකක කාලයක් තුළ ඔවුන් හා සංවාදයේ යෙදෙන්නට අදහස් හුවමාරු කර ගැනිමට අවස්ථාව ලබා දි ඇත . මිට අමතරව කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී පාලි විශ්වවිද්‍යාලය තුළ ද නවක සිසුන් බඳවා ගැනිමේ දි අනුස්ථාපන වැඩසටහනක් ලෙස 2019 වර්ෂයේ දි මානව පුස්තකාල සංකල්පය ක්‍රියාත්මක වි ඇත .

විශ්වවිද්‍යාල පුස්තකාල කිහිපයක මෙලෙස මානව පුස්තකාල ලෙස විවිධ මානව සම්පත්දායකයින් සම්බන්ධ කර ගනිමින් මානව පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත . මිට අමතරව මහජන පුස්තකාල තුළ මානව පුස්තකාල යන නම වෙනුවට ඒ හා සමාන ආදේශක නම් යොදා ගනිමින් මානව පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත . එහිදි , Meet an Expert , පොතක් වෙනුවට ඔළුවක් යනාදි විවිධ නම් භාවිත කරමින් මානව පුස්තකාල හා සමාන වැඩසටහන් සජිවි මානව සම්පත්දායකයින් යොදා ගනිමින් පාඨකයින්ට සේවා ලබා දෙන අවස්ථා දක්නට ලැබේ .

මෙහිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ප්‍රථමවරට 2020 සැප්තැම්බර් 08 වන දින Litteracy teaching and learning in the covid 19 crisis and beyond යන මාතෘකාව පාදක කර ගනිමින් නාමලි සුරවිර මහත්මියගේ සහභාගිත්වයෙන් ජාතික පුස්තකාලය තුළ මානව පුස්තකාලය හා සමාන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත . 2020 ඔක්තොම්බර් 09 වන දින Samitha Ehuldoraarachchi සහභාගිත්වයෙන් පැවැත්විමට කටයුතු කළ ද ඒ සඳහා කොරෝනා වසංගත තත්ත්වය ශ්‍රී ලංකාව තුළ සිඝ්‍රවිමක් සමග මෙම වැඩසටහන කල් දැමිමට සිදු වි ඇත.

### ශ්‍රී ලංකාව තුළ මානව පුස්තකාල සංකල්පය යොදා ගැනිමේ වැදගත්කම

පුස්තකාලයක ප්‍රධාන ඉලක්කය වන්නේ පාඨකයා ය. පාඨකයාගේ අවශ්‍යතා සපුරාලිම පුස්තකාලයක ප්‍රධාන ඉලක්කය වන්නේ ය. කාලයත් සමග පුස්තකාල පද්ධතියට නවින සංකල්ප රාශියක් ඒකරාශි වි ඇත. ඒ අතර මෑතකදි පුස්තකාල ක්ෂේත්‍රයට පිවිසි ඉතාමත් වැදගත් සංකල්පයක් ලෙස මානව පුස්තකාල සංකල්පය හඳුන්වා දිය හැකි ය.

මිනිසුන් ගත්විට ඔවුන්ගේ ගැටලු නිරාකරණය කර ගැනිමට නොහැකිව සිරගත වී සිටින්නේ ය. සමාජීය වශයෙන් පිඩාවට පත්වුවන් බෝහෝ දෙනෙක් සිටිති. විවිධාකාරි වූ දරුණු රෝගවලට මුහුණ දෙන පුද්ගලයින්, ආබාධිත පුද්ගලයන් , පිළිකා රෝගින් , HIV, AIDS වැනි රෝගවලට මුහුණ දෙන පුද්ගලයින් සමාජය තුළ සිටිති. ඇතැම් පුද්ගලයින් තමන්ගේ ගැටලු නිරාකරණය කර ගැනිමට නොහැකිව මානසිකව පිඩා විදිති. ඔවුන් පෙළෙන්නාවූ ප්‍රශ්න අනෙක් අය හා සමඟ බෙදා ගැනිමට නොහැකිව හුදකලාව පිඩා විඳින පුද්ගලයන් සමාජය තුළ සිටිති. ඇතැම් තරුණ තරුණයින් , ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම ගැටලු අභියෝගයන්ට මුහුණ දිමට නොහැකිව සියදිවි නසා ගනු ලැබේ. මෙවැනි විවිධාකාරි වූ ගැටලුවලට විසඳුම් සපයන්නට, ඔවුන්ගේ අත්දැකිම් අනෙක් අය හා සමඟ බෙදා ගැනිමට මානව පුස්තකාල හරහා අවස්ථාව උදා කරනු ලැබේ .

මානසික රෝගවලින් පෙළෙන පුද්ගලයින් සාර්ථකව සමාජගත කිරිම සඳහා යොදා ගත හැකි යතුර වන්නේ මානව පුස්තකාලය යි (Kwan ,2020) . එහිදි ඔහු තවදුරටත් පැහැදිලි කරනුයේ මානසික රෝගවලින් සුවය ලැබිමට (සුවය ලැබිමේදි) මිනිසුන් ප්‍රශස්ත ලෙස සමාජගත කිරිමට පහසුකම් සැලසිම සඳහා ප්‍රජා මැදිහත්විමේ උපාය මාර්ගයක් ලෙස මානව පුස්තකාල ප්‍රවේශය හඳුන්වා දිය හැකි බව යි .

ජොහැන්යන්ට අනුව මානව පුස්තකාලය සංවාදය ප්‍රවර්ධනය කිරිම , අගතිය අඩු කිරිම සහ අවබෝධය දිරි ගැන්විම සඳහා නිර්මාණය කරන ලද නව්‍ය ක්‍රමයකි . මෙම තාර්කිකත්වය අනුගමනය කරමින් මානව පුස්තකාල ප්‍රවේශය වෙනත් රටවල ප්‍රවර්ධනය කර විවිධ ක්ෂේත්‍රයන්හි අනුගමනය කර ඇත . එසේම ඇල්පෝර්ට් පවසනුයේ කණ්ඩායම් අතර ධනාත්මක සම්බන්ධතා මගින් සෘණාත්මක අගතිය අඩු කළ හැකි බව යෝජනා කර ඇත . මානව පුස්තකාල ප්‍රවේශය අන්තර් කණ්ඩායම් සම්බන්ධතා සඳහා පහසුකම් සැලසිම කෙරෙහි අවධානය යොමු කරන හෙයින් , එය මානසික සෞඛයේ අපකිර්තියට පිළියමක් ලෙස මැදිහත්විමේ හොඳ ක්‍රමයක් ලෙසට ද ඔහු තවදුරටත් පෙන්වා දෙයි .

මානව පුස්තකාල භාවිතයේ දි 'දෙබස් ' යන වචනය බෝහෝ විට අවධාරණය කරනුයේ පුද්ගලික සම්බන්ධතා බලවත් වන අතර සෘණාත්මක ඒකාකෘතිවලට අභියෝග කර ධනාත්මක හැකියා වර්ධනය කළ හැකි ය . මානව පුස්තකාලවලට

සමාජ සබඳතා වැඩිදියුණු කිරීමට උපකාරි වන බවත් මානව පුස්තකාල ප්‍රවේශය මගින් සමාජ ඇතුළත් කිරීම්හි සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීමේ හැකියාව ඇත මානව පුස්තකාලයට පැමිණෙන අමුත්තන්ට (පාඨකයන්ට ) මානසික සෞඛ්‍ය ගැටලු (ජීවමාන පොත්) අත්විඳ ඇති පුද්ගලයින් හමුවීමෙන් පළමුව දැනුම ලබා ගත හැකි ය . Schur සහ ඇගේ සගයන් සොයා ගත් පරිදි ආබාධ සහිත පුද්ගලයින් සමග පූර්ව සම්බන්ධතා පැවැත්වීමෙන් සෘණාත්මක ඒකාකෘති අඩු කළ ද හැකි ය.

Dobreski iy Huang ට අනුව , සංවාදයට සහභාගිවීමෙන් ජීවමාන පොත්වලට ඔවුන්ගේ අතිත අත්දැකීම් පිළිඹිඹු කිරීමට හා සමාලෝචනය කිරීමට අවස්ථාව තිබේ. එබැවින් සංවාදය ජීවමාන පොත් මෙන්ම පාඨකයන්ට ඉගෙනීමේ අත්දැකීමක් විය හැකි ය. මෙම ප්‍රවේශය මගින් සමාජ ඇතුළත් කිරීම් වැඩිදියුණු කළ හැකි වුව ද, මානසික රෝගයෙන් අපකීර්තිය අවම කිරීම සඳහා එය ක්‍රියාත්මක කිරීම තවමත් ආරම්භක අවධියේ පවති . මානසික සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය සඳහා මානව පුස්තකාල දායක වන්නේ කෙසේ ද යන්න තවමත් දැක ගත හැකි ය. ඔවුන් විසින් මානසික සෞඛ්‍යයේ වාසිදායක තත්ත්වයන් කිහිපයක් ඉදිරිපත් කරනු ලැබේ .

- මානව පුස්තකාලයේ දෙබස් ස්වභාවය ධනාත්මක ප්‍රතිඵල ජනනය කරයි .
- ප්‍රකෘතිමත්වීමේදි මිනිසුන්ට එරෙහි අගතිය අඩු කිරීමට මානව පුස්තකාලවලට හැකිය.
- ප්‍රකෘතිමත්වීමේ පුද්ගලයින් සහ අනෙකුත් ප්‍රජා සමාජිකයන් අතර ඇති බාධක ඉවත් කිරීමට මානව පුස්තකාලවලට හැකි ය.
- ජීවමාන පොත් ලෙස , ප්‍රකෘතිමත් වන පුද්ගලයින්ට පාඨකයින්ගේ තීක්ෂණ බුද්ධිය සහ චිත්තවේගිය සහාය ලබා ගත හැකි ය.
- අන්තර් ක්‍රියාවලියේ දි විවිධ පිඩා විඳින පුද්ගලයින්ට ඒ සඳහා පිළියම් ලබා ගත හැකි ය .

මෙලෙස වු වාසිදායක තත්වයන් රැසක් මානව පුස්තකාල හරහා ලබා ගත හැකි බව Dobreski සහ Huang විසින් පැහැදිලි කරනු ලැබේ . සමාජ සේවකයෙකු වන David Male ද සඳහන් කරනුයේ සම්ප්‍රදායික සෞඛ්‍ය කතිකාවකින් ලබා ගත නොහැකි බලපෑමක් ලබා ගැනිමට මානව පුස්තකාලයේ කණ්ඩායම් ආකෘතින් වඩාත් ගැඹුරු අන්තර් ක්‍රියාකාරිත්වයට ඉඩ දෙනු ලබන බව යි .

ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව ලෝකයේ සෑම හතර දෙනෙකුගෙන් එක් අයෙකු ජිවිතේ කුමන අවස්ථාවක හෝ මානසික ව්‍යාකූලතාවයට මුහුණ දෙයි . ඒ අනුව ලොව පුරා මිලියන හාරසිය පනහක් පමණ මානසික රෝගවලට මුහුණ දෙයි . බෝහෝ දෙනා අතර සුලබව දක්නට ලැබෙන මානසික රෝගි තත්ත්වය විෂාදය ( Depression ) වේ . ඕනෑම පස් දෙනෙකුගෙන් එක් අයෙකු සිය ජිවිත කාලය තුළදී මෙයට ගොදුරු වන බවයි . ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 10 % කට මානසික ව්‍යාකූලතා ඇති බව වෛද්‍ය රමණී රත්නවිර මහත්මිය සඳහන් කරන ලදි (https://www.bbc.com/sinhla/Sri -lanka-37625167) . මෙවැනි මානසික ව්‍යාකූලතාවයෙන් පෙළෙන මිනිසුන් සඳහා මෙවැනි මානව පුස්තකාල වැඩසටහන් සංවිධානය කර ඔවුන්ට ධනාත්මක අයුරින් පෝෂණය කිරීම ඉතා වැදගත් වන්නේ ය .

තවද ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන පරිදි වසරකට ලක්ෂ 8 ක් 9 ක් පමණ දෙනා සිය දිවි හානිකර ගැනිම නිසා මරණයට පත්වන බවයි . සෑම තත්පර හතළිහකට වරක්ම සිය දිවි හානි කර ගැනිමක් සිදු වන අතර ලෝකය පුරා සිදු වන මරණ අතරින් සියයට 1.3 ක්ම සිදුවන්නේ සියදිවි හානිකර ගැනිමෙන් බව වාර්තා වේ .

රුහුණු විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. වී . පී . ඒ හේමන්ත කුමාර මහතා සඳහන් කරනුයේ මැරෙන බව ස්ථිර වශයෙන්ම දැනගෙන මරණයට පත්වන පුද්ගලයා විසින්ම යොදා ගනු ලබන ක්‍රියාවක් මගින් සිදුවන මරණය සිය දිවි නසා ගැනිමක් ලෙසට සමජ විද්‍යාත්මකව විස්තර කර තිබේ . ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව 2012 වසරේ නිකුත් කළ වාර්තාවට අනුව සියදිවි නසා ගැනිම් අනුව ලංකාව සිටින්නේ තුන්වැනි ස්ථානයක ය. නමුත් 1985 වසරේ සිට 2015 වසර දක්වා වසර 30 ක් තුළ ලෝකයේ සියදිවි නසා ගැනිම්වල සංඛ්‍යා දත්ත ඇසුරෙන් විකිපිඩියාව දක්වන්නේ රටවල් 107 ක් අතුරින් ලංකාව 7 වැනි තැනට පත්ව ඇති බවයි . වර්ෂයකට මුළු ජනගහනයෙන් මිලියනක් පමණ සිය දිවි නසා ගැනිමක් සිදුවන අතර 2020 වන විට එය මිලියන 1.5 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත . රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු වාර්තා අනුව වසරකට 4000 ක් පමණ ශ්‍රී ලාංකිකයන් සිය දිවි නසා ගැනිම් සිදු කර ගන්නා බව වාර්තා වේ (https://www.bbc.com/sinhala/sri-lanka-45476800 ) . මෙවැනි

සියදිවි නසා ගැනිම් සිදු කර ගැනිමට තැත් කරන පුද්ගලයින් සඳහා මානසික වශයෙන් ධනාත්මක චිත්තවේගයන්ගෙන් ඔවුන්ව ශක්තිමත් කිරිමට මෙම මානව පුස්තකාල වැඩසටහන් හරහා හැකියාව ඇත . එබැවින් ශ්‍රී ලංකාව වැනි තෙවැනි ලෝකයේ රටවල මානව පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ඉතාමත් වැදගත් ය.

**සමාලෝචනය**

මානව පුස්තකාල සංකල්පය වර්තමානයේ ලෝකයේ වර්ධනය වෙමින් පවතින අපුරුතම සංකල්පයකි. භාෂාව සහ පුස්තකාල යාන්ත්‍රණය භාවිත කරමින් පුද්ගල චර්යාව, ආකල්ප , සිතුවිලි ධනාත්මකව වෙනස් කරවිම මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ය. මෙම ක්‍රමයේ තවත් එක් ප්‍රධාන අරමුණක් වන්නේ සාමන්‍යයෙන් හමුනොවන හා අදහස් හුවමාරු කර ගැනිමට නොහැකි පුද්ගලයින් සමග කතාබහ කිරිමත් එමගින් ජනතාවගේ ගැටලුවලට පිළිතුරු ලබා දිමත් ය. මානව පුස්තකාල ක්‍රමවේදය තුළින් සිදුවන්නේ පොත්පත් කියවිම වෙනුවට යම් පුද්ගලයෙකු සම්පත්දායකයෙකු හා සංවාදයක් නිර්මාණය කර ගනිමින් ඔහුගේ ජිවන අත්දැකිම් හුවමාරු කර ගැනිමයි. ශ්‍රී ලංකාව තුළ විශ්වවිද්‍යාල පුස්තකාල ගත් කළ 15 කට ආසන්න ප්‍රමාණයක් ද මහජන පුස්තකාල 1200 කට ආසන්න ප්‍රමාණයක් පැවතිය ද විධිමත් ලෙස මානව පුස්තකාල ව්‍යාප්තියක් ශ්‍රී ලංකාව තුළ නොමැති විම අභාග්‍යයට කරුණකි. මානව පුස්තකාල හරහා විශාල ප්‍රයෝජන තිබුණද එය ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතියට විධිමත් අයුරින් භාවිතා කරන්නේ ද යන්න ගැටලුවක් පවතින්නේය. මෙම මානව පුස්තකාල සංකල්පය තවදුරටත් විදේශ රටවල මෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය තුළ ව්‍යාප්ත කරමින් එහි ප්‍රයෝජන ශ්‍රී ලාංකිකයන්ට ලබා දෙන්නට නිසි බලධාරින් විසින් අවධානය යොමු කිරිම ඉතා වැදගත්ය.

## විමර්ශන

Abergel, R. (2020, July 10). Human Library. Retrieved August 06, 2020, from https://www.ted.com/talks/ronni_abergel_creating_the_human_library_fighting_taboos_and_stigma_through_dialogue

Abergel, R. (2005). *Dont judge a book by its cover!: The living library organisers guide*. Budapest, Hungary: Council of Europe, Directorate of Youth and Sport, European Youth Centre.

Don't judge a book by its cover. (2021, March 03). Retrieved from https://en.wikipedia.org/wiki/Don't_judge_a_book_by_its_cover

Kon, D., & Bik, K. (2003). *Dont judge a book by its cover: Aka Dead people, flying fishes and the ones who missed the boat*. Singapore: Jointly published by Ngee Ann Polytechnic, Beaumont Pub.

Vasanthakumar, R. (2019, June 6). HUMAN LIBRARY: A NEW WAY TO SHARING THE INFORMATION. Retrieved November 22, 2020, from https://www.academia.edu/40486051/HUMAN_LIBRARY_A_NEW_WAY_TO_SHARING_THE_INFORMATION

## Table of Contents


| | | Page |
| --- | --- | --- |
| 01 | Dissaster managemnt in libraries: with reference to nationl museum library in Sri Lanka | 01 |
| 02 | Study of the Specialties of Language Style Used in Palm Leaf Manuscripts in Writing: Based on Dalanda Pujavaliya Palm Leaf Manuscript Studies | 14 |
| 03 | Sri Lankan indigenous medicine related to intangible cultural heritage | 28 |
| 04 | Study of use of Piriven Libraries by the Pirivena Teachers for their Teaching Process | 47 |
| 05 | Study on public library service in Sri Lanka referring to IFLA/UNESCO Public library Missions stated in the Manifesto 2022: based on Polonnaruwa Distric | 58 |
| 06 | Human libraries representing the humans in place of books: an orverview on the human libraries as a new approach in the field of libraries | 74 |



**Published by**

**Department of Library and Information Science,**
**Faculty of Social Sciences,**
**University of Kelaniya,**
**Sri Lanka.**

**ISSN 1800-1600**

**ISSN(Online) 3051-5122**

9 773051 512006